**නාට්‍ය හා රංග කලාව**

**10 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2014**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info@nie.lk

*මුද්‍රණය :* මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්  හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි.  එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි.  මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය.   මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර  කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය.  විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත.  කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය.  එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ.  විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි.  ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක.  අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ  දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය.  එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂය හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂයයයි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනා ගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ළැදියා පුබුදුවා, එමඟින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.

("To sensitize students and the community through Aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, Sensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමඟ යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමඟ මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින්ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කර ගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චිත්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කර දෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමඟ අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අළුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින්ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අප යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ s | හි ත මී s | හි තු දේ s | කි ය මී s |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ s | ක ර මී s | ක ර මි න් | හැ දෙ මී s |

මෙම ප්‍රවේශයත් සමඟ ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කර ගැනීමට හැකි වන පරිදි විෂය කරුණු අප අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමිකව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී ආකල්ප සැම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තව ද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දී තර්කානුකූලව හා නිර්මාණාත්මකව චින්තනය මෙහෙයවා ඒවා විසඳා ගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චින්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිතව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමානය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව ප්‍රතිසංස්කරණය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් උද්යෝගයෙන් හා කැපවීමෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# විෂයමාලා කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය : **ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය**
ජාතික අධ්‍යාපන ආයතනය

සම්බන්ධීකරණය : **කේ. ජී. අජිත් රූපසේන මයා**
ව්‍යාපෘති කණ්ඩායම් නායක (නාට්‍ය හා රංග කලාව)
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

විෂය නිර්දේශ විශේෂඥ උපදෙස් : **මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතා**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (විශ්‍රාමික)

**මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතා**
කොළඹ විශ්වවිද්‍යාලය

**මහාචාර්ය මංගලිකා ජයතුංග මහත්මිය**
කැලණිය විශ්වවිද්‍යාලය

**විජයරත්න පතිරාජ මහතා**
ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික)
ජාතික අධ්‍යාපන ආයතනය

ලේඛක මණ්ඩලය අභ්‍යන්තර : **කේ. ජී. අජිත් රූපසේන මහතා**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

බාහිර **වරුණ අලහකෝන් මහතා**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, සෞන්දර්ය අංශය
ඉසුරුපාය, බත්තරමුල්ල

**ක්ලයිව් ශාන්ත මහතා**
ගුරු සේවය, ශාන්ත ආනා විද්‍යාලය, කුරුණෑගල

**සෙනෙවිරත්න රුදිගු මහතා**
ගුරු උපදේශක - කොළඹ කලාපය

**රණසිංහ අධිකාරි මහතා**
ගුරු සේවය, මහින්ද විද්‍යාලය, ගාල්ල

**අනෝමා කුමාරි සමරක්කොඩි මහත්මිය**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප අධ්‍යාපන කාර්යාලය, ගිරිඋල්ල

**ලලිතා ජයරත්න මහත්මිය**
ගුරු උපදේශක - ඇඹිලිපිටිය කලාපය

**ඩී. පී. ස්වර්ණලතා මහත්මිය**
ගුරු උපදේශක - ඇල්පිටිය කලාපය

**සමන් කස්තුරිරත්න මහත්මිය**
ගුරු සේවය (විශ්‍රාමික)

**ජී. කරුණාවතී මහත්මිය**
අධ්‍යාපන පරිපාලන සේවය
ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය, කොළඹ

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

නාට්‍ය හා රංග කලාව විෂයය පාසල් මට්ටමින් 6 වැනි ශ්‍රේණියට ඇතුළත් කරනු ලැබුවේ 2007 වර්ෂයේ දී ය. 10 වැනි ශ්‍රේණිය වන විට වඩාත් පුළුල් අයුරින් නිපුණතා ගොඩ නැංවීම සඳහා එය බෙහෙවින් ඉවහල් වී ඇත. නාට්‍ය හා රංග කලාව ගුරු අත්පොත සැකසෙනුයේ එම නිපුණතා සංවර්ධන ක්‍රියාවලිය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා ගුරු භවතාට උපකාරකයක් වශයෙනි. එහි දී සිද්ධාන්ත, නිර්මාණ, කුසලතා, සංස්කෘතික පසුබිම, වින්දනය මෙන් ම ප්‍රායෝගික බව පාදක කොට ගෙන ක්‍රියාකාරකම් ගොඩ නංවා ඇත. විශේෂයෙන් ම මෙවර නව නිර්දේශය යටතේ තවදුරටත් මෙම විෂය ක්ෂේත්‍රය පුළුල් වන අතර, එහි දී ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා වැඩි අවධානය යොමු කොට තිබේ.

මෙම ක්‍රියාකාරකම් තුළින් දැනුම, ආකල්ප හා කුසලතා මෙන් ම, චර්යා සංවර්ධනය ද සිදු කෙරේ. මෙම ක්‍රියාවලිය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත් සම්පාදනය කර දීම අවශ්‍ය වේ. නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ ව ලියැවුණු පොත් පරිශීලනය කිරීම සඳහා පුස්තකාල පහසුකම් සැලසීම, නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා රංග පීඨ භාවිත කිරීම. ක්‍රියාකාරී පන්ති කාමරයක් සැලසුම් කිරීම. නාට්‍ය තරග සංවිධානය කිරීම, රංග කලාව සම්බන්ධ ප්‍රදර්ශන, විවාද ආදී විවිධාංග සංවිධානය කිරීම මෙන් ම ජාතික තලයේ නාට්‍ය නැරඹීම සඳහා සිසුන් යොමු කිරීම ද මගින් තවදුරටත් මෙම නිපුණතා සංවර්ධනය කළ හැකි ය. එසේ ම පැවරුම් මගින් විෂය කරුණු ගවේෂණය කිරීමේ අවස්ථා ද සිසුන්ට ලබා දිය හැකි ය.

එමෙන් ම ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ඉගෙනුම් පල සාධනය සඳහා තක්සේරුකරණය (ඇගයීම් ක්‍රම) සෑම පාඩමක් සඳහා ම අන්තර්ගත කොට තිබේ. ඒ අනුව ශිෂ්‍ය ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් ඔවුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම පිළිබඳ විනිශ්චයකට එළඹිය හැකි ය. ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමත්, එය ප්‍රතිපෝෂණය කිරීමත් යන අංශ දෙකකින් මෙම ඇගැයීම් ක්‍රියාවලිය සමන්විත වෙයි.

ගුරු මාර්ගෝපදේශයට පරිහරණය කිරීමේ දී මෙම මූලික රාමුව තුළ තමාට ලැබෙන සීමිත සම්පත් කළමනාකරණය කර ගනිමින් කටයුතු කිරීමේ නිදහස ගුරු භවතා සතු වේ. උදාහරණයක් ලෙස සිසුන් කණ්ඩායම් කිරීමේ දී පන්තියේ ශිෂ්‍ය සංඛ්‍යාව සැලකිල්ලට ගෙන සුදුසු පරිදි කණ්ඩායම් කිරීම කළ හැකි ය. එමෙන් ම වාර තුනට අදාළ ව කාලච්ඡේද සැලසුම් කර ගැනීමේ දී, ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් පහසු වන ආකාරයෙන් එය සකස් කර ගත හැකි ය. මෙහි ක්‍රියාකාරකම් සඳහා දී ඇති ගීත, කවි, කතාන්දර ආදිය වෙනුවට ගුරු භවතාට අභිමත පරිදි වෙනත් ගීත, කවි, කතාන්දර ආදිය යොදා ගැනීමට නිදහස තිබේ.

විශේෂයෙන් ම ගුරු මාර්ගෝපදේශයට සීමා නොවී ශ්‍රේණිවලට උචිත පරිදි නව නිර්මාණ සකස් කර ගැනීමට ගුරු භවතාට අවස්ථාව ඇත. මෙම සියලු කාර්යයන් මගින් දරුවාට වඩාත් ප්‍රියජනක පන්ති පරිසරයක් හා ඉගැනුම් අවස්ථා ලබා දීම ගුරු භවතාගේ වගකීම වන්නේ ය.

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| හැඳින්වීම | v -vi |
| විෂයමාලා කමිටුව | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශය | x-xx |
| ඉගෙනුම් ඉගෙන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-72 |
| විවිධ සහාය | 73 |

# නාට්‍ය හා රංග කලාව

## විෂය නිර්දේශය

## 10 ශ්‍රේණිය

**(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

**සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# හැඳින්වීම

නාට්‍ය හා රංග කලාව යනු අතිශයින් නිර්මාණශීලී වූත්, ප්‍රායෝගික වූත්, වින්දනීය වූත්, විෂය ක්ෂේත්‍රයකි. පාසල් පද්ධතියේ වර්තමානයේ ක්‍රියාත්මක වන නිපුණතා පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමය හා අනුගත විෂය නිර්දේශයක් ලෙස නාට්‍ය හා රංගකලාව විෂය නිර්දේශය හැඳින්විය හැකි ය.

මුල් කාලයේ දී අ.පො.ස. උසස් පෙළ ශ්‍රේණි සඳහා පමණක් සීමා වී තිබුණු මෙම විෂයය, 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව පසුව 10,11 ශ්‍රේණි දක්වා ද ව්‍යාප්ත විය. එය වඩාත් පුළුල් පරාසයක විකාශය වෙමින් 2007 වසරේ දී 6 වැනි ශ්‍රේණියෙන් ඇරඹෙන විෂය නිර්දේශය, නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය හා මැනවින් බද්ධ වී ඇත. මෙම විෂයය ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ, නිශ්චිත නිපුණතා ළඟා කරගත හැකි ක්‍රියාකාරකම් පාදක කොටගත් විෂයයක් වන බැවින්. සමාජ ගැටලු නාට්‍යමය දෘෂ්ටි කෝණයකින් හඳුනා ගෙන වින්දනාත්මක ව ග්‍රහණය කරගැනීමේ හැකියාව වර්ධණය කිරීම මෙමගින් අපේක්ෂිත ය.

නිර්මාණාත්මක හැකියාවන් හා ප්‍රායෝගික කුසලතාවන් වර්ධනය කිරීමත්, විචාරශීලී රසාස්වාදයට හුරු කිරීමත් අරමුණු කොට ගෙන ඇති මෙම විෂයය මගින් නාට්‍ය සිද්ධාන්ත, නිර්මාණාත්මක හැකියාව, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, දේශීය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම, හා වින්දනීය මානව හිතවාදියකු බිහිකිරීම යන පංචවිධ නිපුණතා සාධනය කර ගැනීම අපේක්ෂා කෙරේ.

ළමා මනසට ගෝචර වන විචිත්‍ර ලෝකය හා වීරක්‍රියා වැනි සංකල්ප ගොඩ නැගීමට නාට්‍ය හා රංගකලාව විෂයය යොදාගැනීම බෙහෙවින් සාර්ථක ය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී ප්‍රියජනක ඉගෙනුම් අත්දැකීම් සමීප කරමින්, නිර්මාණශීලී පරපුරක් ගොඩ නැගීම හා එමගින් සමස්ත පුද්ගල පෞරුෂය ගොඩ නැගීමේ කාර්යය සඳහා ද මෙම විෂයය ඉවහල් වේ. නව ලෝකයේ සංකීර්ණ වූත්, වේගවත් වූත්, වැඩ පරිසරයට අවශ්‍ය වන ශ්‍රමදායකයා ද, විචාරශීලී නිර්මාණකරුවා ද, වින්දනය හා ස්වාභිමානය/ආත්මාභිමානය පුරුදු පුහුණු කළ මානව හිතවාදියා ද ගොඩ නැගීමට අවශ්‍ය දේශීය අනන්‍යතාව හා සංස්කෘතික උරුමය, ප්‍රායෝගිකත්වය හා නිර්මාණශීලීත්වය ගැබ් වූ ක්‍රමවේදයක් නාට්‍ය හා රංගකලාව විෂයය තුළ අන්තර්ගත වේ.

සමාජ ජීවිතයේ මුහුණ දෙන ගැටලුවලට යථාර්ථවාදී හා ශුභවාදී විසඳුම් ලබා ගැනීමට අවශ්‍ය පෙර සූදානම මෙමගින් ලබාදෙන අතර, වින්දනීය මානව හිතවාදියකු මෙන් ම ශ්‍රී ලාංකේය අනන්‍යතාවකින් හෙබි අභිමානවත් පුරවැසියකු ගොඩනැගීමේ අභියෝගය නාට්‍ය හා රංගකලාව විෂය භාර ගුරුභවතුන් හමුවේ පවතින භාරදූර වගකීමක් බව අවසන් වශයෙන් සඳහන් කළ යුතු ය.

## ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

I වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යොන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම. (උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ස්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



**(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

**(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

## විෂය අරමුණු

පරිසරයේ ඇති සියලුම වස්තූන් ඇසුරෙන් වින්දනයක් ලබා ගැනීමේ ශක්තිය ඇති එකම සත්ත්වයා, මිනිසා ය. මිනිසා හා මිනිසා අතර ඇති වන විවිධ ගැටීම් නාට්‍යමය දෘෂ්ටි කෝණයකින් හඳුනාගෙන, ඒවා වින්දනාත්මක ව ග්‍රහණය කර ගැනීමේ හැකියාව ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

**නිර්මාණාත්මක ශක්ති වර්ධනය**

නාට්‍යමය සංසිද්ධීන් වින්දනයේ දී මෙන් ම නිර්මාණයේ දී ද ප්‍රබල තේමාවලින් යුක්ත වේ. එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් හා මිනිස් ඇසුර මගින් ලබන අත්දැකීම් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමට හැකි අනුභූතීන් ගොඩ නගා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම ද මෙහි තවත් අපේක්ෂාවකි.

**ප්‍රායෝගික කුසලතා වර්ධනය**

නාට්‍යානුසාරී අභ්‍යාස මගින් නිර්මාණය වූත්, එසේ ම එදිනෙදා ජීවිතයේ කාර්යයන් සඵල කර ගැනීමට සරිලන්නා වූත්, ස්වකීය චාලක හැකියාවන් පෝෂණය කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රායෝගික අවස්ථා මෙහි දී සැලසුම් කෙරේ.

**විචාර ශක්ති වර්ධනය**

සාහිත්‍යමය හා රංගමය වශයෙන් ද ජනසන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ ශ්‍රව්‍යමය හා දෘශ්‍යමය වශයෙන් ද ඉදිරිපත් කෙරෙන නාට්‍යමය සංසිද්ධීන්, විමර්ශනාත්මක ව තර්කානුකූල ව විචාරයට ලක් කිරීමේ හැකියාව වර්ධනය කිරීම ද මෙහි මූලික අපේක්ෂාවකි.

**විෂයානුබද්ධ දේශීය හා විදේශීය අනන්‍යතාවන් හඳුනා ගැනීම**

ඉගැනුම් කාර්යයේ දී මෙන් ම, ඵලදායී දෛනික ජීවිතයට වැදගත් වන ඒ ඒ විෂයානුබද්ධ දේශීය අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංස්කෘතික උරුමයන් පිළිබඳවත්, එම දැනුම පෝෂණය කෙරෙන වෙනත් විදේශීය උරුමයන් පිළිබඳවත් නිවැරදි චින්තනයකින් යුත් චරිතායනයක් සිසුන් තුළ ජනිත කිරීම අවශ්‍ය කරුණකි. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක විඳගැනීම මගින් සමාජයට අවශ්‍ය කරන මානව හිතවාදියකු ගොඩනැගීම ද මෙම විෂයයේ මුඛ්‍ය අරමුණක් වේ. නාට්‍ය හා රංග කලා විෂයානුබද්ධ දැනුම හා එමගින් මනා ආකල්ප ඇති කිරීම ද මෙම විෂය නිර්දේශයේ අපේක්ෂාව වන්නේ ය.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01 නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1.1 නාට්‍යය යනු කුමක්දැයි නිර්වචනය කරයි.<br>1.2 නාට්‍ය කලාව අනෙකුත් කලාවන්ගෙන් වෙනස් වන්නේ කෙසේ දැයි සාකච්ඡා කරයි.<br>1.3 නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය යන ප්‍රභේදයන්හි වෙනස පැහැදිලි කරයි.<br>1.4 වේදිකා නාට්‍යයෙහි විශේෂතා හඳුනා ගනියි.<br>1.5 රූපණ කාර්යයේ දී ශිල්පියෙකු ප්‍රගුණ කළ යුතු කුශලතා හා ගුණාංග හඳුනා ගනියි.<br>1.6 රංග භූමිය හඳුනා ගනියි.<br>1.7 රංග භූමි වර්ග හඳුනා ගනියි. | 1.1 නාට්‍යයේ ස්වභාවය පිළිබඳව අධ්‍යයනය කිරීම.<br>1.2 නාට්‍ය කලාව හා අනෙකුත් කලාවන් සංසන්දනය කිරීම.<br>1.3 නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය පිළිබඳ ව සංසන්දනාත්මකව විමසීම.<br>1.4. වේදිකා නාට්‍යයෙහි විශේෂ ලක්ෂණ විමසීම.<br>1.5 රූපණ ශිල්පියෙකු සතු කුශලතා හා ගුණාංග සාකච්ඡා කිරීම.<br>1.6 රංග භූමියක මූලික ලක්ෂණ අධ්‍යයනය කිරීම.<br>1.7 රංග භූමි වර්ග නම් කිරීම හා රංග භූමියක මූලික බෙදීම් අධ්‍යයනය කිරීම. | ♦ නාට්‍යයක ස්වභාවය නිරීක්ෂණය කරයි.<br>♦ නෘත්ත හා නෘත්‍යයෙන් නාට්‍යය වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.<br>♦ දෘශ්‍ය හා ප්‍රාසංගික කලා අතර නාට්‍ය කලාවෙහි ඇති සුවිශේෂතා විමසයි.<br>♦ රූපණය යන්න හඳුනා ගනිමින් රූපණ ශිල්පියෙකු සතු විය යුතු කුශලතා ප්‍රගුණ කරයි.<br>♦ රංග භූමියක ස්වභාවය නිරීක්ෂණය කරමින් විවිධ රංගභූමි වර්ග නම් කරයි. | 20 |
| 02. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණ-කරණයෙහි යෙදෙයි. | 2.1 විවිධ චලන අභ්‍යාසයන්හි යෙදෙයි.<br>2.2 කායික හා මානසික ඒකාග්‍රතාව සඳහා අදාළ අභ්‍යාසයන් හි යෙදෙයි.<br>2.3 නිර්මාණාත්මක රංග ක්‍රීඩාවන්හි යෙදෙයි. | 2.1 ස්වාභාවික චලන, නිර්මිත චලන හා තාලානුකූල චලනයන්හි යෙදීම.<br>2.2 විවිධ තාල හා රිද්මයන්ට අනුකූලව අභ්‍යාසයන්හි යෙදීම.<br>2.3. ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව වර්ධනය වන ආකාරයේ රංග ක්‍රීඩාවන්හි යෙදීම | ♦ චලන ක්‍රියාකාරකම්හි නියැලෙයි.<br>♦ නළුවකු සතු කුශලතා වර්ධනය කරගැනීම සඳහා චිත්ත ඒකාග්‍රතාව ඇති කර ගැනීමේ රංග අභ්‍යාසයන්හි යෙදෙයි.<br>♦ චරිත, සිද්ධි, අවස්ථා හෝ භාණ්ඩ පාදක කර ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.4 සාමූහික හා කේවල වශයෙන් නිර්මාණාත්මක නිරූපණයන්හි යෙදෙයි.<br>2.5 පවරනු ලබන ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි.<br>2.6 නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි.<br>2.7 උචිත කතාවක් ආශ්‍රයෙන් නාට්‍ය පෙළක් රචනා කර රංග ශිල්ප භාවිත කරමින් පෙළ රංගනයක් බවට පත් කරයි. | 2.4 චරිතයක්, සිද්ධියක්, අවස්ථාවක් හෝ භාණ්ඩයක් තේමා කර ගෙන සාමූහික හා කේවල නිරූපණයන්හි යෙදීම.<br>2.5 ගුරු භවතා විසින් නම් කරනු ලබන ක්ෂණික නිරූපණයන්හි යෙදීම.<br>2.6 ප්‍රබන්ධ කතා හෝ අත්දැකීම් ඇසුරින් නාට්‍යමය අවස්ථා නිර්මාණය කිරීම.<br>2.7.1 නාට්‍ය පෙළක් රචනා කිරීම.<br>2.7.2 එම නාට්‍ය පෙළ රංගයක් බවට පත් කිරීම. | ♦ විධිමත් ලෙස නාට්‍ය පෙළ රචනය කර පෙළ රංගයක් බවට පත්කරයි. | |
| 03 නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි. | 3.1 රංග අභ්‍යාසවල නිරත වෙයි.<br>3.2 නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරින් නාට්‍යෝචිත පරිදි සංවාද භාවිත කරයි.<br>3.3 නිර්දිෂ්ට පෙළ ඇසුරින් චරිත නිරූපණය කරයි. | 3.1.1 ශ්වසන අභ්‍යාස<br>3.1.2 සංවේදන අභ්‍යාස<br>3.1.3 ශිථිලකරණ අභ්‍යාස<br>3.1.4 චිත්ත ඒකාග්‍රතාව ඇති කරන අභ්‍යාස<br>3.1.5 කටහඬ අභ්‍යාස<br>3.2.1 නාට්‍ය පෙළ කියවීම.<br>3.2.2 සංවාද භාවිත කිරීම.<br>3.2.3 පැරණි හා නව නාට්‍ය ගීත භාවාත්මකව ගායනා කිරීම<br>3.3 නිර්දිෂ්ට පෙළෙහි එන චරිත නිරූපණයෙහි යෙදීම. | ♦ ශාරීරික, මානසික හා කටහඬ අභයාසයන්හි නිරත වෙයි.<br>♦ පැරණි හා නව නාට්‍ය ගීත ප්‍රකාශනාත්මකව ඉදිරිපත් කරයි.<br>♦ අංග රචනයෙහි වැදගත්කම තේරුම්ගෙන, අංග රචනයෙහි යෙදෙයි.<br>♦ උචිත ආනුෂංගික ශිල්ප භාවිත කරමින් නිර්දිෂ්ට පෙළ රංගයක් බවට පත්කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.4 අංග රචනය හා රංග භාණ්ඩ නිර්මාණය කරයි.<br><br>3.5 නාට්‍ය නිෂ්පාදනය කරයි.<br><br>3.6 ප්‍රකාශනාත්මක නිරූපණයෙහි යෙදෙයි. | (නිර්දිෂ්ටපෙළ - පුණ්‍යසේන ගුණසිංහගේ **දික්තල කාලගෝල නාට්‍යය**)<br><br>3.4.1 අංග රචනය යනු කුමක්දැයි හඳුනා ගැනීම, වර්ණ හා මුහුණේ ස්වභාවයත්, අංග රචනා කට්ටලයත් හඳුනා ගැනීම.<br>3.4.2 විවිධ භූමිකාවන්ට ගැළපෙන අයුරින් අංග රචනා කිරීම.<br>3.4.3 ඒ ඒ භූමිකාවලට අවශ්‍ය වන රංග උපකරණ නිර්මාණය කිරීම.<br><br>3.5 උචිත රංග ශිල්ප භාවිත කරමින් උක්ත නාට්‍ය පෙළ රංගයක් බවට පත් කිරීම.<br>3.6 සංයුක්ත තැටි මගින් සපයනු ලබන වාද්‍ය ඛණ්ඩයකට අනුව ප්‍රකාශනාත්මක නිරූපණයෙහි යෙදීම. | ♦ විවිධ වාද්‍ය ඛණ්ඩයනට අනුව ප්‍රකාශනාත්මක, නිරූපණයන්හි යෙදෙයි. | |
| 04 නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1 දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍ය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහි ඇති නාට්‍යමය ලක්ෂණ හඳුනා ගනියි.<br>4.2 ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍ය කරුවන් හඳුනා ගනියි. | 4.1 ශාන්ති කර්මවල නාට්‍යමය ලක්ෂණ හඳුනා ගැනීම. (සන්නියකුම, රටයකුම, සූනියම් යාගය)<br><br>4.2 පහත සඳහන් නාට්‍යකරුවන් පිළිබඳ ව තොරතුරු ගවේෂණය කිරීම. | ♦ දේශීය ශාන්තිකර්මවල අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ නිරීක්ෂණය කරයි.<br>♦ දේශීය නාට්‍යකරුවන් අතර සුවිශේෂී මෙහෙවරක යෙදුණු නිර්මාණකරුවන් පිළිබඳ විමර්ශනයක යෙදෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | 4.2.1 හෙන්රි ජයසේන<br>4.2.2 සයිමන් නවගත්තේගම<br>4.2.3 බන්ධුල ජයවර්ධන<br>4.2.4 සුගතපාල ද සිල්වා<br>4.2.5 පරාක්‍රම නිරිඇල්ල | ♦ නිර්දේශිත රංගන ශිල්පීන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපිගොනුවක් සකස් කරයි. | |
| | 4.3 ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ රංග ශිල්පීන් හඳුනා ගනියි. | 4.3 පහත සඳහන් රංග ශිල්පීන් පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීම.<br>4.3.1 මානෙල් ජයසේන<br>4.3.2 විජේරත්න වරකාගොඩ<br>4.3.3 විජය නන්දසිරි<br>4.3.4 ශ්‍රියන්ත මෙන්ඩිස්<br>4.3.5 ගාමිණී සමරකෝන්<br>4.3.6 අනුලා බුලත්සිංහල<br>4.3.7 ඩග්ලස් රණසිංහ<br>4.3.8 ජැක්සන් ඇන්තනී<br>4.3.9 කෞෂල්‍යා ප්‍රනාන්දු | ♦ විවිධ ආගමික තේමාවන් පාදක කරගනිමින් නාට්‍යමය අවස්ථා නිරූපණය කරයි.<br>♦ විවිධ සංස්කෘතික හා සාමාජික වටිනාකම් තේමා කරගත් නාට්‍ය රඟ දක්වයි. | |
| | 4.4 සංස්කෘතික හා සාමාජික වටිනාකමක් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි. | 4.4 බෞද්ධ/හින්දු/ක්‍රිස්තියානි /ඉස්ලාම් සංස්කෘතික හා සාමාජික වටිනාකම් සහිත තේමාවන්ට අනුව නාට්‍යමය අවස්ථා නිරූපණය කිරීම. | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 05. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මකව විඳ ගැනීම හා මානව හිතවාදියෙකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5.1 නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරින් සාමූහිකව රස විඳියි.<br><br>5.2 නාට්‍ය නිර්මාණය සමස්තයක් ලෙස අගය කරයි.<br><br>5.3 නිර්දිෂ්ට පෙළ හෝ වෙනත් පෙළක් නිෂ්පාදනයක් ලෙස රස විඳියි. | 5.1.1 නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි තේමාව සහ කතා වස්තුව පිළිබඳ ව අදහස් ප්‍රකාශ කිරීම.<br>5.1.2 සංවාද, ශෛලිය, චරිත, ගැටුම් අවස්ථා හා රංගවිධාන පිළිබඳ ව අවධානය යොමු කරමින් නාට්‍ය පෙළ රස විඳීම.<br>5.2.1 නිර්දිෂ්ට නාට්‍යය නැරඹීම (වේදිකාවේ හෝ සංයුක්ත තැටි මඟින්)<br>5.2.2 රංග ශෛලිය, චරිත නිරූපණය හා සතර අභිනය භාවිත කිරීම ආදී කරුණු පිළිබඳ ව අවධානය යොමු කිරීම.<br>5.3. නාට්‍ය නිර්මාණය සමස්තයක් වශයෙන් ඇගැයීමට ලක් කිරීම. | ♦ නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි තේමාව හා කතා වස්තුව විස්තර කර පෙළ රස විඳියි.<br>♦ සංවාද භාවාත්මකව භාවිත කරයි.<br>♦ නිර්දිෂ්ට නාට්‍ය පෙළ විචාරශීලීව නරඹයි.<br>♦ නරඹන ලද නාට්‍යයෙහි ආනුෂංගික ශිල්ප දායකත්වය පිළිබඳ විමසයි.<br>♦ නැරඹූ නාට්‍යයෙහි සුසාධිත ලක්ෂණ අගය කරයි. | 15 |

## 10 ශ්‍රේණිය

| 1 වාරය | | 2 වාරය | | 3 වාරය | | |
|---|---|---|---|---|---|---|
| නිපුණතා මට්ටම | කාලච්ඡේද | නිපුණතා මට්ටම | කාලච්ඡේද | නිපුණතා මට්ටම | කාලච්ඡේද | මුළු කාලච්ඡේද |
| 1.1<br>1.2<br>1.3 | 03 | 1.4<br>1.5 | 03 | 1.6<br>1.7 | 04 | 10 |
| 2.1<br>2.2<br>2.3<br>2.4 | 08 | 2.5<br>2.6 | 07 | 2.7.1<br>2.7.2 | 05 | 20 |
| 3.1.1<br>3.1.2<br>3.1.3<br>3.1.4<br>3.1.5<br>3.2.3 | 05 | 3.2.1<br>3.2.2<br>3.3.3<br>3.4.1<br>3.4.2<br>3.4.4 | 13 | 3.4.3<br>3.5<br>3.6 | 07 | 25 |
| 4.1<br>4.2.1<br>4.2.2<br>4.2.3<br>4.2.4<br>4.2.5 | 10 | 4.3.1<br>4.3.2<br>4.3.3<br>4.3.4<br>4.3.5<br>4.3.6<br>4.3.7<br>4.3.8<br>4.3.9 | 04 | 4.4 | 06 | 20 |
| | - | 5.1.1<br>5.1.2 | 07 | 5.2.2<br>5.3 | 08 | 15 |
| | 26 | | 34 | | 30 | 90 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.1** : නාට්‍යය යනු කුමක්දැයි නිර්වචනය කරයි.

**ක්‍රියාකාරකම** : නාට්‍යය හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- නාට්‍යයක ස්වභාවය ගවේෂණය කරයි.
- නාට්‍ය පෙළක ස්වරූපය නිරීක්ෂණය කරයි.
- කතාන්දරයක නාට්‍යෝචිත අවස්ථා තෝරා ගනියි.
- කතාන්දරයක හා නාට්‍යයක වෙනස පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්** : දේශීය / විදේශීය කතාන්දර පොත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** සිසුන් කියවා ඇති හෝ අසා ඇති කතාන්දරයක් පිළිබඳ ව විමසන්න. එහි නාට්‍යෝචිත අවස්ථා ගැන විමසමින් සිසුන් නරඹා ඇති වේදිකා නාට්‍යයක් පිළිබඳ ව සාකච්ඡා කරන්න. එහි කතාව පෙළ ගස්වා ඇති ආකාරය විමසන්න.

**පියවර 02** කතාන්දරයක් යනු කියවා සහ අසා රස විඳීමට තිබෙන සිද්ධි මාලාවක් සහිත, ඇතැම් විට සංවාද ඇතුළත් දීර්ඝ කතා පුවතක් සහිත වූවකි. නාට්‍යයක් යනු විශේෂයෙන් තෝරා ගත් අවස්ථාවක් හෝ සිද්ධියක් තේමා කර ගත් සංවාද ඇතුළත්, ප්‍රබල පෙළක් සහිත ව නරඹා රස විඳීමට තිබෙන්නකි. නාට්‍යයක ඇතුළත් සිද්ධි මාලාව අනුපිළිවෙළින් ගොඩ නැංවීම අනවශ්‍ය ය. නාට්‍යයක කතා වස්තුවේ විකාශය කෙටි කාලීන විය යුතු වේ. නාට්‍යයක් යනු මතුපිටින් පෙනෙන අර්ථයට වඩා ව්‍යංග්‍යයෙන් ඇඟවෙන යටි පෙළක් සහිත ව ප්‍රේක්ෂකයාට රසයක් සහ ජීවිතාවබෝධයක් ලබා දෙන්නකි. මෙම කරුණු පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**පියවර 03**
- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- කතාන්දරය සහ වේදිකා නාට්‍යය ලෙසින් දෙපස නම් කරන්න.

**පියවර 04**
- කතාන්දරයක සහ නාට්‍යයක සමාන අසමානතා නම් කිරීමට, තරගයක් විලාසයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කිරීම් පුවරුවක සටහන් කිරීමට ද අවස්ථාව ලබා දිය හැකි ය.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- කතාන්දරයක ලක්ෂණ ඉදිරිපත් කිරීම.
- නාට්‍යයක ලක්ෂණ ඉදිරිපත් කිරීම.
- කතාන්දරයක හා නාට්‍යයක සමාන ලක්ෂණ ඉදිරිපත් කිරීම.
- කතාන්දරයේ හා නාට්‍යයේ අසමාන ලක්ෂණ ඉදිරිපත් කිරීම.
- නිරවුල් ව හා නිවැරදි ව අදහස් ප්‍රකාශ කිරීම යන කරුණු ඇගයීමට ලක් කරන්න.

**පැවරුම** : කතාන්දරයක හා නාට්‍යයක සමාන අසමානතා පැහැදිලි ලෙස ලේඛනගත කරන්න.

**අතිරේක උදව්** :
- කතාන්දර පොත් හා නාට්‍ය පෙළ කියවීම.
- කතාන්දරවලට සවන් දීම.
- වේදිකා නාට්‍යය නැරඹීම.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.2** : නාට්‍ය කලාව අනෙකුත් කලාවන්ගෙන් වෙනස් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරයි.

**ක්‍රියාකාරකම** : දෘශ්‍ය සහ ප්‍රාසංගික කලා මාධ්‍යයන් ගෙන් නාට්‍යය වෙන්කර හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- දෘශ්‍ය කලා සහ ප්‍රාසංගික කලා මාධ්‍යයන් විස්තර කරයි.
- නාට්‍ය කලාවේ සුවිශේෂතා නම් කරයි.
- වේදිකා නාට්‍යයක් සඳහා භාවිත වන විවිධ කලා ප්‍රභේද නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- චිත්‍රපට, රූපවාහිනී නාට්‍ය, බැලේ, මුද්‍රා නාට්‍ය, ඔපෙරා, කාටූන් සම්බන්ධ සංයුක්ත තැටි
- විවිධ කලා නිර්මාණ ශිල්පීන් පිළිබඳ තොරතුරු ඇතුළත් රූප සහ පොත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** විවිධ දෘශ්‍ය කලා මාධ්‍යයන් පිළිබඳ ව විමසන්න.

**පියවර 02** චිත්‍ර, මූර්ති, කැටයම් වැනි කලාවන් දෘශ්‍ය මාධ්‍යය ලෙස සැලකෙන අතර, චිත්‍රපට, රූපවාහිනී නාට්‍ය, බැලේ, මුද්‍රා නාට්‍ය, ඔපෙරා, කාටූන් යනාදී කලා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් ලෙස සැලකිය හැකි බවත් ඒ ඒ කලා මාධ්‍යයන්ට සුවිශේෂ ලක්ෂණ ඇති බවත් පැහැදිලි කරන්න.

නාට්‍ය කලාවෙහි දකින සජීවී බව, රංග කාලයේ සහ අවකාශ භාවිතයෙහි සීමා සහිත බව, වේදිකාව මත රූපණය කළ හැකි දේ පමණක් තෝරා ගැනීම, චිත්‍ර, සංගීතය, නර්තනය වැනි කලා මාධ්‍යයන් නාට්‍යය හා දායක කර ගැනීම, සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීම, සක්‍රීය ප්‍රේක්ෂක සහභාගිත්වය, නැවත නැවතත් නිර්මාණය වෙනස් කළ හැකිවීම, එක් වේලාවක එක් ස්ථානයක පමණක් ප්‍රදර්ශනය වීම, සෑම දර්ශන වාරයකම නාට්‍ය නිෂ්පාදනයට දායක වූ පිරිස් ප්‍රතිලාභ ලැබීම, ගබඩා කර තබා ගත නොහැකි වීම වැනි කරුණු සාකච්ඡා කරන්න.

**පියවර 03**
- පන්තියේ සිසුන් කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායම් සඳහා පැවරුම් භාර දෙන්න.

**1 කණ්ඩායමට**

නැරඹූ චිත්‍රපටයක් හා වේදිකා නාට්‍යයක් අතර ඇති සමාන, අසමාන ලක්ෂණ ලේඛනගත කරන්න.

ඒ සඳහා පහත දැක්වෙන අංශ කෙරෙහි අවධානය යොමු කරන්න.

- කතා වස්තුව විකාශනය වන කාලය (වස්තු - කාලය), කතාව විකාශනය වන කාලය (රංග කාලය) ස්ථාන, ක්‍රියා නිරූපණය, විශේෂ මාධ්‍යයන්, ඇඳුම් පැලඳුම්, පසුතල, වගකීම්, ප්‍රතිලාභ යනාදී ලක්ෂණ.

**2 කණ්ඩායමට**

රූපවාහිනී නාට්‍යයක් සහ වේදිකා නාට්‍යයක් අතර සමාන, අසමාන ලක්ෂණ ලේඛනගත කරන්න.

ඒ සඳහා පහත දැක්වෙන අංශ කෙරෙහි අවධානය යොමු කරන්න.

- නිෂ්පාදන ක්‍රියාවලිය, ප්‍රදර්ශන ස්වරූපය, ඇඳුම් පැලඳුම්, ස්ථානය, විකාශන කාලය, විවිධ කලා ප්‍රභේද, ප්‍රදර්ශන වාර, ශිල්පීය වගකීම, ප්‍රතිලාභ, ගබඩා කිරීම.

**3 කණ්ඩායමට**

වේදිකා නාට්‍යයක දක්නට ලැබුණු විවිධ කලා ප්‍රභේදයන් පිළිබඳ ව ලියා දක්වන්න.

**4 කණ්ඩායමට**

වේදිකා නාට්‍ය කලාවෙහි දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ ලේඛනගත කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඒ ඒ මාධ්‍යයන්ට අදාළ

- ආවේණික ලක්ෂණ දැක්වීම
- මාධ්‍යයන් අතර සමාන ලක්ෂණ දැක්වීම
- ඒ ඒ මාධ්‍යයන් ගේ අසමාන ලක්ෂණ දැක්වීම
- ක්‍රමවත් ව කරුණු ඉදිරිපත් කිරීම
- විවිධ කලා නිර්මාණ ශිල්පීන් පිළිබඳ තොරතුරු රැස් කිරීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම :** ඒ ඒ කණ්ඩායමට පැවරූ අභ්‍යාසවල නිරත කරවීම. විවිධ කලා නිර්මාණ හා ශිල්පීන් පිළිබඳ තොරතුරු රැස් කරවීම.

**අතිරේක උදව් :**

- වේදිකා නාට්‍ය හා වෙනත් දෘශ්‍ය කලා මාධ්‍යයන් නැරඹීම, සංයුක්ත තැටි මගින් හෝ නැරඹීම හා ක්‍රියාකාරකම්හි නිරත වීම.
- විවිධ කලා ශිල්පීන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපි ලේඛන.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.3** : නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය යන ප්‍රභේදයන්හි වෙනස පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම** : නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය අතර වෙනස දකිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- නෘත්ත හා නෘත්‍ය යන්න පැහැදිලි කරයි
- නෘත්ත හා නෘත්‍යයෙන් නාට්‍යය වෙනස් වන ආකාරය සාකච්ඡා කරයි
- නෘත්ත හා නෘත්‍ය නිරූපණය වන ක්‍රියාකාරකම් හි නිරත වෙයි
- නර්තනය යනු නෘත්ත හා නෘත්‍යයෙහි සංකලනයක් බව ප්‍රකාශ කරයි

**ගුණාත්මක යෙදවුම්** :
- නෘත්ත, නෘත්‍ය අංග රැගත් සංයුක්ත තැටි
- නර්තන ශිල්පීන් පිළිබඳ තොරතුරු රැගත් ඡායාරූප, පත්‍රිකා හෝ ලිපි ලේඛන

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** ලී කෙළි, සවරං, භරත නැටුම්, මණිපුරි, වඩිග පටුන, නානුමුරය වැනි නර්තන අවස්ථා රැගත් පින්තූර ප්‍රදර්ශනය කර හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 02** නෘත්ත යනු අංග වික්ෂේප භාවිත කරන, රිද්මයානුකූල හා ශෝභමාන දෘශ්‍ය රූපයක් සහිත තාලාන්විත නැටුමක් බවත්, එහි ඇත්තේ නර්තනයක් පමණක් බවත්, එහි කිසිදු අර්ථයක් නොදැක්වෙන බවත්, ඒ සඳහා ලී කෙළි, කලගෙඩි නැටුම් වැනි නර්තනාංග නිදසුන් ලෙස සැලකිය හැකි බවත් පවසන්න.

අවබෝධය පිණිස නර්තනාංගවලට අයත් ගායනයක් සිසුන් සමග ගායනා කරන්න.

**පියවර 03** නෘත්‍ය යනු රංගන මගින් කිසියම් අර්ථයක් හෝ භාවයක් දැක්වෙන තාලාන්විත නර්තනාංගයක් බව ද,

මෙහි දී ආංගික, සාත්ත්වික මෙන් ම ආහාර්ය අභිනය භාවිත වන බව ද, නිදසුන් වශයෙන් භරත නාට්‍යම් හී රාධා ක්‍රිෂ්ණා, ශිව පාර්වතී, රාමා සීතා නිරූපණය කෙරෙන නර්තන විලාසයක් දැක්විය හැකි බව ද, මුද්‍රා නාට්‍යය නෘත්‍ය අංගයක් බව ද සාකච්ඡා කරන්න.

**පියවර 04** නාට්‍යය සඳහා සතර අභිනය ම යොදා ගැනෙන අතර, කිසියම් කතා පුවතක්, සිදුවීමක් හෝ අවස්ථාවක් පාදක කර ගන්නා බව ද, නාට්‍යයක් යනු අපූර්ව අවස්ථාවන් ගෙන් යුතු ව මුල, මැද, අග සහිතව ගොනු කොට ඇති ආනුෂංගික කලාවන්ගේ සංකලනයෙන් විවිධ ස්ථානවල දීර්ඝ කාලයක් තිස්සේ සිදුවන්නා වූ දේ එක් ස්ථානයක සම්පිණ්ඩනය කර දක්වන්නක් බව ද පැහැදිලි කරන්න.

**පියවර 05** පන්තිය කණ්ඩායම් කර, පැවරුම් ලබා දෙන්න.

1 කණ්ඩායම - නෘත්ත අංගයක් ඉදිරිපත් කරන්න.

2 කණ්ඩායම - නෘත්‍ය අංගයක් ඉදිරිපත් කරන්න.

**කතා ඉඟිය**

රජ කුමරියක් මල් උයනක සිරි විඳී. උයනේ ඇති පොකුණක මහනෙල් මල් දැක සතුටින් නෙලා එය සිඹී. එම ආඝ්‍රාණයෙන් ඕ සිහිසුන් වෙයි. විලෙන් විරූපී පුද්ගලයෙක් මතුවේ. සියලු සේවිකාවෝ දුව යති. විරූපී පුද්ගලයා, කුමරිය ස්පර්ශ කරත් ම කුමරිය සිහි ලබයි. විරූපී පුද්ගලයා දැක කුමරිය බිය නොවේ. ඔහු ඇය ව නැගිටුවයි. විරූපී පුද්ගලයා සුරූපී කුමරෙක් බවට පත්වෙයි.

3 කණ්ඩායම - ඉහත සඳහන් කතාවම පාදක කර ගනිමින් නාට්‍යයක් නිර්මාණය කරන්න. නව අර්ථ ගැන්වීමට ද අවස්ථාව ලබා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ඉඟියට අදාළ ව කතාව නිර්මාණය කිරීම
- නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම
- සුදුසු පරිදි අවකාශ භාවිත කිරීම
- තාලාන්විත / අර්ථ ප්‍රකාශන සහිත ව ඉදිරිපත් කිරීම
- ක්‍රමවත් ව ඉදිරිපත් කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** : ඒ ඒ කණ්ඩායම් වෙත පැවරූ නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය අංග ඉදිරිපත් කිරීම.

**අතිරේක උදව්** :

- නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය ප්‍රසංග නැරඹීම
- අදාළ සංයුක්ත තැටි නැරඹීම
- රූපවාහිනී ප්‍රසංග (නර්තනාංග ඇතුළත්) නැරඹීම
- රූපණ ක්‍රියාවලියෙහි නිරත වීම

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.4** : වේදිකා නාට්‍යයෙහි විශේෂතා හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම** : වේදිකා නාට්‍යය දකිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :

- සජීවී කලාවක් ලෙස නාට්‍යයෙහි සුවිශේෂී බව ප්‍රකාශ කරයි.
- නාට්‍යයෙහි කතා වස්තුව මුල, මැද, අග සහිත සිදුවීම් මාලාවක් හෝ අවස්ථාවක් ඇතුළත් ව ඇතත් ඒවා අනුපිළිවෙළින් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව පවසයි.
- කතා වස්තුව නාට්‍යෝචිත අවස්ථා මගින් නිරූපණය වන බව නිරීක්ෂණය කරයි.
- පෙළ සාහිත්‍යය, නාට්‍යයක සුවිශේෂී ලක්ෂණයක් බව ප්‍රකාශ කරයි.
- නාට්‍යය ප්‍රේක්ෂකයන් හමුවට ඉදිරිපත් කිරීම සඳහා සතර අභිනය භාවිත කරන ආකාරය අධ්‍යයනය කරයි.
- නාට්‍යයක් සඳහා යොදා ගන්නා ආනුෂංගික ශිල්ප භාවිතය නිරීක්ෂණය කරයි.
- නාට්‍යය යනු සාමූහික ප්‍රයත්නයක යහපත් වූ ප්‍රතිඵලයක් බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : වේදිකා නාට්‍යයක් නැරඹීම
(සංයුක්ත තැටියක් මගින් හෝ නාට්‍යයක් නැරඹීමට අවස්ථාව ලබා දීම වැදගත් ය.)

**පියවර 01**

- සිසු දරුවන් සමග නැරඹූ වේදිකා නාට්‍යයක් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- නාට්‍ය පෙළ හෙවත් පිටපතක, කතා වස්තුව, පෙළ ගැස්ම, අවකාශ භාවිතය, ශෛලිය, අපූර්ව අත්දැකීම් ඇතුළත් ව ඇති බව පවසන්න.

**පියවර 02**

- නාට්‍යයක්, ප්‍රේක්ෂකයන් හමුවට ඉදිරිපත් කිරීමේ දී සතර අභිනය උපයෝගී කර ගන්නා බව හා ආනුෂංගික කලා ශිල්ප සුසංයෝගී වන ආකාරය සාකච්ඡා කරන්න.
- නාට්‍යය සඳහා ප්‍රේක්ෂක සහභාගිත්වය අනිවාර්ය බව, සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර හිමිවන බව හා ඒ අනුව නාට්‍යය ක්ෂණික ව වෙනස් කරගත හැකි බව ද, ඒ ඒ දර්ශනයන්ට චරිත නිරූපණය සඳහා වෙනත් නළු නිළියන් සහභාගි කරගත හැකි බව ද පවසන්න.
- ප්‍රේක්ෂක අවධානය ලබා ගැනීම සඳහා විශේෂ රංග ප්‍රයෝග, ප්‍රවේශන රටා, නිෂ්ක්‍රමණ රටා බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

**පියවර 03**

- සිසුන් කණ්ඩායම් කරන්න
- පැවරුම් භාර දෙන්න

**1 කණ්ඩායම**

ඔබ නැරඹූ නාට්‍යයේ කතා වස්තුව ගොඩනංවා ඇති ආකාරය විස්තර කරන්න. (එහි දී කතාව ගළපා ඇති ආකාරය, සිදුවීම් අතර සම්බන්ධතාව ගොඩනංවා ඇති ආකාරය, තේමාව කෙරෙහි අවධානය යොමු කරන්න.)

**2 කණ්ඩායම**

නැරඹූ නාට්‍යයේ පාත්‍රයන් පැලඳි වේෂභූෂණ, චරිත, ගති ලක්ෂණ හෙළිදරව් කිරීමට කෙතෙක් දුරට සමත් වූයේදැයි සාකච්ඡා කරන්න.
(චරිතයක බාහිර ස්වරූපය, චරිතයක අභ්‍යන්තර ගති විලාස, වයස, තරාතිරම, දෘශ්‍ය රූපයේ ශෝභා සම්පන්න බව යන කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.)

**3 කණ්ඩායම**

ඔබ නැරඹූ නාට්‍යයේ රංග කාර්යයට දායක වූ ආනුෂංගික කලාශිල්ප පිළිබඳ විස්තරයක් කරන්න.

(වේෂ-භූෂණ, පසුතල, නර්තන අංග, රංග ආලෝකය, සංගීතය පසුබිම් ගීත, කවි)

**4 කණ්ඩායම**

''නාට්‍යය යනු බොහෝ කලා ශිල්පීන් ගේ සාමූහික ප්‍රයත්නයක මනා ප්‍රතිඵලයකි'' විමසන්න.

(ඔබ නැරඹූ නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ශිල්පීන් හා ඔවුන් ගේ කාර්යභාරය කෙරෙහි අවධානය යොමු කරමින් කථනයෙන් ඉදිරිපත් කරන්න.

- පෙළ රචක, නිෂ්පාදක, පාත්‍ර වර්ගයා
- වෙස් සැලසුම්කරු
- පසුතල නිර්මාණ
- පෙළ මතක් කරන්නා (Promptor)
- ආලෝක ශිල්පීන්
- අංග රචනා ශිල්පී
- සංගීතඥයා

**පියවර 04** පැවරුම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී අගය කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නොබිය ව ඉදිරිපත් වීම
- නිවැරදි ව කරුණු ඉදිරිපත් කිරීම
- නිවැරදි ව නිදසුන් ඉදිරිපත් කිරීම
- සංවිධානාත්මක බව ප්‍රදර්ශනය කිරීම
- සමස්ත නිර්මාණයේ සාර්ථකත්වය යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** : ඒ ඒ කණ්ඩායමට නියමිත පැවරුම් කාර්යයෙහි නිරත වීම තුළින් අවබෝධය ලබා ගැනීම.

**අතිරේක උදව්** :
- වේදිකා නාට්‍යය නැරඹීම.
- නාට්‍යයන් පිළිබඳ විචාර කියවීම.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.5** : රූපණ කාර්යයේ දී ශිල්පියකු ප්‍රගුණ කළ යුතු කුසලතා හා ගුණාංග හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම** : රූපණ ශිල්පියා ගේ කාර්යභාරය හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ''රූපණය'' යන්න හඳුනා ගනියි.
- ශිල්පීය කුශලතා වර්ධනය කර ගනියි.
- අනුකරණය සහ සමාරෝපය, රූපණය සඳහා උපයෝගි කර ගනියි.
- රූපණයේ දී සතර අභිනය භාවිතය විශේෂ වන ආකාරය නිරීක්ෂණය කරයි.
- රූපණ ශිල්පියෙකුට අවශ්‍ය ගුණාංග හඳුනාගනියි.

**ගුණාත්මක යෙදවුම්** : වේදිකා නාට්‍යයක සංයුක්ත තැටියක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- වේදිකා නාට්‍යයක (සංයුක්ත තැටියක් මගින්) කොටසක් නැරඹීමට අවකාශ සලසමින් ඒ පිළිබඳ ව සාකච්ඡාවක් ගොඩ නගන්න.
- නළුවන් ගේ රංග කාර්යය පිළිබඳ ව විශේෂ අවධානය යොමු කරන්න.
- චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත්වීම නළු කාර්යය ''රූපණය'' නම් වන බව නිදසුන් සමගින් සාකච්ඡා කරන්න.
- රූපණයේ දී අනුකරණය හා සමාරෝපය යන ක්‍රියාවලිය වැදගත් වන බවත් ඒ සඳහා ශිල්පියෙකු සතුවිය යුතු ගුණාංග ලෙස,
- වෙහෙසීම
- අමාරුකම් ගණන් නොගැනීම
- ඕනෑ ම කායික හා මානසික ස්වභාවයන් ගේ පතුලට ම කිඳා බැසීමට තරම් දැඩි ආත්ම ශක්තියක් වර්ධනය කර ගැනීම දැක්විය හැකි බවත් ප්‍රකාශ කිරීම.
- රූපණය කාලයක් තිස්සේ පුහුණු විය යුත්තකි. පුහුණු වීමේ දී නළුවන් විසින් ප්‍රගුණ කළ යුතු අංග දෙකකි.
  1. අභ්‍යන්තරික ප්‍රකාශනය (සිත)
  2. බාහිර ප්‍රකාශනය (ශරීරය හා කටහඬ)

නළුවා ඇස, කන, නාසය, දිව සහ ශරීරය යන පංචේන්ද්‍රියයන් මගින් ලබා ගන්නා අත්දැකීම් තවත් අයකුට හෝ පිරිසකට තේරුම් ගත හැකි අන්දමින් මවා දැක්වීම රූපණයේ දී සිදුවේ. මෙම කරුණු පිළිබඳ ව සාකච්ඡා කරන්න.

- රූපණයේ දී තමා ජීවිතයෙන් ලැබූ අත්දැකීම් මෙන් ම පරිකල්පන ශක්තිය ද වැදගත් වේ.
- රූපණ කාර්යයේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම උචිත ය.
  1. කෙබඳු කායික ස්වරූපයක් ඇත්තෙක් ද? (උස, මිටි)
  2. කෙබඳු මානසික ස්වභාවයක්, රුචි අරුචිකම් ලැයිස්තුවක් හා අදහස් උදහස් දරන්නෙක් ද?
  3. තමාට හිමි චරිතය මේ අන්දමින් කටයුතු කරන්නේ ඇයි ?
  4. මේ වචන කියන්නේ ඇයි?

යන ප්‍රශ්නවලට තාර්කික ව හේතුඵල සම්බන්ධය විමසීම අවශ්‍ය ය. එලෙස ම චරිතයේ වයස, ජීවත් වූ යුගය, සංස්කෘතික පසුබිම ආදී කරුණු කෙරෙහි ද අවධානය යොමුවිය යුතු වේ.

**පියවර 02**

- ශිෂ්‍ය කණ්ඩායම අංක 1 2 3 4 5 වශයෙන් වෙන් කර එක් එක් අංකයට නියමිත මාතෘකාව ලබා දීම.
  1. මවක්
  2. පූජකයෙක්
  3. හිඟන්නෙක්
  4. උමතු පුද්ගලයෙක්
  5. ගුරුවරයෙක්

**පියවර 03**

එක් එක් සිසු දරුවන්ට රූපණය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙමින් අගය කිරීම.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

1. චරිතය පිළිබඳ අවබෝධය ප්‍රකට කිරීම
2. නිවැරදි ව තාර්කික ව කරුණු ඉදිරිපත් කිරීම
3. උචිත භාෂා ව්‍යවහාරය භාවිත කිරීම
4. අපූර්වත්වයෙන් යුතු ව ඉදිරිපත් කිරීම
5. සාර්ථක ව නිරූපණ කාර්යයෙහි නියැළීම

යන කරුණු ඇගයීමට ලක් කරන්න.

**පැවරුම** :

- එක් එක් ශිෂ්‍යයා ලවා චරිත නිරූපණය කරවීම.

**අතිරේක උදව්** :

- එදිනෙදා හමුවන පුද්ගල හා සත්ත්ව චරිත අධ්‍යයනය කිරීම.
- චරිතාපදාන ග්‍රන්ථ කියවීම.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.6** : රංග භූමිය හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම** : රංග භූමි හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- රංග භූමිය හඳුනා ගනියි.
- රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ වටහා ගනියි.
- රංග භූමි නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
රංග භූමිවල රූපසටහන්
රංග භූමිවල ඡායාරූප
රංග භූමි ඇතුළත් වීඩියෝ පට
රංග භූමිවල අනුරූ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- රංග භූමි කීපයක පින්තූර හෝ අනුරූ පෙන්වමින් පාඩමට පිවිසෙන්න.
- ඉදිරිපත් කරන ලද රංග භූමි පිළිබඳ ව සිසුන් ගෙන් විමසමින් ඒ පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පියවර 02**
- නාට්‍යයක් රඟ දක්වන ඕනෑ ම ස්ථානයක් රංග භූමියක් වශයෙන් හැඳින්වෙන බව පවසමින්, රංග පීඨය, කරළිය, රඟමඬල, වේදිකාව යන නම්වලින් ද රංග භූමිය නම් කෙරෙන බව පැහැදිලි කරන්න.
- අතීතයේ ගිනිමැල භූමිය, පූජා භූමිය, යාග භූමිය හා කමත ආදී ස්ථානවලින් මෙම කාර්යය ඉටු වූ බව පහදන්න.
- සොකරි නාට්‍යයේ දී රංග භූමිය ලෙස කමත යොදාගත් බවත්, කෝලම්වල දී රංග භූමිය තානායම්පොළ නම් වූ බවත්, නාඩගම්වල දී එය කරළිය නම් වූ බවත්, එතැන් සිට වර්තමානය දක්වා නූතන වේදිකාව විකාශනය වී ඇති බවත්, ගෘහස්ථ සහ එළිමහන් වශයෙන් රංග භූමි පවතින බවත් පැහැදිලි කරන්න.

**පියවර 03** රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ ලෙස
- රංග භූමිය සමතලා බිමක් විය යුතු බවත්,
- රඟ පෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබිය යුතු බවත්,
- ප්‍රේක්ෂක පිරිසකට පහසුවෙන් නැරඹිය හැකි වන සේ පිහිටා තිබිය යුතු බවත්,
- රංග ශිල්පීන්ට අවශ්‍ය වන අවම පහසුකම්වලින්වත් රංග භූමිය සමන්විත විය යුතු බවත් පැහැදිලි කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- රංග භූමිය හඳුනා ගැනීම
- රංග භූමිය හඳුන්වන විවිධ නම් ප්‍රකාශ කිරීම
- රංග භූමිවල විශේෂ ලක්ෂණ දැක්වීම
- අදාළ රංග භූමිවල පින්තූර පත්‍රිකා එක්රැස් කිරීම
- අතීතයේ රංග භූමිය ලෙස භාවිත කළ ස්ථාන නම් කිරීම

**පැවරුම** : විවිධ රංග භූමිවල අනුරූ නිර්මාණය කරවීම.

**අතිරේක උදව්** :
- විවිධ රංග භූමිවල රඟපාන දර්ශන ඇතුළත් වීඩියෝ පට
- විවිධ රංග භූමිවල පින්තූර හා පත්‍රිකා

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.7** : රංග භූමි වර්ග හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම** : රංග භූමි වර්ග හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- රංග භූමි වර්ග හඳුනා ගනියි.
- රංග භූමියේ නූතන මනඃකල්පිත බෙදීම් පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ රංග භූමිවල පින්තූර
- කොටස් 9කට බෙදා දක්වන නූතන රංග භූමියේ රූප සටහනක්
- කලින් දින පාඩම සඳහා පැවරුමක් ලෙස සිසුන් විසින් සකස් කරන ලද රංග භූමි අනුරූ කීපයක් (ආකෘති)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** සිසුන් තමන් විසින් නරඹන ලද වේදිකා නාට්‍ය රඟ දක්වා ඇති විවිධ රංග භූමි පිළිබඳ ව විමසමින් පාඩමට පිවිසෙන්න.

- රංග භූමිය එළිමහන් හා ගෘහස්ථ වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදෙන බවත්, වට රවුම් (කවාකාර, ඇරීනා) රංග භූමි, අර්ධ කවාකාර රංගභූමි, ප්‍රොසීනියම් (පින්තූර රාමු) හෙවත් ආරුක්කු වේදිකාව ද වශයෙන් නූතන රංග භූමි ප්‍රභේද කිහිපයක් ඇති බව පැහැදිලි කරන්න.
- සමහර රංග භූමි තුළ කැරකෙන වේදිකා යනුවෙන් අමතර රංග ප්‍රදේශයක් දක්නට ලැබෙන බවත් නූතනයේ ජංගම වේදිකාවන් ද දක්නට ලැබෙන බවත් පැහැදිලි කරන්න.

**පියවර 02**
- නූතන රංග භූමිය (පින්තූර රාමු) කොටස් නවයකට (09) බෙදෙන ආකාරය පැහැදිලි කරන්න. මෙහි දී මෙම බෙදීම පිළිබඳ ව හැඳින්වීම ද කළ යුතු ය. මෙය මනඃකල්පිත ව බෙදෙන ලද්දක් බවත් මෙය හඳුනා ගැනීම තුළින් රංගන ශිල්පීන්ට හා වේදිකා පරිපාලකයින්ට තම කටයුතු කිරීමේ දී වඩාත් පහසුවන බවත් පැහැදිලි කරන්න. රූප සටහන ඇඳීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- වෘත්තාකාර වූ සොකරි රංග භූමියේ වටේටම සිට නාට්‍ය නැරඹිය හැකි බවත්, කරළිය නම් වූ අර්ධ කවාකාර නාඩගම් රංග භූමියේ ද තුන් පැත්තකින් සිට නාට්‍ය නැරඹීමට හැකි බවත්, නූතන වේදිකාවේ (ප්‍රොසීනියම්) නාට්‍ය නැරඹිය හැක්කේ එක් පසෙක සිට පමණක් බවත් වටහා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රංග භූමි වර්ග හඳුනා ගැනීම
- රංග භූමිවල විශේෂ ලක්ෂණ වටහා ගැනීම
- රංග භූමිවල විවිධ හැඩ විමසීම
- නූතන රංග භූමියේ මනඃකල්පිත ව බෙදා ඇති කොටස් හඳුනා ගැනීම
- එම බෙදීමෙන් ලැබෙන වාසි විග්‍රහ කිරීම යන කරුණු ඇගයීමට ලක් කරන්න.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.1** : විවිධ චලන අභ්‍යාසයන්හි යෙදෙයි.

**ක්‍රියාකාරකම** : ස්වාභාවික චලන, නිර්මිත චලන හා තාලානුකූල චලනයන්හි යෙදීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ස්වාභාවික චලන, නිර්මිත චලන හා තාලානුකූල චලන හඳුනා ගැනීම.
- ස්වාභාවික චලන සහ නිර්මිත චලන අතර වෙනස හඳුනා ගැනීම.
- තාලානුකූල චලනයක් නිර්මාණය කර ගැනීමට හැකිවීම.
- ස්වාභාවික චලන, නිර්මිත චලන සහ තාලානුකූල චලන ප්‍රායෝගික ව අවබෝධ කර ගැනීම.

**ගුණාත්මක යෙදවුම්** : සංයුක්ත තැටියක් / රබානක් / තාලම්පට / නළාව (විසිල් එක)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පන්ති කාමරය මේස පුටුවලින් තොර නිදහස් අවකාශයක් ලෙස සකස් කර ගන්න. පාවහන් ගලවා රංග අභ්‍යාස කිරීමට සුදුසු ඇඳුමකින් සැරසීම වඩාත් සුදුසු ය.
- සියලු ම ළමුන්ට හිස් අවකාශය තුළ නිදහසේ ඒ මේ අත ඇවිදින්නට උපදෙස් දෙන්න. මෙහි දී එකිනෙකාගේ ශරීරයෙහි නොගැටී අවකාශයෙහි සෑම අත ම ඇවිදිය යුතු ය.
- එසේ ඇවිදින අතර අත්පුඩියකින් හෝ නළාවකින් සංඥාවක් දුන් විට වාඩි වීම, උඩ පැනීම, නැවත ඇවිදීම වැනි චලන නිදහසේ කිරීමට ඉඩ දෙන්න.
- සියලු ම සිසුන් විධානයකින් නවත්වා සමසේ කණ්ඩායම් දෙකකට බෙදන්න. එක් කණ්ඩායමක් වටේට සිට ගෙන බලා සිටින අතර අනෙක් සියලු දෙනා පෙර සේ ම ඇවිදී. පසුව අනෙක් කණ්ඩායම ඇවිදින අතර අනෙක් සියලු දෙනා වටේ සිට නිරීක්ෂණය කරති.
- එදිනෙදා ජීවිතයේ දී ආයාසයකින් තොර ව අප විසින් කරනු ලබන ඇවිදීම වැනි චලනයන් ස්වාභාවික චලන නමින් හැඳින්වෙන බව අවබෝධ කළ යුතු ය.
- සිසුන් සියලු ම දෙනා කාමරයේ එක් පසෙකට ගන්න. ඔවුන් ඉදිරියේ ඇත්තේ අඩි 5ක් පමණ පළල පාලමකි. එක් සිසුවා බැගින් එම පාලමෙන් එගොඩ විය යුතු ය. එහෙත් එම පාලමෙන් එතෙර විය හැක්කේ තමාගේ ස්වාභාවික ගමන් තාලයට නොවන වෙනත් කුමන හෝ ගමන් තාලයකට ය. මෙහි දී එක් අයකු අනුගමනය කළ ක්‍රමය වෙනත් කිසිවකුට කළ නොහැකි බවට උපදෙස් ලබා දෙන්න. එම ගමන් තාල සියල්ල නිර්මිත චලන බව පෙන්වා දෙන්න.
- මී ළඟට සංයුක්ත තැටිය වාදනය කරන්න. එයින් ඇසෙන සංගීත ඛණ්ඩය රස විඳින්න. එහි තාලය හඳුනා ගන්න. දැන් එම සංගීතයේ තාලයට අනුව අවකාශයෙහි ඇවිදින්න. බීප් ... බීප් ... බීප් ... හඬක් නිකුත් වෙයි නම් රොබෝ යන්ත්‍රයක් (මිනිසෙක්) ලෙස තාලානුකූල ව අත්, පා ඇතුළු ශරීරය චලනය කරවිය හැකි ය. සංගීත ඛණ්ඩය නිමා කරන්න. සියලු ම

සිසුන් රවුමකට සිට ගැනීමට කියා ගුරුවරයා විසින් මුල සිට කරන ලද සියලු ම චලන ක්‍රියාකාරකම් පිළිබඳ ව සමාලෝචනයක යෙදෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එදිනෙදා ජීවිතයේ දී ආයාසයකින් තොර ව සිදු කරන චලනයන් ස්වභාවික චලන බව හඳුනා ගැනීම.
- තමාගේ පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරන චලන රටා නිර්මිත චලන ලෙස හඳුනා ගැනීම.
- නිශ්චිත (ගණිතමය) රටාවකට අනුව බෙදා වෙන් කළ ක්‍රමයකට අනුව කරනු ලබන චලන තාලානුකූල චලන බව හඳුනා ගැනීම.
- නිර්මිත චලන රූපණ කාර්යයේ දී ඉතා ම වැදගත් වන බව හඳුනා ගැනීම.
- නිර්මිත චලන සහ තාලානුකූල චලන මගින් අදහස් ප්‍රකාශ කිරීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න

**පැවරුම** :

- නිර්මිත චලන උපයෝගි කර ගනිමින් තම ශරීරය මගින් විවිධ රූප රටා සහ හැඩතල නිර්මාණය කරන්න.
- කණ්ඩායම් වශයෙන් (5 දෙනෙකු පමණ) එකතු වී නිශ්චල රූපයක් (හැඩයක්) නිර්මාණය කරන්න.
- සංයුක්ත තැටියෙහි වාදනය වන සංගීත ඛණ්ඩවලට අනුව නර්තනයෙහි යෙදෙන්න.

**අතිරේක උදව්** : විවිධ රටාවනට රිද්මයන්ට අනුව ගැයෙන ගී හෝ වාදන (කාවාඩි හෝ මෙරිගෝ රවුන්ඩ්) මාත්‍රා සංගීතවලට අනුව නර්තනයෙහි යෙදෙන්න.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.2 :** කායික හා මානසික ඒකාග්‍රතාව සඳහා අදාළ අභ්‍යාසයන්හි යෙදෙයි.

**ක්‍රියාකාරකම** : සිතයි ගතයි එකතු කරමු.


**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගැනුම් පල** :

- මනස හා කය අතර සම්බන්ධතාව ඇති කර ගැනීමට නම් චිත්ත ඒකාග්‍රතාවක් අවශ්‍ය බව පිළිගනියි.
- මානසික ඒකාග්‍රතාව තිබෙන විට යමක් අවබෝධ කර ගැනීමට පහසු වන බව පිළිගනියි.
- රූපණ කාර්යයේ දී අවශ්‍ය වන මානසික ඒකාග්‍රතාව ඇති කර ගනියි.
- රංග අභ්‍යාස මගින් ශරීරය සහ මනස සැහැල්ලු කර ගනියි.

**ගුණාත්මක යෙදවුම් :** සුදුසු සංගීත ඛණ්ඩ ඇතුළත් සංයුක්ත තැටියක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**




පියවර 1

- හොඳින් ඉඩකඩ ඇති හිස් අවකාශයක් තෝරා ගන්න. සියලු සිසුන් සැහැල්ලු ඇඳුමකින් සැරසී සිටිය යුතු ය. සිසුන් වෘත්තාකාර හැඩයකට සිට ගැනීමට සලස්වා එහි මැද ගුරුවරයා සිටිය යුතු ය. මුලින් ම ආශ්වාස ප්‍රශ්වාස අභ්‍යාසයන් කරවන්න.
- සියලු සිසුන් ගේ දකුණු පාදය දන හිසින් නවා වම් පාදයෙහි ස්පර්ශ වන සේ තබා ගන්න. දැන් විශාල හුස්මක් ඉහළට ගන්නා ගමන් දෑත් හිසට ඉහළින් සිටින සේ ඔසවන්න. නැවත හුස්ම පිට කරන ගමන් දෑත් සහ පාදය සෙමින් පහළට ගෙන එන්න. ගුරුවරයා ගේ විධානයට අනුව ක්‍රමානුකූල ව මෙසේ කිහිප වාරයක් කරන්න. පාද මාරු කර එය නැවත නැවත කරවන්න. මනස සහ ශරීරය එක් අරමුණකට පත් වූ විට මෙය පහසුවෙන් කළ හැකි ය.
- සියලු ම දෙනා නිහඬ ව අවකාශය පුරා ඇවිදින්න. සංයුක්ත තැටියෙන් පෙරහරක හඬ ඇසීමට සලස්වන්න. ගුරුවරයා ගේ විධානය මෙහි දී අවශ්‍ය වේ.
  ''දැන් ඔබ සැම දෙනාට ම පෙරහරක හඬක් ඇසෙනවා. පෙරහරේ විවිධ අංග තිබෙනවා. ඔන්න දැන් ඔබ ඉදිරියෙන් පෙරහර ගමන් කරනවා. පෙරහරේ කැමති කොටසකට ඔබත් එකතු වෙනවා. තමන් එකතු වූ අංගයට අදාළ ව තාලයකට අනුව රිද්මයානුකූල ලෙස නිරූපණයකින් ඔබ පෙරහරේ ගමන් කරනවා. (අභ්‍යාසය නිමා කරන්න.) නිදහසේ ඇවිදින්න. සිසුන් සමග කළ දෑ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- මානසික ඒකාග්‍රතාව යනු කුමක්දැයි හඳුනා ගැනීම.
- මානසික ඒකාග්‍රතාව මගින් ශරීරය පාලනය වන බව ප්‍රකාශ කිරීම.
- මානසික හා කායික ඒකාග්‍රතාවය ලබා ගැනීම.
- ප්‍රායෝගික ව සුදුසු අභ්‍යාස 2ක් කර පෙන්වීම.
- රූපණ කාර්යය සඳහා මානසික හා ශාරීරික අභ්‍යාස අවශ්‍ය බව පිළිගැනීම.

උක්ත කරුණු ඇගයීමට ලක් කරන්න.

**පැවරුම** :

- මානසික ඒකාග්‍රතාවක් ඇති කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාකාරකම් 5ක් ලියන්න.

**අතිරේක උදව්** :

- සුදුසු හඬ පටයකට අනුව තනි තනිව අභ්‍යාසයන්හි නියැළීම.
- බෝධි පූජා, පිරිත් අඩංගු ශ්‍රව්‍ය පටවලට සවන් දීම.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.3** : නිර්මාණාත්මක රංග ක්‍රීඩාවන්හි යෙදෙයි.

**ක්‍රියාකාරකම** : හොඳින් සිතා හොඳින් අසා හොඳින් රඟමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව පෙන්නුම් කරයි.
- සාමූහික ව ක්‍රීඩාවේ යෙදෙයි.
- රංග ක්‍රීඩා නිර්මාණය කරයි.
- අවධානය ප්‍රගුණ කරයි.
- ජයග්‍රාහී ඉලක්ක කරා ගමන් කිරීමට කැමැත්ත දක්වයි.


**ගුණාත්මක යෙදවුම්** :
- ක්‍රීඩා සඳහා භාවිත කරන නලාවක්
- පත්තර පිටු හෝ ඝන කඩදාසි කීපයක් / ඉටි රෙදි
- රංග ක්‍රීඩාවල පින්තූර
- රංග ක්‍රීඩා සම්බන්ධ දෘශ්‍ය පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- පන්තියේ සිසුන් ඉඩකඩ සහිත ස්ථානයකට රැගෙන යන්න.
- පූර්ව දැනුම් දීමක් සහිත සිසුවෙක් ප්‍රයෝජනයට ගෙන හදිසියේ ක්ලාන්ත වූ ස්වරූපයක් අනුකරණය කරන්නට අවස්ථාව ලබා දෙන්න.
- මේ අවස්ථාවේ දී ක්ෂණිකව ම සිසුන්ට ක්‍රියාත්මක වීමට ඉඩ ලබා දෙන්න.
- ඉන් පසු අසනීප වූ ආකාරය දැක් වූ ශිෂ්‍යයාට ප්‍රකෘති ස්වරූපයෙන් සිටීමට සලස්වා එම ස්වභාවය අනුකරණය කරන රූපණයක් පමණක් බව පෙන්වා දෙන්න.
- මෙහි දී ක්ලාන්ත වූ ශිෂ්‍යයා වෙනුවෙන් ක්‍රියාත්මක වූ ශිෂ්‍යයින් ඇගැයීමට ලක් කරන්න. ඔවුන් ක්ෂණික ව ගත් ක්‍රියාමාර්ගවල වැදගත්කම පැහැදිලි කරන්න.
- ඒ ආකාරයට ක්ෂණික ව ක්‍රියාත්මක විය හැකි ආකාර බහුල බවත්, එක් එක් අවස්ථාවල දී ක්‍රියාත්මක වන ආකාර විවිධ බවත් සාකච්ඡා කරන්න.
- මේ ආකාරයට ක්‍රියාත්මක විය හැකි රංග ක්‍රීඩාවන් ද ඇති බව පෙන්වා දෙන්න.

  උදා: අංක අනුව සිසුන් කණ්ඩායම් වීම ආදී ක්‍රීඩා

**පියවර 02**
- සිසුන් නිදහස් එළිමහන් ප්‍රදේශයකට ගෙන යන්න. වේදිකාව වුව ද ප්‍රයෝජනයට ගත හැකි ය.
- ගුණාත්මක යෙදවුම් සඳහා දී ඇති පත්තර පිටුව හෝ ඝන කඩදාසි කීපය / හෝ ඉටි රෙදි කැබලි කීපය ගෙන සීමා නම් කරන ලද ප්‍රදේශයක අපිළිවෙළට එළන්න.



- නම් කරන ලද ප්‍රදේශය මුහුද සේ සලකන්න. එලන ලද පත්තර පිටු කුඩා දූපත් සේ සලකන්න.
- දූපත්වලට අඩිය නොතබා මුහුදු ජලයේ සෑම දෙනාම පාවී පාවී යන ආකාරයට විවිධ දිසා ඔස්සේ ගමන් කිරීමට අවස්ථාව ලබා දෙන්න. (ළමයින් මුහුදු ජලයේ පාවී යන මිනිසුන් පිරිසක් බව අවධාරණය කරන්න)
- මුහුදු සීමාවට පිටතින් මෝරකු සේ එක් ළමයෙක් රැඳී සිටී.
- නලාවක් නාද වූ විගස මෝරා මිනිසුන් (ශිෂ්‍යයින්) කෑමට පැමිණෙන බව දන්වන්න.
- මෝරා පැමිණෙන විට (මිනිසුන්ට) ශිෂ්‍යයින්ට දූපතට ගොඩ වීමට හැකියාව ඇත.
- මෝරා මුහුදු සීමාවට ඇතුළු වී මිනිසුන් සොයා කෑමට සූදානම් වී සිටී. (මිනිසුන් ලෙස ශිෂ්‍යයින්)
- මෝරා පැමිණ ස්පර්ශ කළ විට මෝරා කෑවා සේ සලකා මුහුදු සීමාවෙන් ඉවත් විය යුතු ය.
- මෝරා එක් වරක් කන විට එක් දූපතක් මදක් යටවෙයි. (එක් පත්තර පිටුවක් දෙකට නවන්න) එසේ ම එක වරකට එක පත්තර පිටක් අයින් කරන්න.
- යම් අයෙකුගේ කකුලක් හෝ පත්තර පිටුවෙන් ඉවතට ගැවී තිබෙන විට එම ශිෂ්‍යයා තරගයෙන් ඉවත් කරන්න.
- මේ ආකාරයට පත්තර පිටුව නවමින් දූපතට ගොඩ වැදිය හැකි ප්‍රමාණය අඩු කරන්න.
- පත්තර පිටු ඉවත් කරමින් ක්‍රීඩාවේ යෙදෙන්න.
- මෝරකු එක් වරක් මිනිසුන් කෑ විට ඔහු ද තරගයෙන් ඉවත් වේ. එහෙත් කෑමට ලක් වූ වෙනත් ළමයකු ඊ ළඟ මෝරා වෙයි.
- මෙහි දී කෑ ගසා ශබ්ද නොකර දූපතට ගොඩ විය යුතු ය. කෑ ගැසුවහොත් ඒ අසලට මෝරා පැමිණ ඒ මිනිසා කයි.
- මෙහි දී අවධානයෙන් නලා හඬට අවධාරණය කරන ළමයා අවසානයේ ජය ගනී.
- ක්‍රීඩාව අවසානයේ 8 ට පමණ නවන පත්තර පිටක් සමග ළමයෙකු ජය ගනී.

පියවර 03
- මෙම ක්‍රීඩාව අවසානයේ ඉතිරිවන දරුවෝ ජයග්‍රාහකයෝ වෙති.
- ඉතිරි වූ ශිෂ්‍යයා ජයග්‍රාහී ශිෂ්‍යයා ලෙස නම් කරන්න.
- ඔහු තුළ තිබූ ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව අවධානය ජයග්‍රාහී ඉලක්කය කරා යාමේ ගුණය පිළිබඳ ප්‍රශංසාත්මක ව කතා කරන්න.
- මෙවැනි වෙනත් ක්‍රීඩා නිර්මාණය කිරීමට ශිෂ්‍යයින්ට අවස්ථාව ලබා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සාමූහික ව රංග ක්‍රීඩාවේ යෙදීම.
- ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම.
- ජයග්‍රාහී ඉලක්කය කරා යාමට උත්සාහ කිරීම.
- ජය පරාජය විඳ දරා ගැනීම.
- අවධානය, අවදානම හා ශ්‍රවණය පිළිබඳ අවධාරණය කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම :**
- ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කරගත හැකි රංග ක්‍රීඩා නිර්මාණය කරන්න.

**අතිරේක උදව් :**
- රංග ක්‍රීඩා පිළිබඳ දක්වා ඇති ශ්‍රව්‍ය දෘශ්‍ය පට
- රංග ක්‍රීඩා පිළිබඳ ආචාර්යවරුන්
- ඒ සම්බන්ධ ව ලියැවුණු පොත්පත් / පින්තූර
- රංග ක්‍රීඩා පුහුණු පාසල්වලට සිසුන් රැගෙන යාම

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.4** : චරිතයක්, සිදුවීමක්, අවස්ථාවක් හෝ කිසියම් භාණ්ඩයක් තේමා කරගත් සාමූහික ව හා කේවල වශයෙන් නිර්මාණාත්මක නිරූපණයන්හි යෙදෙයි.

**ක්‍රියාකාරකම** : ඇසූ දුටු දේ කර පෙන්වමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- සාමූහික හෝ ඒකල නිරූපණයෙහි යෙදෙයි.
- නිරූපණ කාර්යයෙහි ලා එකඟතාව වැදගත් බව පවසයි.
- අන්‍යන්ගේ අදහස් හා යෝජනා විමසයි.
- නිරූපණයෙහි ලා නිර්මාණශීලී චින්තනය හා පරිකල්පනය වැදගත් බව පවසයි.
- කේවල සහ සාමූහික නිරූපණයේ සාර්ථකත්වයට සතර අභිනය නිසි පරිදි භාවිතය අවශ්‍ය බව පවසයි.

**ගුණාත්මක යෙදවුම්** : විවිධ අවස්ථාවන්, සිද්ධි, චරිත ඇතුළත් පින්තූර, සංයුක්ත තැටි

**විෂය අන්තර්ගතය** : චරිතයක්, සිදුවීමක්, අවස්ථාවක් හෝ කිසියම් භාණ්ඩයක් තේමා කරගෙන කේවල හා සාමූහික නිරූපණවල යෙදීම.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** පන්තියේ දක්ෂතා දක්වන සිසුවෙකු යොදවා ගෙන කිසියම් චරිතයක් නිරූපණය කරවීම හා සිසුන් කීප දෙනකු යොදවා ගෙන සමූහ නිරූපණයක් කරවමින් පාඩමට පිවිසෙන්න.

**පියවර 02** එම නිරූපණයන් පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සමාජයේ විවිධ චරිත, සිද්ධි, අවස්ථාවන් නිරූපණය කිරීමේ දී ඒවා පිළිබඳ ව මනා අත්දැකීම් ලබා තිබීම හෝ අධ්‍යයනය කර තිබීම අත්‍යවශ්‍ය බව පැහැදිලි කරන්න.
- කේවල ව හා සාමූහික ව නිරූපණ කීපයක් කිරීමට සිසුන් යොමු කරන්න.

**පියවර 03**
- සිසුන් සිටින ප්‍රමාණය පිළිබඳ ව සලකා බලා සිසුන් 10-15 ක් අතර සංඛ්‍යාවක් සිටින සේ කණ්ඩායම් කරන්න.
- එම කණ්ඩායම්වලට වෙළඳපොළක්, විවාහ මංගල්‍යයක්, අවුරුදු උළෙලක්, මළ ගෙදරක අවස්ථාවක් වැනි මාතෘකාවක් ලබා දෙන්න.
- කේවල ව කළ හැකි රංගන අවස්ථා කීපයක් ද සිසුන් ලවා කරවන්න. (ගුරුවරයාට අභිමත පරිදි මාතෘකා ලබා දිය හැක.)
- විවිධ ද්‍රව්‍ය පදනම් කරගෙන ද නිරූපණ කිරීමට අවස්ථාව සලසන්න. (පුටුවක්, පත්තරයක්, බෝතලයක්, සෙරෙප්පුවක් වැනි)
- අවසානයේ එක් එක් කණ්ඩායම්වල සහ කේවලව කරන ලද නිරූපණ පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න. ද්‍රව්‍යයක් පදනම් කරගෙන කරන ලද නිරූපණ පිළිබඳව ද කරුණු සාකච්ඡා කරන්න.

  (ද්‍රව්‍ය උපයෝගී කරගෙන, අවස්ථාව හා තර්කානුකූල ව බද්ධ කර ගනිමින් අර්ථවත් අවස්ථාවක් ගොඩනැගිය යුතු බව පැහැදිලි කරදීම.)

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යෝචිත අවස්ථා තෝරා ගැනීම.
- අවස්ථාවට උචිත පරිදි චරිත යොදා ගැනීම.
- අවස්ථාවට උචිත පරිදි ද්‍රව්‍ය යොදා ගැනීම.
- රූපණ කුශලතාව ප්‍රදර්ශනය කිරීම.
- සමස්ත රංගනය සාර්ථක ව ඉදිරිපත් කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** : විවිධ ද්‍රව්‍ය පදනම් කරගෙන සමූහ හා ඒකල ව නිරූපණ කීපයක් කරන්න. (පන්තියේ සිසුන් ගණන අනුව කණ්ඩායම් කීපයකට බෙදා මෙය කළ හැක)

**අතිරේක උදව්** : විවිධ රංගන කොටස් ඇතුළත් පින්තූර පත්‍රිකා, වීඩියෝ පට

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.5 :** පවරනු ලබන ක්ෂණික නිරූපණයන් හි යෙදෙයි.

**ක්‍රියාකාරකම** : ක්ෂණික නිරූපණයේ යෙදීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- සිසුන් සාමූහික ව නිශ්චිත නිරූපණයන් හි යෙදෙයි.
- සාමූහික ව සාකච්ඡා කර අවස්ථාවන් ගොඩනගා ගැනීමට හැකියාව ලබයි.
- ඒකල ව ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි.
- සාමූහික ව කටයුතු කරයි.
- රංගන කුසලතාව, පරිකල්පනය දියුණු කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** : ක්ෂණික නිරූපණය පිණිස අවශ්‍ය තේමා සහිත තුන්ඩු කැබලි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. ඉන්පසු ඒ ඒ ශිෂ්‍ය කණ්ඩායම්වලට ''පන්ති කාමරයට සර්පයකු පැමිණීම'', ''සැක සහිත පාර්ශ්වයක් හමුවීම'' වැනි මාතෘකා ලබා දී විනාඩි 3-5 ත් අතර කාලයක් සූදානම් වීමට ලබා දෙන්න. ඉන් පසු කුසපත් ඇදීමෙන් අනතුරු ව කණ්ඩායම්වලට අනුපිළිවෙළින් ක්ෂණික නිරූපණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 02** සියලු කණ්ඩායම් ක්ෂණික නිරූපණ ඉදිරිපත් කළ පසු ඒ ඒ කණ්ඩායම්වල නිරූපණ අවස්ථාවන් පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කිරීම, සිසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීම වැදගත් ය.

**පියවර 03** සාමූහික ක්ෂණික නිරූපණයන්ගෙන් පසු ව සිසුන් ඒකල ක්ෂණික නිරූපණයන් සඳහා ද යෙදවිය යුතු යි. එහි දී මෘතෘකා කිහිපයක් අතරින් එකක් කුසපත් ඇද තෝරා ගෙන විනාඩි 5ක කාලයක් සූදානම් වීම සඳහා ගෙන ඉන් පසු ව ඉදිරිපත් කිරීමට අවකාශය සලසන්න. අවසන් වන ඒකල නිරූපණය අගය කිරීම සිදු කළ යුතු යි. සියලු සිසුන් සඳහා කාලය නොමැති බැවින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන අය සඳහා අවස්ථාව ලබා දීම සිදුකළ හැකි ය.)

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- සාමූහික ව කටයුතු කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම.
- ක්ෂණික ව රංගනයේ යෙදීම.
- පරිකල්පන හැකියාව වර්ධනය කර ගැනීම.
- අභිනය මැනවින් භාවිත කිරීම.
- නිර්මාණාත්මක ව සිදුවීම් ගොඩනැංවීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

පැවරුම : ක්ෂණික නිරූපණයකින් රංගන ශිල්පීන්ට ලබා ගත හැකි ප්‍රයෝජන ලැයිස්තුවක් සකස් කරන්න.

අතිරේක උදව් : ක්ෂණික නිරූපණ සමූහ සඳහා පහත මාතෘකා භාවිත කළ හැකි ය.
- සමූහ ඡායාරූපයකට පෙනී සිටින පෙර පාසල් සිසුන් සමූහයක්
- මනමාලයා නොපැමිණි මඟුල් ගෙදර
- රූපවාහිනියේ ක්‍රිකට් තරගයක් නැරඹීම.
- බස් රථයක් එනතුරු බස් නැවතුමේ.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.6** : නාට්‍යය අවස්ථා නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම** : අවස්ථා නිරූපණය කිරීම

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- නාට්‍යමය අවස්ථාව යනු කුමක්දැයි වටහා ගනියි.
- ප්‍රබන්ධ කතා පුවත් ඇසුරින් නාට්‍යමය අවස්ථාවක් ගොඩ නගා ගැනීම සිදු කරයි.
- සිසුන් සාමූහික ව රංග අවස්ථා ගොඩ නගයි.
- චරිත නිරූපණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : වීඩියෝ පට - සංයුක්ත තැටි

**විෂය අන්තර්ගතය** :
- ප්‍රබන්ධ කතා හෝ අත්දැකීම් ඇසුරින් නාට්‍යමය අවස්ථා නිර්මාණය කිරීම.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** නාට්‍යමය අවස්ථා නිර්මාණය පිළිබඳ ව අවබෝධයක් ලබා දීම සඳහා ''රත්තරන්'', ''හුණුවටයේ කතාව'', ''මනමේ නාටකය'', ''කැළණි පාලම'' වැනි නාටකවල නාට්‍යමය අවස්ථාවක් ප්‍රදර්ශනය කරන්න.

එහි දී එම නාට්‍යවල තෝරාගත් නාට්‍යමය අවස්ථාවල ඇති ගුණාංග පැහැදිලි කරන්න. යම්කිසි ගැටලුකාරිත්වයක් සහිත (ගැටුමක්) අවස්ථාවක් තිබීම, චරිත ප්‍රශ්නයකට මුහුණ දී තිබීම, කුතුහලාත්මක බවක් අන්තර්ගත ව පැවතීම වැනි ලක්ෂණ මේ අවස්ථාවල තිබෙන ආකාරය පෙන්වා දෙන්න.

**පියවර 02** සිසුන් කණ්ඩායම් කිරීම, ඔවුන් අසා තිබෙන ජන කතා හෝ වෙනත් ප්‍රබන්ධ කතාවක් පදනම් කරගෙන හෝ ඔවුන් හට ඇති අත්දැකීම් පදනම් කර ගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ක්ෂණික ව නිරූපණය කිරීමට අවස්ථාව සලසා දෙන්න. ගුරුවරයාගේ මැදිහත් වීමකින් තොර ව ඔවුන් විසින් ම සාකච්ඡා කර සුදුසු අවස්ථාවක් ගොඩ නගා ගැනීමට සහ එය තම කණ්ඩායම මගින් රඟ දක්වා පෙන්වීමට අවකාශය සලසන්න. සූදානම් වීම සඳහා විනාඩි 10-15ත් අතර කාලයක් ලබා දෙන්න.

**පියවර 03** රංගනය අවසන් කළ පසු සියලු කණ්ඩායම්වල රංගනයන් පිළිබඳ ව සාකච්ඡා කිරීමත්, සංවර්ධනාත්මක ලක්ෂණ හඳුනා ගැනීමත් තවදුරටත් සංවර්ධනය විය යුතු තත්ත්වයන් පෙන්වා දීමත් කළ හැකි ය. මෙහි දී සිසුන්ගේ අදහස් දැක්වීමට වැඩි අවස්ථාවක් ලබා දීම වැදගත් වේ.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගැනීම.
- නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීම.
- විවිධ කතා පුවත්වල ඇති නාට්‍යමය අවස්ථා තෝරා ගැනීම.
- අවස්ථා රූපණය කර පෙන්වීම.
- සාමූහික ව කටයුතු කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පසු වැඩ** : සිසුන් කියවා ඇති කෙටි කතා, නව කතා හෝ වෙනත් සාහිත්‍යමය කෘතියක් පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් සහිත නාට්‍ය පෙළක් නිර්මාණය කරවීම.

**අතිරේක උදව්** : ජාතක කතා, කෙටි කතා, ජන කතා

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.7** : උචිත කතාවක් ආශ්‍රයෙන් නාට්‍ය පෙළක් රචනා කර රංග ශිල්ප භාවිත කරමින් පෙළ රංගයක් බවට පත් කරයි.

**ක්‍රියාකාරකම** : නාට්‍ය පෙළක් ලියමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- ගුණාත්මක යෙදවුම්වල යොදා ගෙන ඇති චිත්‍ර / ලිපි / පුවත්පත් / ඡායාරූප ආදී අධ්‍යයනය කර නාට්‍යෝචිත අවස්ථා තෝරා ගනියි.
- පරිකල්පන ශක්තිය මෙහෙයවා නාට්‍ය නිර්මාණයෙහි යෙදෙයි.
- නාට්‍යෝචිත සංවාද ලියයි.
- පෙළ රචනයේ දී යටි පෙළෙන් මතුවිය යුතු ජීවන දෘෂ්ටිය ගැන සැලකිලිමත් වෙයි.
- පෙළට රංග විධාන ඇතුළත් කිරීමට උනන්දු වෙයි.

**ගුණාත්මක යෙදවුම්** : සමාජයේ එදිනෙදා සිදුවීම් ඇතුළත් පුවත්පත් ලිපි, විවිධ පොත්වලින් තෝරා ගන්නා ලද ලිපිවල ඡායා පිටපත්, සිදුවීම් පරිකල්පනය වර්ධනය කළ හැකි ආකාරයේ චිත්‍ර, පුවත්පත්වලින් කපා ගන්නා ලද රූප

**විෂය අන්තර්ගතය 2.7.1**: නාට්‍ය පෙළක් නිර්මාණයේ දී අනුගමනය කළ යුතු ශිල්පීය ක්‍රම අනුව නාට්‍ය පෙළක් රචනා කිරීම.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** සිසුන් කණ්ඩායම් කර ගුණාත්මක යෙදවුම්වල දක්වන ලද පුවත් ලිපි, පොත්වලින් සොයා ගන්නා ලද ඡායා පිටපත්, චිත්‍ර රූප කණ්ඩායම් සඳහා බෙදා දෙන්න. සිසුන් සමග නාට්‍යෝචිත සිද්ධීන් ගොඩ නගා ගන්නා ශිල්පීය ක්‍රම සහ නාට්‍යයකට සිද්ධීන් පෙළගස්වන ආකාරයත් සාකච්ඡා කරන්න.

**පියවර 02** 1 පියවරේ දී සාකච්ඡා කරගත් පරිදි නාට්‍ය පිටපත් ලිවීමේ දී අනුගමනය කරන ශිල්පීය ක්‍රම භාවිත කරමින් නාට්‍ය නිර්මාණය සඳහා චිත්‍ර / පුවත්පත් ලිපි / ඡායා පිටපත් රූප යොදා ගන්න.

**පියවර 03** කණ්ඩායම් සියල්ලගේ ම නාට්‍ය පිටපත් එකතු කර කණ්ඩායම් මාරු කර කියවා ගැනීමට සලස්වන්න. එම කණ්ඩායම්වලට ලැබුණු නාට්‍ය පිටපත කියවා නිර්මාණාත්මක අදහස් සිසුන් සමග සාකච්ඡා කර පිටපතේ අඩුපාඩු සකස් කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කණ්ඩායම් සඳහා දී ඇති ගුණාත්මක යෙදවුමට අනුව / නාට්‍යෝචිත සිද්ධීන් තෝරා ගැනීම
- තෝරා ගන්නා ලද නාට්‍යෝචිත අවස්ථා සඳහා සංවාද ගොඩ නැගීම
- නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැගීමට අදාළ චරිත තෝරා ගැනීම
- රංග විධාන භාවිත කිරීම
- නාට්‍ය සාමූහික ක්‍රියාවලියක් බව අවබෝධ කර ගනිමින් නාට්‍ය පෙළ ලිවීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** : කණ්ඩායම විසින් කරන ලද නිර්මාණය ආදර්ශ කරගනිමින් තමන් විසින් සොයා ගන්නා ලද පුවත්පත් ලිපි / චිත්‍ර / කියවන ලද පොතක සිදුවීමක් / ඡායාරූප ඇසුරු කර නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න.

**අතිරේක උදව්** : සාර්ථක නාට්‍ය පිටපත්

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.7** : උචිත කතාවක් ආශ්‍රයෙන් නාට්‍ය පෙළක් රචනා කර රංග ශිල්ප භාවිතා කරමින් පෙළ රංගයක් බවට පත් කරයි.

**ක්‍රියාකාරකම** : නාට්‍යයක් රඟ දක්වමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :
- නාට්‍ය පෙළ අවබෝධයෙන් යුතු ව කියවයි.
- නිෂ්පාදනයට සුදුසු නාට්‍ය පිටපතක් තෝරා ගනියි.
- නාට්‍ය පෙළට අදාළ භූමිකා සඳහා නළු නිළියන් තෝරා ගනියි.
- ආනුෂංගික ශිල්ප අංගයන් භාවිත කරයි.
- නාට්‍ය පිටපත් සාමූහික ක්‍රියාවලියකින් රංගයන් බවට පත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නාට්‍ය නැරඹීමට අවස්ථාව ලබා දීම.
- නාට්‍ය නිර්මාණ ඇතුළත් CD, DVD (සංයුක්ත තැටි) පට නැරඹීම.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- ගුණාත්මක යෙදවුම් භාවිතා කර (සංයුක්ත තැටි) නාට්‍ය නැරඹීමට සිසුන්ට අවස්ථා ලබා දීමෙන් පසු ලියන ලද නාට්‍ය පිටපත් අතුරින් නිෂ්පාදනයට සුදුසු ම නාට්‍ය පිටපත තෝරා ගන්න.

  නිෂ්පාදනයට අවශ්‍ය පුහුණුව, නළු නිළියන් තෝරා ගැනීම. ආනුෂංගික ශිල්ප අංගයන් පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කර ඒ සඳහා විශේෂ කුශලතා ඇති සිසුන් කණ්ඩායම් කරන්න. (රංග භාණ්ඩ, පසුතල නිර්මාණ, අංග රචනය, වස්ත්‍ර නිර්මාණය සඳහා දක්ෂ විශේෂ කුශලතා ඇති සිසුන්) පුහුණු කාල සීමාවක් පිළිබඳ දැනුවත් කරන්න.

**පියවර 02**
- උපදෙස් මත පුහුණු කරන ලද නාට්‍ය නිම කිරීම සඳහා පාසල් වේදිකාව හෝ එළිමහන් ස්ථානයක් යොදා ගන්න. (උදය රැස්වීම හෝ අනෙක් සිසුන් ප්‍රේක්ෂකයන් ලෙස යොදා ගෙන නාට්‍ය පෙන්වන්න).

**පියවර 03**
- පෙන්වන ලද නාට්‍ය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න. නිෂ්පාදනයේ දී නාට්‍ය පිටපතේ සිට වේදිකාව දක්වා කාර්යය සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- නිෂ්පාදනය සඳහා සුදුසු නාට්‍ය පිටපතක් තෝරා ගැනීම.
- නාට්‍ය පිටපතට සුදුසු භූමිකා සඳහා නළුවරණයකින් නළුනිළියන් තෝරා ගැනීම.
- ආනුෂංගික ශිල්පීය අංග ක්‍රම භාවිත කරමින් කැමැත්තෙන් නිර්මාණ සැලසුම් කිරීම.
- නාට්‍ය පෙළ සාමූහික රංගනයක් බවට අවබෝධ කර ගැනීම.
- සමස්ත රංග කාර්ය සංවිධානය කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** : කණ්ඩායම් වශයෙන් ලියන ලද නාට්‍ය පිටපත් රංගයන් බවට පත් කරන්න.

**අතිරේක උදව්** : සාර්ථක නාට්‍ය නිර්මාණ

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකමෙහි නියැලෙයි.

**නිපුණතා මට්ටම 3.1** : රංග අභ්‍යාසවල නිරත වෙයි.

**ක්‍රියාකාරකම 3.1.1** : ශ්වසනය / හුස්ම ගැනීම, පිට කිරීම

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :
- හොඳින් හුස්ම ගැනීම සහ පිට කිරීම කරයි.
- ආශ්වාසය සහ ප්‍රශ්වාසය රිද්මයකට අනුව සිදු කරයි.
- හුස්ම යම් වේලාවක් රඳවා තබා ගැනීම සිදු කරයි.
- හඬ පාලනය කිරීමේ හැකියාව ලබයි.

**ගුණාත්මක යෙදවුම්** :

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන ගොස් වෘත්තාකාර ව සිට ගැනීමට සලස්වා ඉන් පසු රවුමේ තරමක් වේගයෙන් ඒ මේ අතට දිවීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 02**
- දිවීම නවතා රවුමේ නැවතී හුස්ම ගැනීමට සලස්වන්න.
- දෑස් පියා ගෙන පහසුවෙන් සිට ඉතා හොඳින් නාසයෙන් හුස්ම ගැනීම ස්වල්ප වේලාවක් රඳවා තබා ගැනීම සහ පිට කිරීම. මෙය වාර කිහිපයක් කරකවන්න.
- දීර්ඝ හුස්ම ගැනීම – සෙමින් පිට කිරීම
- සෙමින් හුස්ම ගැනීම – වේගයෙන් පිට කිරීම
- නාසයෙන් හුස්ම ගැනීම – කටින් පිට කිරීම
- අත් ඔසවමින් හුස්ම ගැනීම යන ක්‍රියාකාරකම්වල යොදවන්න.

**පියවර 03**
- හුස්ම ගැනීම සහ පිට කිරීමේ දී හඬක් නැගෙන ලෙස සිදු කිරීමට උපදෙස් දෙන්න.
- ආ, ස, ර, ල වැනි ශබ්ද නැගෙන අයුරින් හඬ පිට කිරීමටත්
- හඬ පිට කිරීමේ දී එයට ගැළපෙන ලෙස අංග චලනයන් ද යොදා ගැනීමටත්
- අම්මෝ, දෙවියනේ, කොහෙදෝ වැනි වචන භාවිත කරමින් හුස්ම පිට කිරීමටත්, සීසාන විට නගන හඬ ආදී හඬවල් නැගීමටත් සලස්වන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- සංවාද කොටස් හඬ නගා කියවීම
- වචන නිරවුල් ව හා පැහැදිලි ව ප්‍රකාශ කිරීම
- අවශ්‍ය ප්‍රමාණයට හුස්ම රඳවා තබා ගනිමින් සංවාදය ඉදිරිපත් කිරීම
- සංවාද කොටසේ හැඟීම ඉස්මතු වන අයුරින් හඬ භාවිත කිරීම
- හුස්ම පරාසයන් අඩු වැඩි කරමින් එකම සංවාදය ඉදිරිපත් කිරීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** : ගුරුවරයා විසින් තීරණය කරන ලද නාට්‍ය පිටපත්වල තරමක දිගු දෙබස් ඛණ්ඩ කිහිපයක් විවිධ පරාසයන් යටතේ කියවීම.

**අතිරේක උදව්** : විවිධ සතුන් ගේ ආශ්වාස ප්‍රශ්වාස රටාවන් අධ්‍යයනය කිරීම.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකමෙහි නියැලෙයි.

**නිපුණතා මට්ටම 3.1** : රංග අභ්‍යාසවල නිරත වෙයි.

**ක්‍රියාකාරකම 3.1.2** : සංවේදන අභ්‍යාසවල යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :

- ඇස, කන, දිව, නාසය, ශරීරය මනස යන ඉන්ද්‍රියයන්හි ක්‍රියාකාරිත්වය වෙන් වෙන් ව වටහා ගනියි.
- නිරූපණ කාර්යයේ දී ඒ ඒ ඉන්ද්‍රියයන් මූලික කරගෙන අදහස් ඉදිරිපත් කරයි.
- හැඟීම් සහ අදහස් නිරූපණයට අදාළ වන අයුරින් ඒ ඒ ඉන්ද්‍රියයන් ක්‍රියාත්මක කරවීමේ හැකියාව ලබයි.
- හැඟීම් නිරූපණ ක්‍රියාවලිය වඩාත් සාර්ථක ව සිදු කිරීමට හැකි වෙයි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- සිසුන් එළිමහන් ඉඩකඩ ඇති අවකාශයකට ගන්න. අවකාශය පුරා විසිරී යන සේ ඒ මේ අත ඇවිදීමට සලස්වන්න. සියලු දෙනාම අවකාශයේ එක් පසකට රොක් කරන්න. අඩි තුනක පමණ ලී කැබැල්ලක් ඔවුන් ඉදිරියේ තබන්න.

  ඉන් පසු සියලු දෙනාගේ ම ඇස් ලී කැබැල්ල වෙත යොමු කරවන්න. ගුරුවරයා එම ලී කැබැල්ල ඉහළට එසවීම, විවිධ පැතිවලට හැරවීම සිදු කරන විට ඔවුන් ඇස්වල සම්බන්ධතාවය රැක ගනිමින් ම ඒ අනුව චලනය වීමට සලස්වන්න. ලී කැබැල්ල ඔවුන්ට ළං කිරීම ඈත් කිරීම ආදිය කරමින් ඔවුන් ගේ දෙනෙත් විවිධ පැතිවලට චලනය කරවන්න.

- කණ්ඩායමේ සියලු දෙනාගේ ම ඇස් තමන් සිටින තැන සිට ක්‍රමක්‍රමයෙන් නැරඹිය හැකි වැඩි ම දුර දක්වා යොමු කරවන්න.

  නැරඹිය හැකි වැඩි ම දුර ප්‍රමාණය දෙස විනාඩියක් පමණ බලා සිටින්න. ඉන් පසු ක්‍රමක්‍රමයෙන් එම දුර ප්‍රමාණයේ සිට තමන් සිටින තැන දක්වා ඇස් යොමු කරවන්න.




**පියවර 02** කන පිළිබඳ සංවේදන අභ්‍යාස

- කණ්ඩායම් සියලු දෙනාම අවකාශය තුළ රවුමට වාඩි කරවන්න. දෑස් පියා ගැනීමට හරින්න. තමා අවටින් ඇසෙන හඬවල් පිළිබඳ අවධානය යොමු කරවන්න. කන සමීපයෙන් ඇසෙන ශබ්ද සඳහා අවධානය යොමු කරවන්න. විනාඩි කිහිපයක් පුරා මෙසේ විවිධ ශබ්ද සඳහා අවධානය යොමු කරන්න. ඒවා හඳුනා ගන්න. අවසානයේ ඒ පිළිබඳ ව ඔබ ලත් අත්දැකීම් අන් අය සමග සාකච්ඡා කරන්න.

- සිසුන් නැවත රවුම තුළ වාඩි කරවන්න. දෑස් පියා ගන්නට සලස්වන්න. ගුරුවරයා විසින් කලින් සකසා ගන්නා ලද ද්‍රව්‍ය කිහිපයකින් හෝ කැසට් රෙකෝඩරයකින් විවිධ ශබ්ද රැසක් නිකුත් කිරීම සහ අවසානයේ සිසුන්

ඒ ශබ්ද නම් කිරීම. එහි දී ශබ්ද හඳුනා ගැනීම සහ ඒවා මතක තබා ගැනීමට ඔවුහු යොමු වෙති.

උදා: කාසියක් බිමට වැටීමට ඉඩ හැරීම
සපත්තු හඬ
ජනේලයක් හෝ දොරක් ඇරෙන හඬ

**පියවර 03** නාසය සම්බන්ධ සංවේදන අභ්‍යාස

- කණ්ඩායමේ සියලු දෙනා ම අවකාශය මධ්‍යයේ රඳවන්න. සියලු දෙනාට ම දෑස් පියා ගැනීමට හරින්න. කණ්ඩායමේ එක් අයෙකු කණ්ඩායමින් ඉවත් ව සුවඳ විලවුන් පුළුන් කැබැල්ලකට ගෙන අවකාශයේ යම් ස්ථානයක ස්ථාන ගතවන්න. දෑස් පියාගත් සිසුන් පුළුන් කැබැල්ල අතැති යහළුවා සිටින ස්ථානය සුවඳ ඔස්සේ සොයා ගත යුතු යි. (අවංක ව දෑස් පියාගෙන මෙම ක්‍රියාකාරකම කළ යුතු යි)
- සිසුන් අවකාශයෙන් පිටත රඳවා ගුරුවරයා අවකාශයේ ස්ථාන තුනක සුවඳ විලෙවුන් හෝ වෙනත් සුදුසු ආඝ්‍රාණය කළ හැකි ද්‍රව්‍ය තවරන්න. ඉන් පසු සිසුන්ට එම අවකාශයට පැමිණ එම ස්ථානය සොයා ගැනීමට ඉඩ හරින්න. නිවැරදි ව පළමු ව අදාළ ස්ථාන සොයා ගන්නා සිසුවා අගයන්න.

**පියවර 04** දිව සම්බන්ධ සංවේදන අභ්‍යාස

- මෙම අභ්‍යාසය පන්ති කාමරය තුළ ම හෝ පිටත ස්ථානයක ද සිදුකළ හැකි ය. කලින් තීරණය කර ගත් පරිදි ගුරුවරයාගේ මැදිහත් වීමෙන් දෙහි, ලුණු කැට, ටොෆි, කොහොඹ කොළයක් වැනි පහසු ද්‍රව්‍ය කිහිපයක් ලබා ගන්න. සෑම කොටසකින් ම ද්‍රව්‍ය සිසුන්ට ලබා දෙන්න. ගුරුවරයා නම් කරන ඒ ඒ ද්‍රව්‍ය සියලු දෙනා ම හපන අතර එවිට මුහුණේ සිදුවන වෙනස්කම්වල ඉරියව් පරීක්ෂා කරන්න. සියලු ද්‍රව්‍ය භාවිත කරමින් සිසුන් කණ්ඩායම තමන් තුළ සිදුවන වෙනස සහ අනෙකාගේ වෙනස වටහා ගැනීමට සලස්වන්න. ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න. මේ අනුව දිවට දැනෙන විවිධ රස අනුව මුහුණේ ඉරියව් හා චර්යාවන් වෙනස්වන අයුරු වටහා දීමත් එය රංගනයේ දී ප්‍රයෝජනවත් වන අයුරුත් වටහා ගැනීමට සලස්වන්න.

**පියවර 05** සිරුර සම්බන්ධ සංවේදන අභ්‍යාස

- ගුරුවරයා පන්ති කාමර මේසය මත හෝ රංග අභ්‍යාස සිදුකරන වෙනත් ස්ථානයක හෝ සිසුන්ට නොපෙනෙන ලෙස සෙල්ලම් බඩු (සත්ව රූප සහ වෙනත්) කිහිපයක් ගෙනවිත් සිසුන්ගෙන් වසන් කොට තබා එක් එක් සිසුවාගේ දෙනෙත් වසා සෙල්ලම් බඩු තිබෙන ස්ථානයට පැමිණ අහඹු ලෙස යමක් රැගෙන එය ස්පර්ශ කොට අවබෝධ කරගත් පසු නම ප්‍රකාශ කිරීමට සලස්වන්න.

**පියවර 06** මනස සම්බන්ධ සංවේදන අභ්‍යාස

- කණ්ඩායමේ සියලු දෙනාට ම හිස් අවකාශයෙහි සැහැල්ලුවෙන් ඇවිදින්නට හරින්න. වේගයෙන් හා සෙමින් ඇවිද අවසානයේ රවුමක් සිටින සේ වාඩි කරවන්න. දෙනෙත් පියා ගැනීමට සලස්වන්න. ඉන් පසු ගුරු විධානයට අනුව එම දින උදෑසන පිබිදීමේ සිට මෙම ක්‍රියාකාරකම කරන මොහොත දක්වා සිදු වූ සියලු දෙය ආවර්ජනා කරවන්න. සියල්ල ආවර්ජනය කළ පසු දෑස් විවර කරන්න. ඒ පිළිබඳ ව සාකච්ඡා කරමින් ලද අත්දැකීම් විස්තර කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විවිධ ශබ්ද හඳුනා ගැනීම.
- දුර සහ ළඟ පෙනෙන දේ වෙන් වෙන් ව ප්‍රකාශ කිරීම.
- ඇසෙන සහ පෙනෙන දේ හඳුනා ගැනීමට, අවබෝධ කර ගැනීමට ක්‍රියා කිරීම.
- සාමූහික ව සහ තනි තනි ව කටයුතු කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම.
- තොරතුරු නිවැරදි ව සහ මනාව වගු ගත කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** : පන්ති කාමරය තුළ සිටින සියලු සිසුන්ට පළමු ව පහත ආකාරයේ වගුවක් කොළයක සකස් කර ගැනීමට අවස්ථාව දෙන්න.

| අංක | ළඟින් ම ඇසෙන ශබ්ද | දුරින් ම ඇසෙන ශබ්ද | දුරින් ම පෙනෙන දේ | ළඟින් ම පෙනෙ දේ |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |

පසු ව පන්ති කාමරයෙන් පිටත නොගොස් පන්ති කාමරයේ තමන් සිටින ස්ථානයේ සිට ළඟින් ම සහ දුරින් ම ඇසෙන ශබ්ද පෙනෙන දේ හඳුනා ගෙන වගුගත කිරීමට සලස්වන්න. ඒ සඳහා විනාඩි 10 ක වැනි කාලයක් ලබා දෙන්න.

**අතිරේක උදව්** : 1. රංග අභ්‍යාසවල නිරත වීම
2. නිර්මාණකරණයේ නිරත වීම

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.1** : රංග අභ්‍යාසවල නිරත වෙයි.

**ක්‍රියාකාරකම 3.1.3** : ශිථිලකරණ අභ්‍යාසවල යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ශරීරාංග සැහැල්ලු කිරීමට හැකියාව ලබයි.
- මානසිකව ද සැහැල්ලුවක් ලබයි.
- රංගනයේ දී කායික සහ මානසික සැහැල්ලුව ඇති කර ගනියි.
- චිත්ත ඒකාග්‍රතාවකින් යුතු ව කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඉටිපන්දමක්, ගිනිපෙට්ටියක්
- හිම කන්දක ඡායාරූපයක්
- අයිස්කැට කිහිපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. ඔවුන් කිහිප දෙනෙකු අතට අයිස් කැටයක් ලබා දෙන්න. එය එක් එක් අය අත මාරු කරමින් අත් විඳීමට ඉඩ සලස්වන්න.
- ඉටිපන්දමක් දල්වා එහි ක්‍රියාකාරිත්වය ද ඒ මොහොතේ ම අධ්‍යයනය කිරීමට ඉඩ සලස්වා දෙන්න.
- හිම කන්දක ඡායාරූපය ද පෙන්වන්න. හිමෙහි සිදු වන ක්‍රියාකාරිත්වය පිළිබඳ ව සාකච්ඡා කරන්න. එම ක්‍රියාකාරිත්වය හේතුවෙන් එම ද්‍රව්‍යයන්හී ඇති දැඩි ගතිය ක්‍රමයෙන් ඉවත් වී සැහැල්ලු වී යන ආකාරය සාකච්ඡා කරන්න.

**පියවර 02**
- සිසුන් හිස් අවකාශයකට රැගෙන යන්න. අවකාශය වටා රවුමකට සිටුවන්න. සැහැල්ලුවෙන් රවුම වටා ඇවිදින්නට ඉඩ ලබා දෙන්න. මුලින් ම දෙ අත් සැහැල්ලු කර ඇවිදීමට යොමු කරන්න.
- ඇවිදීම නවත්වන්න. රවුම වටා පහසුවෙන් සිටගන්වන්න. අත් ඉහළට ඔසවා පසුව නිදහසේ පහළට දැමීමට සලස්වන්න. හිස, බෙල්ල, පපුව, උදරය, ඉන, දනිස්, පාද ආදිය ක්‍රමානුකූල ව සැහැල්ලු කරවන්න.
- පේශීන් දැඩි කරමින් ද, ලිහිල් කරමින් ද අත් පා ආදිය ලිහිල් වන අයුරු අවබෝධ කරවන්න.

**පියවර 03**
- සිසුන් අවකාශය පුරා විසිරුවා තබන්න. දෑස් පියාගන්න ඉඩ දෙන්න. ගුරු විධානයට අනුව ක්‍රියා කළ යුතු බව පවසන්න .
- දැන් මේ සිටින සියලු දෙනා හිම කන්දක් මෙන් යැයි සිතන්නැයි පවසා හිම කන්දක් දිය වී යනවාසේ හිසෙහි සිට ක්‍රමයෙන් ශරීරාංග ලිහිල් කිරීමට අවශ්‍ය ගුරු විධානයන් ලබා දෙමින් ශරීරාංග සියල්ල ලිහිල් කරවන්න.

අභ්‍යාසයේ දී සිරුර සම්පූර්ණයෙන් ම සැහැල්ලු වූ අවස්ථාවේ දී සියලු ම සිසුන්ට බිම දිගාවීමට ඉඩකඩ සපයාදීම කරන්න. සිරුර

සම්පූර්ණයෙන් ම සැහැල්ලු වී ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා එක් සිසුවෙකු ගේ අතක් සහ පයක් පරීක්ෂා කර බැලීම කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ගුරු භවතා විසින් ඉදිරිපත් කරනු ලබන සිද්ධිය වටහා ගැනීම.
- එය ශාරීරික ව නිර්මාණය කිරීම.
- අවකාශය භාවිත කරමින් ක්‍රමානුකූල ව ආරම්භ කර වර්ධනය කර නිමා කිරීම.
- ශරීරාංග සැහැල්ලුවෙන් භාවිත කිරීම.
- ක්‍රියාවලියේ සමස්තය ඇගැයීමට ලක් කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

පැවරුම :

- ළමුන් විශාල සංඛ්‍යාවක් සිටීනම් කණ්ඩායම් වශයෙන් හෝ සුළු සංඛ්‍යාවක් නම් තනි තනිව ද ඉදිරිපත් කළ හැකි ය.
- ඔබ නෙළුම් ඇටයක් යැයි සිතා, නෙළුම් ඇටයක් පැළවී මතු වී මලක් බවට පත් වී නැවත එය පෙති හැලී පරවී යෑම නිරූපණය කරන්න.

**අතිරේක උදව්** :

- රංග අභ්‍යාසවල නැවත නැවත යෙදීම.
- නාට්‍ය නිර්මාණවලට යොමුවීම

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.1** : රංග අභ්‍යාසවල නිරත වෙයි.

**ක්‍රියාකාරකම 3.1.4** : චිත්ත ඒකාග්‍රතාව ඇති කරන අභ්‍යාස

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- චිත්ත ඒකාග්‍රතාව ඇතිකර ගැනීමට හැකියාව ලබයි.
- චිත්ත ඒකාග්‍රතාව තුළින් ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- රංගනය චිත්ත ඒකාග්‍රතාවකින් යුක්ත ව සිදුකරයි.

**ගුණාත්මක යෙදවුම්** : අදාළ සංගීත ඛණ්ඩ සහ ශබ්ද

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- සිසුන්ට නිදහස් අවකාශයක ඇවිදීමට ඉඩ සලස්වන්න. ඇවිදන අතර සංගීත ඛණ්ඩයක් ඇසීමට අවස්ථාව සලසන්න. සංගීත ඛණ්ඩය අසමින් එම රිද්මය මනසෙහි රඳවා ගෙන ඇවිදීමට අවස්ථාව දෙන්න.

පියවර 02
- සංගීත ඛණ්ඩය හා මානසික ව බැඳෙන අයුරින් අවකාශය පුරා ඇවිදීමට ඉඩ සලසා එම සංගීත ඛණ්ඩය හා අවධානයෙන් යුතුව ම ගුරු විධානයන්ට ද සවන් දෙන්න.

"ඔබ දැන් ඇවිදින්නේ ලස්සන මල් පිපිණු මල් වත්තක, කුරුලු නාද ඇසේ. සමනලයෝ පියාඹති. ඔබ ඒවා දකියි. සමනලයෙක් අල්ලන්න හදයි. මලක සුවඳ විඳී. (මේ ගුරු විධානයට අනුව සංගීත නාදය හා ඒකාත්මක වෙමින් ද නිරූපණය කරවන්න.) මල් උයනේ ඇවිදින ඔබට හිසට ඉහළින් සෑදී ඇති මිදි පොකුරු පෙනේ. මේ රසවත් මිදි ගෙඩි කඩාගන්නට ඔබ උත්සාහ දරයි. පොරකයි. ගෙඩි කඩා ගනී. රස බලයි. දැනෙන හැඟීම් තාත්ත්වික ව සහ වාචික ව පළ කරන්න.

සංගීත නාදය වෙනස් වේ. එය භයානක ස්වභාවයක් ගනී. (විශාල සුළඟක්, වැස්ස වැනි ශබ්ද යොදා ගත හැක) ඔබ කලබල වේ. ඒ මේ අත දුවයි. සැඟවෙන්න උත්සාහ කරයි. සියලු දෙනා ම එකට ගුලිවෙමින් අවකාශයේ තැන් තැන්වලට රොක්වෙති.'' (සංගීත ඛණ්ඩයේ ශබ්දය ක්‍රමයෙන් අඩු කරන්න.) තම අභිමතය පරිදි සිසුන් කරන ක්‍රියාව වෙනස් කළ හැකි ද වේ.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විවිධ චලනයන් ඉදිරිපත් කිරීම.
- වාදනය වන සංගීත ඛණ්ඩය හා සම්බන්ධ ශාරීරික චලනයන් මනස සමඟ බැඳී ඉදිරිපත් කිරීම.
- අවකාශය සුදුසු පරිදි භාවිත කිරීම.
- නිර්මාණාත්මක චලන රටා ඉදිරිපත් කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

පැවරුම :
- විවිධත්වයෙන් යුතු සංගීත ඛණ්ඩයන් ඇසීමට සැලැස්වීම. එම සංගීත ඛණ්ඩය ශ්‍රවණය කරමින් ම ක්‍රමයෙන් එයට ගැළපෙන චලන ක්‍රියාකාරකම් එකතු කිරීම.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.1** : රංග අභ්‍යාසවල නිරත වෙයි.

**ක්‍රියාකාරකම 3.1.5** : කටහඬ අභ්‍යාස

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- විවිධ හඬ පරාසයන් යටතේ සංවාද ඉදිරිපත් කරයි.
- නිරවුල් ව සහ මැනවින් හඬ ප්‍රක්ෂේපනය කරයි.
- හැඟීම් ප්‍රකාශ වන අයුරින් හඬ හසුරුවයි.
- නාට්‍යෝචිත කට හඬක් භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නාට්‍ය පිටපත් කිහිපයක්
- සිංහල ඉංග්‍රීසි අකුරු සහිත කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01** සියලු සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. එම අවකාශය පුරා විසිරී ඇවිදින්නට සලස්වන්න. වේගයෙන් සෙමින් යන ආදී වශයෙන් විනාඩි කිහිපයක් ඇවිද්ද පසු එකිනෙකා හා ස්පර්ශ නොවන අයුරින් පහසුවෙන් දුරින් දුර සිටින්න.

පහසුවෙන් සිට අත් දෙක ද පහළට යොමු කර තරමක් නැමී හොඳින් හුස්ම ගන්න. ඒ හා සමග අත් දෙක ඉහළට ඔසවමින් හුස්මින් උදරය පුරවා ගන්න. ස්වල්ප වේලාවක් රඳවා තබාගෙන ක්‍රමයෙන් මුවින් ආ/ඕ/ලා/ වැනි හඬක් නිකුත් කරමින් හුස්ම පිට කරන්න. මෙය කිහිප වරක් සිදු කරන්න.

**පියවර 02** හොඳින් ආශ්වාස කර උදරය පුරවා ගන්න. ඉන්පසු උගුර ස්පර්ශ වන සේ ඉහත හඬවල් පිට කරන්න. ඒ ආකාරයට උඩුතල්ල, තොල්, දිව, දත්, නාසය ස්පර්ශ වන සේ හඬ පිට කිරීම් සිදු කරන්න. එක් ඉන්ද්‍රිය කොටසක් මුල් කරගෙන වාර කිහිපයක් අභ්‍යාසය සිදුකරන්න.

**පියවර 03** ගුරුවරයා විසින් සකස් කළ සිංහල ස්වර අක්ෂරමාලාව සහිත කාඩ්පත් කිහිපයක් ළමුන් කණ්ඩායම් කර ලබා දෙන්න. ඒවා සෙමින් හඬ නගා කියවීමට යොමු කරන්න. ඊට අමතර ව ඉංග්‍රීසි ස්වර අකුරු කාඩ්පත් ද භාවිත කර මේ අභ්‍යාසය ප්‍රගුණ කරන්න. (ඉතාමත් ඈත සිටින අයට ඇසෙන සේ හඬ නැගීම, මධ්‍යම ප්‍රමාණයේ හඬකින් සහ ඉතාමත් සෙමින් ආදී විවිධ පරාසයන් ඔස්සේ හඬ නැගෙන ලෙස කියවීම)

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- නිවැරදි වාග් මාලාව අනුගමනය කිරීම
- නම් කරන භාවයට අදාළ නිරූපණයෙහි යෙදීම
- නිවැරදි ව හඬ පාලනය කිරීම
- තාලානුකූල ව නිරූපණයෙහි යෙදීම
- නිර්මාණාත්මක ලෙස විවිධ ශබ්ද අනුකරණය කිරීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** :
- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා ඔවුන් කැමති වර්තමානයේ ජනප්‍රිය සරල ගීතයක් තෝරා ගැනීමට අවස්ථාව දීම. එය දුකින්, සතුටින්, බියෙන්, තරහෙන් යන භාවයන් ප්‍රකාශ වන අයුරින් ගායනය කරවීම.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.2** : නිර්දිෂ්ට පෙළ ඇසුරින් විවිධ චරිත නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම 3.2.1** : "පෙළ කියවමු"

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :

- නාට්‍යධර්මී ශෛලියට අනුව පෙළ කියවයි.
- නිර්දිෂ්ට පෙළට අයත් කතා වස්තුව, එහි රචකයා, ශෛලිය, තේමාව ආදී කරුණු සාකච්ඡා කරයි.
- පෙළ කියැවීමේ දී රංගවිධාන, විරාම ලක්ෂණ ආදියෙහි ඇති වැදගත්කම ප්‍රකාශ කරයි.
- චිත්තරූප මැවෙන අයුරින් පෙළ කියවයි.
- නාට්‍ය පෙළෙහි එන සංවාද ආශ්‍රයෙන් චරිත ස්වභාවය, මෙන් ම එහි ජීව ගුණය ද ඉගෙන ගනියි.
- නාට්‍ය පෙළ කියවා රස විඳියි.
- විවිධ උච්චාරණය විධි පුහුණු වෙයි.

**ගුණාත්මක යෙදවුම්** : දික්තල – කාලගෝල නාට්‍ය පෙළ හා සංයුක්ත තැටියක්

- පොතේ ගුරු – බහුබූත කෝලම දක්වා
- පොතේ ගුරු – දික්පිටියා හමුවීම තෙක්
- පොතේ ගුරු – දික්පිටියා හා දික්තලා ගඟෙන් එගොඩවීම දක්වා
- මහෞෂධ පඬිතුමා වෙත යාම දක්වා
- නඩු විසඳීම හා එතැන් සිට අවසානය දක්වා වෙන් වෙන් ව කොටස් කර ගත් පිටපත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- දික්තල කාලගෝල නාට්‍ය පෙළ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. එම නාට්‍යයේ රචකයා, නාට්‍ය නිර්මාණය කළ කාල වකවානුව, නාට්‍යයේ ශෛලිය, නාට්‍යයට පාදක වූ කතා වස්තුව, එහි නව සංකල්ප, තේමාව ගැටුම් අවස්ථා, සංවාදවල ප්‍රබල බව හා විවිධත්වය, චරිත නිර්මාණය, අවස්ථා නිරූපණය සඳහා යොදා ගෙන ඇති උපක්‍රම ආදිය පිළිබඳ ව සිසුන්ට අවබෝධයක් ඇති වන ආකාරයෙන් මෙම සාකච්ඡාව මෙහෙයවන්න.

**පියවර 02**

- දික්තල – කාලගෝල නාට්‍යයේ කොටසක් සංයුක්ත තැටි ආධාරයෙන් සිසුන්ට නැරඹීමට අවස්ථාව ලබා දෙන්න. නොඑසේ නම් කලින් පුහුණු කරගත් සිසුන් මඟින් පෙළ කොටසක් නාට්‍ය ධර්මී ශෛලියට අනුව ඉදිරිපත් කරවන්න.

**පියවර 03**

- පන්තියේ සිසුන් කණ්ඩායම් 6 කට බෙදන්න. සූදානම් කර ඇති පෙළ කොටස් එම කණ්ඩායම්වලට ලබා දී ශබ්ද නගා කියැවීම සඳහා පුහුණු වීමට සුදුසු කාල සීමාවක් ලබා දෙන්න. ඉන්පසු තම කණ්ඩායමට ලැබුණු කොටස අර්ථාන්විත ව ඉදිරිපත් කිරීම සඳහා එම කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යධර්මී ශෛලියට අනුව පෙළ කියවීම
- චරිතවලට උචිත අයුරින් උච්චාරණය කිරීම
- චිත්තරූප මැවෙන අයුරින් පෙළ කියවීම
- චරිත ස්වභාවය හා ජීව ගුණය විදහා දක්වෙන අයුරින් සංවාද භාවිත කිරීම
- රංග විධාන, විරාම ලක්ෂණ අනුගමනය කරමින් වාච්‍යාර්ථය හා ව්‍යංග්‍යාර්ථ ඉස්මතු වන සේ පෙළ කියවීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පසු පැවරුම** : නාට්‍යධර්මී ශෛලියෙන් ලියැවුණු නාට්‍ය 05ක් හඳුන්වා දෙමින්, එම එක් එක් නාට්‍යයේ චිත්තරූප මවා ගනිමින් කියවිය හැකි ඔබ කැමති කොටස් පිටපත් කර දක්වන්න.

**අතිරේක උදව්** : නාට්‍යධර්මී ශෛලියට අනුව රචනා කරන ලද නාට්‍ය පෙළ කීපයක් සාකච්ඡා කරන්න.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.2** : නිර්දිෂ්ට පෙළ ඇසුරින් විවිධ චරිත නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම 3.2.2** : "සංවාද භාවිත කරමු"

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- නාට්‍යධර්මී ශෛලියට අනුව සංවාදයේ යෙදෙයි.
- භාවයන් ප්‍රකට වන අයුරින් සංවාදයේ යෙදෙයි.
- සංවාදයේ යෙදීමේ දී උච්චාරණ විලාසය හා හඬ පාලනය පිළිබඳ ව සැලකිලිමත් වෙයි.
- චරිතයට උචිත අයුරින් එහි ජීවගුණය රැකෙන අයුරින් සංවාදයේ යෙදෙයි.
- රංගයට උපකාරී වන අයුරින් සංවාද හසුරුවයි.

**ගුණාත්මක යෙදවුම්** :
- දික්තල – කාලගෝල නාට්‍යයේ සංයුක්ත තැටියක්
- 3.2.1 ක්‍රියාකාරකමට අදාළ ව සකස් කර ගන්නා ලද පෙළ කොටස්
- දික්තල කාලගෝල නාට්‍ය පෙළ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** සංයුක්ත තැටිය ආධාරයෙන් දික්තල – කාලගෝල නාට්‍යයේ කොටසක් නැරඹීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. (3.2.1 ක්‍රියාකාරකමට අදාළ ව ප්‍රදර්ශනය කළ කොටස නොව වෙනත් කෙටසක් මෙම ක්‍රියාකාරකමේ දී ප්‍රදර්ශනය කරන්න).

**පියවර 02** ඒ ආශ්‍රයෙන් එම සංවාදවල විශේෂ ලක්ෂණ සාකච්ඡා කරන්න. නාට්‍යයක් ඉදිරියට ගලා යන්නේ සංවාද මඟින් වීම. පැහැදිලි උච්චාරණය රංගයට උපකාරී වීම. චරිත ස්වභාවය, සිද්ධි හා අවස්ථා මතු කිරීම. චරිතය ප්‍රේක්ෂකයා වෙත සමීප කරවීම. චරිතයේ ජීවගුණය ඉස්මතු කිරීම, භාව ප්‍රකාශනය, චිත්ත රූප මතු කිරීම ආදී ගුණාංග රැක ගැනීම කෙරෙහි සංවාද භාවිතයේ දී අවධානය යොමු කිරීමේ වැදගත්කම මෙම සාකච්ඡාවේ දී අවධාරණය විය යුතු ය.

**පියවර 03** සිසුන් කණ්ඩායම් 6 කට බෙදන්න. සකස් කර ඇති පෙළ කොටස් කණ්ඩායම්වලට ලබා දෙන්න. පෙළ නොබලා, භාවිත කළ හැකි වන ලෙස සංවාද මතකයෙන් කීම සඳහා පුහුණු වීමට අවශ්‍ය කාලය ලබා දෙන්න. 3.2.1 ක්‍රියාකාරකමේ දී ඒ ඒ කණ්ඩායමට ලබා දුන් පෙළ කොටස් ම ලබා දීමෙන් සිසුන්ට මෙම කාර්යය වඩාත් පහසු වනු ඇත. සංවාද භාවිතයේ දී ශෛලිය රංග කාර්යයට උචිත වීම, චරිතය හා ගැළපීම, භාව ප්‍රකාශනය, නිරවුල් බව හා පැහැදිලි බව, හඬ පාලනය ආදිය කෙරෙහි සැලකිලිමත් වෙමින් ප්‍රාසංගික ව ඉදිරිපත් කිරීම මගින් වඩාත් ඵලදායී ලෙස සංවාද භාවිත කිරීමට අවස්ථාව සලසා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- නාට්‍යධර්මී ශෛලියට අනුව සංවාද භාවිත කිරීම
- භාව ප්‍රකාශන හැකියාව විමසීම
- හඬ පාලනයෙහි හැකියාව විමසීම
- චරිතයට උචිත ලෙස සංවාද භාවිත කර තිබේදැයි විමසීම
- ප්‍රාසංගික ලෙස ඉදිරිපත් කර ඇතිදැයි විමසීම යන කරුණු ඇගයීමට ලක් කිරීම.

**පසු පැවරුම** : නාට්‍යධර්මී ශෛලියෙන් යුත් නාට්‍යයක තෝරාගත් කොටසක් (රසාස්වාදයට හානි නොවන පරිදි) සාහිත්‍ය සමිතියේ රැස්වීමක දී රඟ දක්වන්න.

උදාහරණ : මනමේ නාටකයේ මනමේ කුමරා, කුමරිය සමග සිය රටට යාම සඳහා පිටත් වූ අවස්ථාවේ සිට වැදි රජු හමුවීම දක්වා කොටස

**අතිරේක උදව්** : නාට්‍යධර්මී ශෛලියෙන් ලියැවුණු නාට්‍ය පෙළ කීපයක්

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.2** : නිර්දිෂ්ට පෙළ ඇසුරින් විවිධ චරිත නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම 3.2.3** : ගී ගයමින් අපි – රඟමු

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- නාට්‍යධර්මී හා ලෝක ධර්මී නාට්‍ය ගීත ශ්‍රවණය කරයි
- දික්තල – කාලගෝල නාට්‍යයේ එන නාඩගම් රාග තාල ගායනා කරයි.
- ගීත රස විඳියි.
- ගායනයක අඩංගු වියයුතු ගුණාංග පුහුණු වෙයි.
- විවධ ශෛලීන්ට අයත් ගීත ගයමින් රඟයි.

**ගුණාත්මක යෙදවුම්** :
- දික්තල – කාලගෝල නාට්‍යයේ සංයුක්ත තැටි.
- වෙනත් නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී නාට්‍යවල ගීත ඇතුළත් සංයුක්ත තැටි
- ගීත පිටපත් කළ පත්‍රිකා (නිර්දිෂ්ට පෙළෙහි එන ගීත හා වෙනත් ගීත)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- සංයුක්ත තැටියක් ආධාරයෙන් නාට්‍යධර්මී හා ලෝකධර්මී නාට්‍ය ගීත ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- දික්තල – කාලගෝල නාට්‍යයේ එන නාඩගම් රාග තාල සහිත ගීත ශ්‍රවණය කීමට අවස්ථාව ලබාදෙන්න.

**පියවර 02**
- ගීත ශ්‍රවණය කිරීමෙන් අනතුරු ව එම ගීතවල ස්වභාවය හා වෙනස්කම් පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. ශෛලිය අනුව ගීතයේ ස්වරූපය වෙනස් වන ආකාරය උක්ත දර්ශන ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. ගායනා කිරීමේ දී තාලය, ලය, යතිය, රිද්මය ආදී ගුණාංග පිළිබඳ ව මෙන් ම නිවැරදි උච්චාරණය, හඬ පාලනය, ශබ්ද මාධූර්යය, චරිතයට උචිත වීම. භාව ප්‍රකාශනය වැනි අංශ පිළිබඳ ව ද සැලකිලිමත් විය යුතු බව සිසුන්ට අවධාරණය කරන්න.
- සකස් කරගෙන පැමිණි දික්තල – කාලගෝල නාට්‍යයේ ගීත සඳහන් පත්‍රිකා ශිෂ්‍ය කණ්ඩායම්වලට ලබා දී ඒවා පුහුණුවීමට අවස්ථාව ලබා දෙන්න. (අවශ්‍ය නම් එම ගීත යළිත් ශ්‍රවණය කිරීමට සලස්වන්න.)

**පියවර 03** පන්ති කාමරයෙන් බැහැර එළිමහන් ස්ථානයකට සිසුන් කැටුව ගොස් එසේ පුහුණු වූ ගීත භාවාත්මක ව ගායනා කිරීමට අවස්ථාව සලසා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- නාඩගම් රාග තාල අනුව ගායනා කරවීම
- තාලානුකූල ව ගායනයෙහි යෙදීමේ හැකියාව පිරික්සීම
- ශබ්ද මාධූර්යය පිළිබඳ ව විමසීම
- භාව ප්‍රකාශනය පිළිබඳ කුශලතාව විමසීම
- ගායනය හැකියාව නිරීක්ෂණය කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පසු පැවරුම** : එළිමහන් ස්ථානයක් රංග භූමිය ලෙස භාවිත කරමින්, නිදසුනක් වශයෙන් දක්වා ඇති ගීත (අතිරේක උදව් 02, 03) හෝ වෙනත් නාට්‍ය ගීත ගයමින් රස විඳින්න.

**අතිරේක උදව්** :

- නාට්‍ය ගීත හා දික්තල කාලගෝල නාට්‍යයට අදාළ සංයුක්ත තැටි
- ආලේ බැන්ද මාගෙ රම්‍යවන්
- අපි ගමට යමු
- රතදර සිරියා පරදන
- හිටපල්ලා හිටපල්ලා නොගිහින්
- සත් අවුරුද්දක් මෙහෙකර
- අම්බරයේ සඳසේ. නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි එන ගීත පිටපත්

පහත සඳහන් නාට්‍ය ගීත හෝ වෙනත් ඕනෑම නාට්‍ය ගීත සඳහන් පත්‍රිකා සකස් කරගන්න.

- දීකිරි දීකිරි – රතු හැට්ටකාරි නාට්‍යයෙන්
- සෝබාව දේ මෙපුර – තාරාවෝ ඉගිලෙති නාට්‍යයෙන්
- ඇහැල මලින් ගස් පිරිලා – නරිබෑණා නාට්‍යයෙන්
- ප්‍රේමයෙන් මන රංජිත වේ – මනමේ නාට්‍යයෙන්
- කුමට ද සොබනියෙ කඳුළු සලන්නේ – නරිබෑණා නාට්‍යයෙන්
- මූදු පතුල යට ඉඳලා – මූදු පුත්තු නාට්‍යයෙන්
- හනික වරෙව් කොල්ලනේ – බෙරහඬ නාට්‍යයෙන්
- වැල් පාලමේ ගීතය – හුණුවටයේ කතාව නාට්‍යයෙන්
- ගල්ලෙන බිඳලා – සිංහබාහු නාට්‍යයෙන්

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.3** : නිර්දිෂ්ට පෙළ ඇසුරින් විවිධ චරිත නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම** : කාලගෝල නාට්‍යයෙහි චරිත රඟපෑම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :

- නාට්‍යයක චරිත සඳහා සුදුසු නළුනිලියන් තෝරා ගනියි.
- වේදිකා අවකාශය නිවැරදි ව භාවිත කරයි.
- චරිතයට අදාළ අභිනය පායි.
- අන්තර් සම්බන්ධතාව ගොඩ නැගෙන සේ (චරිත චරිත අතර) රංගනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : නාට්‍ය පිටපත

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**

- පෙර පාඩම්වල දී පෙළ කියැවීම සහ සංවාද කියැවීම අනුව ලබා ගත් අවබෝධය විමසීමෙන් පාඩමට පිවිසෙන්න.
- දික්තල –කාලගෝල චරිත සඳහා සුදුසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරා ගන්න (නළුවරණය) වේදිකාව මතට ගොස් ඒ ඒ අවස්ථාවට අදාළ චරිතයේ සංවාද කියමින් චලන ක්‍රියාකාරකම්හි යොදවන්න.

**පියවර 02**

- සිසුවාට තනි ව ම සංවාද කියමින් චරිතයට අදාළ චලනය කිරීම සඳහා අවස්ථාව ලබා දීමෙන් අනතුරු ව ගුරුවරයා මැදිහත් වී එහි අඩුපාඩු වැරදි සකසා නිවැරදි ව හඬ උච්චාරණය කරමින් රංගනය සිදු කරන අයුරු පහදා දෙන්න.

**පියවර 03**

- අවස්ථාවට අදාළ සියලු චරිත යොදා වේදිකා අවකාශය තුළ නිවැරදි ව චලන ක්‍රියාවලිය ගොඩ නංවන්න. සංගීතය නර්තනය ද මුසුකිරීම සඳහා අනිකුත් සහය ශිල්පීන් (නර්තන, සංගීත ගුරුභවතුන්) සම්බන්ධ කරගෙන දික්තල කාලගෝල නාට්‍යයෙහි අවස්ථා එකින් එක පුහුණු කරන්න.
- ගුරු සිසු සහයෝගයෙන් චරිත නිරූපණයන් ගොඩනගන අයුරු රඟ පෑමෙහි නොයෙදෙන දරුවන්ට නිරීක්ෂණය කිරීමට ඉඩ ලබා දෙන්න. පසු ව ශිෂ්‍යයන් කොටස් කර ඒ ඒ අයට නාට්‍යයේ නම් කරනු ලබන කොටස් පුහුණු වීමට අවස්ථාව සලසා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- චරිතයට උචිත නළු නිළියන් සිසුන් අතරෙන් තෝරා ගැනීම
- සංවාදයට ගැළපෙන ලෙස චලනය සකසා ගැනීම
- සුදුසු පරිදි අවකාශය භාවිත කිරීම
- අවස්ථා නිරූපණය කිරීමෙහි පරිචය ලැබීම
- ගායන හැකියාව ප්‍රදර්ශනය කිරීම

යන කරුණු ඇගයීමට ලක් කරන්න.

**පසු පැවරුම** : කණ්ඩායම් වශයෙන් සෑදී දික්තල කාලගෝල නාට්‍යයේ තෝරාගත් අවස්ථාවක් නිරූපණය කිරීම

**අතිරේක උදව්** :

- දික්තල කාලගෝල නාට්‍යයේ වීඩියෝ පටයක්
- නාට්‍ය සම්බන්ධ ව ලියැවුණු ලිපි/පොත්පත්, ආදිය

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි.

**නිපුණතා මට්ටම 3.4** : අංග රචනය හා රංග භාණ්ඩ නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 3.4.1** : මුහුණ රචනා කරමු

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- අංග රචනය යනු කුමක්දැයි අදහස් පළ කරයි.
- මුහුණේ කලාප හඳුනා ගෙන නම් කරයි
- අංග රචනා ද්‍රව්‍ය නම් කරයි.
- නිවැරදි ව අංග රචනයෙහි යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ චරිතයන් ඇතුළත් පින්තූර
- අංග රචනයේ දී භාවිත මූලික ද්‍රව්‍ය ලැයිස්තුවක්
- මුහුණේ කලාප වෙන් කරන ලද සටහනක්
- අංග රචනා කට්ටලයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- වේදිකා නාට්‍යයන්හි චරිත ඇතුළත් පින්තූර ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- අංග රචනය කිරීමේ දී මුහුණ ප්‍රධාන වශයෙන් කොටස් 06 කට බෙදෙන බව පින්තූරය ඇසුරෙන් සාකච්ඡා කරන්න.
  1. නළල
  2. ඇස්
  3. කම්මුල්
  4. නාසය
  5. කට
  6. නිකට

**පියවර 02**
රූපණයේ දී නළු නිළියන්ගේ මුහුණුවල ලක්ෂණ නාට්‍යයට අවශ්‍ය පරිදි වෙනස් කර ගැනීමේ කාර්යය අංග රචනය නමින් හඳුන්වනු ලබන බව සාකච්ඡා කරන්න.

**පියවර 03**
මූලික ද්‍රව්‍ය හා භාවිතය පිළිබඳ ලැයිස්තුව ප්‍රදර්ශනය කරන්න.

1. Base make up : පදනම් ආලේප
   a. Grease Paint : ඇඟිල්ලෙන් හෝ පින්සලෙන් ආලේප කළ හැක. ප්‍රමුඛ නාම දෙකකි.
      - Leichner : (ලිච්නර්)
      - Lryolan : (ක්ලෝන්)

   b. Pan Cake : පෑන් කේක්
      වතුරින් දිය කොට ස්පොන්ජ් කැබැල්ලකින් ආලේප කළ හැක. විවිධ අංක හා වර්ණවලින් ලබා ගත හැකි ය.
2. Lining Colours : (ලයිනින් කලර්ස්)
   විවිධ හැඩ, රූප, වර්ණ මතු කිරීම සඳහා භාවිත කරයි.
3. Make up Pencils : (මේක් අප් පෙන්සිල්ස්)
   හැඩතල මතු කිරීමට හා රේඛා ඇඳීමට භාවිත කරයි.
4. Tooth Enamals (ටූත් එනමල්)
   දත් වර්ණ කිරීම සඳහා භාවිත කරයි.
5. Brushes and Sponges (බ්‍රෂ් සහ ස්පොන්ජ්)
   පින්සල්වලින් වර්ණ අලේප කිරීමත් ස්පොන්ජ්වලින් බේස්පවුඩර් ආලේප කිරීම සඳහාත් භාවිත කරයි.

6. Powder /Powder Puff (පවුඩර් පෆ්)
   අංග රචනය කිරීමෙන් පසු පවුඩර් සුළු වශයෙන් අලේප කළ හැකි ය. දහදිය දැමීමෙන් මුහුණෙන් ඇතිවන දිස්නය නැති කිරීමට ද යොදා ගනී.
7. Nose Putty (නෝස් පොටි)
   මුහුණේ හෝ ශරීරයේ ඇතැම් තැන්වල විවධ හැඩ සැකසීම සඳහා භාවිත කරයි.
8. Crepe Hair (ක්‍රේප් හෙයා)
   රැවුල් සඳහා භාවිත කරයි. හණ සහ කෘත්‍රිම ලෙස සැකසූ කෙඳි විශේෂයකි. විවිධ වර්ණවලින් ලබා ගත හැකි ය.
9. Spirit Gum : (ස්ප්‍රිට් ගම්)
   රැවුල් ඇලවීමට සහ පෝස් පොටි භාවිතයට යොදා ගනී.
10. Removing Cream : (රිමූවින් ක්‍රීම්)
   මේකප් ඉවත් කිරීම සඳහා භාවිත කරයි.

**පියවර 04**

- නාට්‍යයක මිනිස්, සත්ත්ව, මනඃකල්පිත චරිත දැකිය හැකි ය. ඒ ඒ චරිතවල මුහුණ හා අඟපසඟවල හැඩරුව විවිධ වේ. ස්ත්‍රී පුරුෂ භාවය අනුව ද පුද්ගල ස්වභාවය වෙනස් වේ. එම වෙනස් කිරීම අංග රචනය නම් වේ. චරිතවල බාහිර මෙන් ම අභ්‍යන්තර ස්වරූපය නිරූපණය සඳහා අංග රචනය බෙහෙවින් බලපායි. චරිතය අනුව කළ යුතු අංග රචනා වෙනස් වේ. අංග රචනය සඳහා පුද්ගලයා ගේ මුහුණෙහි හැඩය හා සමේ වර්ණය බලපායි.
  නාට්‍යයේ ශෛලිය අනුව ද අංග රචනය වෙනස් වේ.
  අංග රචනය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ.
  1. සරල අංග රචනය (Straight)
  2. චරිතාංග (Charactor )

  සරල අංග රචනයේ දී පුද්ගලයෙකුගේ බාහිර ස්වරූපය ඒ අයුරින් ඉදිරිපත් කරයි. චරිතාංග අංග රචනයේ දී පුද්ගලයෙකුගේ බාහිර ස්වරූපය වෙනත් අයුරකින් රචනා කරයි. මෙහි දී විවිධ චරිත අනුව අංග රචනය වෙනස් වේ.

**පියවර 05**

ශිෂ්‍යයන් කණ්ඩායම් කොට පැවරුම් ලබා දෙන්න.
අංග රචනය කළ යුතු නාම වෙන් කර දී කාර්යයෙහි නිරත කරවන්න.
චරිත නාම : දික්තල
කාලගෝල
මහෞෂධ පඬිතුමා
දික්පිටියා

**පියවර 06**

අංග රචනය කරන ලද චරිත ඉදිරිපත් කිරීම හා අගය කිරීම සිදු කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- අංග රචනය යන්න හැඳින්වීම
- මුහුණෙහි කලාප නම් කිරීම
- අංග රචනා ද්‍රව්‍ය නම් කිරීම
- අංග රචනා කිරීමේ සූදානම
- අංග රචනය කාර්යයෙහි නියැළීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම :** නිවැරදි ලෙස චරිත අංග රචනා කිරීම

**අතිරේක උදව් :**

- අභිනය සඟරාව – සිව්වන කලාපය, ජගත් පත්මසිරි
- අංග රචනයෙහි යෙදීම

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි.

**නිපුණතා මට්ටම 3.4** : විවිධ භූමිකාවන්ට ගැළපෙන අයුරින් අංග රචනා කිරීම.

**ක්‍රියාකාරකම 3.4.2** : අංග රචනයෙහි යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- විවිධ භූමිකාවල ස්වභාවය අධ්‍යයනය කරයි.
- විවිධ භූමිකාවන්ට ගැළපෙන අංග රචනා විධි සැලසුම් කරයි.
- නිවැරදි ලෙස අංග රචනයෙහි යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** : අංග රචනා අමුද්‍රව්‍ය - පෑන් කේක්, රූජ්, ලිප්ස්ටික්, අයිබ්‍රෝ පෙන්සිල්ස්, අයි ෂැඩෝ, පවුඩර් පෆ්, ක්‍රේප් හෙයාර්, ස්ප්‍රිට් ගම්, බේබි ඔයිල්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- පහත දැක්වෙන කරුණු අවධාරණය කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  අඳුර සහ එළිය පිළිබඳ මූලධර්මය අංග රචනයේ දී වැදගත් වේ. වේදිකා ආලෝකය මුහුණ මත පතිත වීමෙන් මුහුණේ පැතලි ස්වභාවයක් ඇතිවේ. මුහුණේ අංග පැහැදිලි ව ත්‍රිමාණ ගතිය අනුකූල ව මතු කර ගැනීමට වර්ණ භාවිත කිරීම අංග රචනයේ දී සිදු වේ.

පියවර 02
- නාට්‍ය පෙළ මනා ව අධ්‍යයනය කිරීම, නාට්‍ය ශෛලිය, නාට්‍යයේ නිරූපිත කාලය, දේශය, යුගය, භූමිකා පිළිබඳ අවබෝධයක් ලැබීම. පුද්ගල හා සත්ත්ව චරිත පිළිබඳ සැලකිලිමත්වීම, අනුමත ද්‍රව්‍ය පමණක් යොදා ගත යුතුවීම ආදිය අංග රචනයේ දී වැදගත් වන බව සඳහන් කරන්න.
- මූලික වශයෙන් අංග රචනය කොටස් 2 කි.
  I. සරල අංග රචනය – නළු නිළියන්ගේ පවත්නා ස්වභාවය ඒ අයුරින් ම පෙන්වීම සිදුවේ.
  II. චරිතාංග අංග රචනය – චරිතයට අදාළ පරිදි පුද්ගලයාගේ බාහිර පෙනුම වෙනස් කරයි.
- සත්ත්ව චරිත සඳහා අංග රචනය කිරීමේ දී සත්ත්ව චරිතය සංකේතවත් වන අයුරින් අංග රචනය කළ යුතු බව ද, සත්ත්ව රූප නාට්‍යයක චරිත බවට පත් කරන විට නිර්මාණාත්මක ප්‍රතිනිරූපණයක් සිදුවිය යුතු බව ද අවධාරණය කරන්න.

පියවර 03
- රචනය කිරීම සඳහා තෝරා ගත් සත්ත්ව රූපය මිනිස් මුහුණක රචනය කිරීම සඳහා සුදුසු සැලසුමක් ඇඳීමට උපදෙස් දෙන්න. එකී සැලසුම් නිරීක්ෂණය කරමින් අංග රචනයෙහි යෙදීමට අවකාශ සලසන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- අංග රචනා ද්‍රව්‍ය හඳුනා ගැනීම
- සත්ත්ව චරිත ස්වභාවය මිනිස් මුහුණක රචනය සඳහා සැලසුම් කිරීම
- මිනිස් මුහුණක් සත්ත්ව මුහුණක ස්වරූපයට රචනය කිරීම
- සරල අංග රචනයක් සිදු කිරීම
- චරිතාංග රචනයක් සිදු කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** : අංග රචනා අමුද්‍රව්‍ය හඳුනා ගනිමින්, අංග රචනා ක්‍රමවේද භාවිත කර සත්ත්ව හා මිනිස් චරිතයක් සඳහා අංග රචනයක යෙදවීම.

**අතිරේක උදව්** :
- විවිධ ශෛලීන්ට අයත් වේදිකා නාට්‍ය රූප, අංග රචනා විධි හඳුනා ගැනීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නිරතවීමට උචිත සම්පත් දායකයින්.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.4** : අංග රචනය හා රංග භාණ්ඩ නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 3.4.3** : රංගෝපකරණ නිර්මාණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- විවිධ නාට්‍ය සඳහා විවිධාකාරයේ රංග භාණ්ඩ අවශ්‍ය වන බව පවසයි.
- නාට්‍යධර්මී නාට්‍යවල රංග භාණ්ඩ නිර්මාණකරණයේ දී අනුගමනය කළ යුතු ශිල්ප ක්‍රම හඳුනා ගනී.
- විවිධ රංග භාණ්ඩ නිර්මාණයේ දී අනුගමනය කළ යුතු ශිල්ප ක්‍රම හඳුනා ගනී.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ රංග භාණ්ඩ ඇතුළත් පින්තූර
- නාට්‍ය කීපයක රංග භාණ්ඩ සහිත ව රූපණය කරන අවස්ථා සහිත වීඩියෝ පට හෝ පින්තූර.
- කලින් නිර්මාණය කරන ලද රංග භාණ්ඩ කීපයක් (ඇත්නම් පමණි)
- රංග භාණ්ඩ නිර්මාණය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය කීපයක් (ප්ලාස්ටික් බඳුන්, සැහැල්ලු ලී, හලාගත් වැලි, ලී කුඩු, බයින්ඩර් ගම්, රෙදි, පත්තර කොළ, ගෝනි ආදී)

**විෂය අන්තර්ගතය** : විවිධ භූමිකාවලට අවශ්‍යය වන රංගෝපකරණ නිර්මාණය කිරීම.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- කලින් නිර්මාණය කරන ලද රංගෝපකරණයක් හෝ රංගෝපකරණ සහිත පින්තූරයක් පෙන්වමින් පාඩමට පිවිසෙන්න. රංගෝපකරණ භාවිතය සෑම නාට්‍යයකම දක්නට නොමැති බවත්, නාට්‍ය ශෛලිය අනුව සහ නාට්‍යකරුවාගේ අභිමතය පරිදි රංගෝපකරණ භාවිත කරන බව ද පැහැදිලි කළ යුතු ය.

පියවර 02
- රංගනයේ දී නළු නිළියන් විසින් භාවිත කරනු ලබන සහ වේදිකාවේ භාවිත කරන විවිධ භාණ්ඩ රංග භාණ්ඩ නමින් නම් කරන බව පැහැදිලි කරන්න.

පියවර 03
- මෙම භාණ්ඩ නාට්‍යයෙහි දී පහසුවෙන් පරිහරණය කළ හැකි අයුරින් සරල හා සැහැල්ලු ලෙස නිර්මාණය කළ යුතු බව පහදන්න.

පියවර 04
- මීට පෙර නිර්මාණය කරන ලද (බඳුන්, පොරොව, කඩු, හෙල්ල) ආදිය නිර්මාණය කළ අයුරු නැවතත් විමසා බලා නිර්මාණය කළ හැකි වෙනත් භාණ්ඩ කීපයක් නිර්මාණය කරන්න. එසේ ම වේදිකාවේ භාවිත කරන මේස, පුටු, සෝපා, කබඩ් වැනි උපකරණ නිර්මාණය පිළිබඳ ව ද සිසුන් දැනුවත් කරන්න.
- රූපණයේ දී නළු නිළියන් අත දරා සිටින රංගෝපකරණ මෙන් ම, වේදිකාව මත තබා රංගනයට දායක කර ගන්නා උපකරණ ද රංගය හා මනා ලෙස බැඳී පැවතිය යුතු බවත් විවිධ භාණ්ඩ නිර්මාණයේ දී තමා සතු නිර්මාණාත්මක හැකියා මගින් වඩාත් සුදුසු භාණ්ඩ නිර්මාණය කර ගත හැකි අයුරුත් පැහැදිලි කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රංග භාණ්ඩය නාට්‍යයේ අර්ථය හා බැඳී පවතින ආකාරය
- සරල හා සැහැල්ලු ස්වභාවය
- පහසුවෙන් පරිහරණය කළ හැකි වීම
- නිර්මාණාත්මක වීම
- සමස්ත නිමාවේ සාර්ථකත්වය යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** : සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා රංගෝපකරණ කීපයක් නිර්මාණය කිරීමට පැවරීම.

**අතිරේක උදව්** : 7 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ රංග භාණ්ඩ නිර්මාණය පාඩම සහ 8 ශ්‍රේණියේ රංග භාණ්ඩ නිර්මාණය කිරීමේ පාඩම්.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.5** : නාට්‍ය නිෂ්පාදනය කරයි.

**ක්‍රියාකාරකම** : නිර්දිෂ්ට නාට්‍යයට නව අර්ථ කථනයක්

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- නාට්‍ය කතා වස්තුවේ දක්නට ලැබෙන ප්‍රබලතා හා දුර්වලතා හඳුනාගනියි.
- දුර්වල අවස්ථාවන් මඟ හරවා නව අර්ථ කථන සහිත ව (පෙළෙහි කොටසක්) රචනා කරයි.
- නව අර්ථ කථන සහිත නව නාට්‍ය පෙළ නිෂ්පාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- දික්තල කාලගෝල නාට්‍ය පිටපත

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- දික්තල කාලගෝල නාට්‍යයෙහි කතා වස්තුව, ශෛලිය නාට්‍යමය උපක්‍රම, ශිල්පීය කුශලතා පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**පියවර 02**
- නාට්‍යයෙහි ප්‍රබලතා හා දුබලතා පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.
  ප්‍රබලතා : සරල කතාන්දරයක් නාට්‍යෝචිත අවස්ථා සහිත ව ඉදිරිපත් කිරීම.
- ඒ ඒ අවස්ථා ඉස්මතු කිරීම පිණිස යොදාගත් ගීත හා සරල තනු
- රංග ප්‍රවේශන හා නිශ්ක්‍රමණ විධි.
- රංග භූමිය භාවිතය (ගඟ තරණය වැනි)
- කතාව ගලායෑමේ දී තෙවන පාර්ශ්වයක මැදිහත් වීමෙන් සත්‍යය හෙළිදරව් වීම.
- තමාගේ ස්වරූපය, තරාතිරම අවබෝධවීමෙන් නිවැරදි තීරණයකට එළැඹීම. (කාලගෝල)
- දුබලතා :
  කතා වස්තුව – සේවය සඳහා මිල ගෙවනු ලබන්නේ දියණිය පාවා දීමෙනි.

**පියවර 03**
- වඩා ප්‍රබල නාට්‍යෝචිත අවස්ථාවක් තෝරා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 04**
- දුර්වල ලක්ෂණ බැහැර කරමින් නව අර්ථකථන සහිත ව පෙළ රචනය සඳහා සිසුන් පොළඹවන්න.

**පියවර 05**
- නව අර්ථ ගැන් වූ නාට්‍ය පෙළ නිෂ්පාදනය කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- නිර්දිෂ්ට නාට්‍යයෙහි ප්‍රබලතා හඳුනා ගැනීම
- නිර්දිෂ්ට නාට්‍යයෙහි දුබලතා හඳුනා ගැනීම
- නව අර්ථ කථන ඉදිරිපත් කිරීම
- නව අර්ථ කථන සහිත ව පෙළ රචනා කිරීම
- නව නාට්‍ය පෙළ නිෂ්පාදනය කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** : නව අර්ථ කථන සහිත ව නාට්‍ය පෙළ රචනා කිරීම හා නාට්‍යය නිෂ්පාදනය කිරීම

**අතිරේක උදව්** : ජන කතා , ඓතිහාසික කතා, ප්‍රබන්ධ කතා කියවීම.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.6** : ප්‍රකාශනාත්මක නිරූපණයෙහි යෙදෙයි.

**ක්‍රියාකාරකම** : ප්‍රකාශනාත්මක නිරූපණයෙහි යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- විවිධ සංගීත ඛණ්ඩ ශ්‍රවණය කොට ඒ සඳහා ප්‍රකාශනාත්මක චලන සකස් කර ගනියි.
- ප්‍රකාශනාත්මක චලන නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- සංයුක්ත තැටියක් මගින් සංගීත ඛණ්ඩ කීපයක් සිසුන්ට ඇසීමට සලස්වන්න.
- ඒවාට අනුව ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීමට සිසුන් කීපදෙනෙකුට අවස්ථාව දෙන්න.

**පියවර 02**
- එම රංගන අවස්ථා පිළිබඳ ව සිසුන් සමග පහත කරුණු ද සහිත ව සාකච්ඡාවක් මෙහෙය වන්න.
- සංගීත ඛණ්ඩයේ නාදයෙහි ස්වභාවය, රිද්මයෙහි ස්වභාවය, නාද හා රිද්මය අනුව චලන භාවිතය, අර්ථාන්විත ව ඉදිරිපත් කිරීම කළ යුතු බවත් ආංගික, සාත්ත්වික හා ආහාර්ය අභිනයේ යම් යම් කොටස් නිර්මාණශීලී ව යොදා ගත යුතු බවත්, අවකාශයේ සමබරතාව රැකෙන පරිදි. රංග භූමියේ විවිධ තාල භාවිත කරමින් උචිත ලෙස හා නිර්මාණාත්මක ලෙස අවකාශ භාවිත කළ යුතු බවත්, තේමාවට උචිත ලෙස නව්‍යතාවකින් යුක්ත ව, නාට්‍ය රසය මතු කරමින්, ප්‍රසංගික ව ඉදිරිපත් කළ යුතු බවත්, සංගීත ඛණ්ඩයේ අදහස අවබෝධ කර ගනිමින්, අදාළ පරිදි චලනය හා රිද්මය අතර ගැළපුමක් සහිත ව අපූර්වත්වයෙන් හා අර්ථාන්විත ව ඉදිරිපත් කළ යුතු බවත් පැහැදිලි කරන්න.
- පේශීන් දැඩි කරමින් ද, ලිහිල් කරමින් ද අත් පා ආදිය ලිහිල් වන අයුරු අවබෝධ කරවන්න.

**පියවර 03**
- එක් එක් ශිෂ්‍යයාට විවිධ සංගීත ඛණ්ඩවලට අනුව චලන ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- රිද්මය හා නාදය පිළිබඳ සුවිශේෂතා අවබෝධය කර ගැනීම.
- අභිනය මගින් අර්ථය ප්‍රකාශ කිරීම
- අවකාශ භාවිතය
- නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම
- ශ්‍රවණය කරණ ලද සංගීත ඛණ්ඩයට අර්ථයක් සැපයීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** :
- විවිධ සංගීත ඛණ්ඩයන් ඇති සංයුක්ත තැටි ආධාර කොට ගෙන ඒවාට අනුව ප්‍රකාශානාත්මක චලන ගොඩ නඟන්න.

**අතිරේක උදවි** :
- පසුගිය වර්ෂවල ප්‍රායෝගික පරීක්ෂණ සඳහා යොදා ගන්නා ලද සංයුක්ත තැටි සොයා ගැනීම.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.1** : දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍යමය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහි ඇති නාට්‍යමය ලක්ෂණ හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම** : ශාන්ති කර්ම නරඹමු. නාට්‍යමය ලක්ෂණ සොයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- දේශීය ශාන්තිකර්ම අතරේ පහත රට ශාන්තිකර්මවල නාට්‍යමය ලක්ෂණ බහුල ව දක්නට ලැබෙන බව හඳුනා ගනියි.
- රටයකුම, සන්නියකුම, සූනියම් යාගය යන ශාන්තිකර්මවල ඇති නාට්‍යමය පෙළපාළි හඳුනා ගනී. (නානුමුරය, දහඅට සන්නිය, වඩිගපටුන වැනි)
- ඉහත ශාන්ති කර්ම පැවැත්වෙන ස්ථාන සොයා ඒවා නැරඹීමට කැමැත්ත ප්‍රකාශ කරයි. (වීඩියෝ පට නරඹයි)
- එම පෙළපාළිවල අනුකරණය, සමාරෝපය, අවස්ථා නිරූපණය, සංවාද භාවිතය, අනුරූපණය, ප්‍රේක්ෂක සහභාගිත්වය ආදී නාට්‍යමය ලක්ෂණ ඇති බව හඳුනා ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :
- රටයකුම, සන්නියකුම, සූනියම් යාගය ආදී ශාන්තිකර්මවල පින්තූර, ශ්‍රව්‍ය දෘශ්‍යපට.
- සංයුක්ත තැටි ධාවන යන්ත්‍රයක්
- විවිධ ප්‍රකාශනාත්මක නිරූපණ අඩංගු පින්තූර, පත්‍රිකා හෝ වීඩියෝ පට කීපයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- ශාන්ති කර්මයක සඳහන් කවියක් ගයමින් හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය පටයක් නැරඹීමට සලස්වා පාඩමට පිවිසෙන්න.
- පහත රටට ආවේණික ශාන්ති කර්ම තුනක් ලෙස රටයකුම, සන්නියකුම හා සූනියම් යාගය හඳුන්වා දෙන්න.

**පියවර 02**
- එම ශාන්තිකර්ම තුනෙහි අඩංගු නාට්‍යමය ජවනිකා හඳුන්වා දෙන්න. (නානුමුරය, දහඅටසන්නිය, වඩිගපටුන පිළිබඳ ව)
- එම නාට්‍යමය ලක්ෂණ හඳුනා ගැනීමට අවස්ථාව සලසන්න. (අනුකරණය, සමාරෝපය, අවස්ථා නිරූපණය, සංවාද භාවිතය, අනුරූපණය, ප්‍රේක්ෂක සම්බන්ධතාවය ආදී)

**පියවර 03**
- නාට්‍යමය පෙළපාළි රංගනය කරවන්න (කණ්ඩායම් තුනකට බෙදා පෙළපාළි තුනක් රංගනය කරවීම සහ එක් එක් කණ්ඩායමෙන් අනෙක් කණ්ඩායමේ නාට්‍යමය පෙළපාළියේ දක්නට ලැබුණ නාට්‍යමය ලක්ෂණ පිළිබඳ ව විමසීම.

**තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක :**
- නාට්‍යමය පෙළපාළි තෝරා ගැනීම.
- උචිත පරිදි රඟ දැක්වීම.
- නාට්‍යමය ලක්ෂණ මතු කිරීම.
- නාට්‍යමය ලක්ෂණ පැහැදිලි කිරීම.
- රංගනයේ සහ කරුණු ඉදිරිපත් කිරීමේ සමස්තය යන කරුණු ඇගැයීමට ලක් කිරීම.

පැවරුම :
- ශාන්තිකර්මවල ඇති නාට්‍යමය පෙළපාළි කීපයක් රඟ දක්වා ඒවායේ දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ පැහැදිලි කරන්න.

අතිරේක උදව් :
මුදියන්සේ දිසානායක – ගැමි නාටක ප්‍රවේශය,
එදිරිවීර සරච්චන්ද්‍ර – සිංහල ගැමි නාටකය
ශාන්තිකර්මවල කොටස් ඇතුළත් වීඩියෝ පට

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2** : දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍යමය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහි ඇති නාට්‍යමය ලක්ෂණ හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම 4.2.1** : දේශීය නාට්‍යකරුවන් හඳුනා ගනිමු. (හෙන්රි ජයසේන)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ලංකාවේ දේශීය නාට්‍ය කලාවේ ගමන් මගෙහි ආරම්භයේ සිට නාට්‍යකරුවන් පිළිබඳ අවබෝධ කර ගනී.
- හෙන්රි ජයසේන නම් වූ නාට්‍යකරුවා සහ රංගන ශිල්පියා පිළිබඳ ව තොරතුරු දැන ගනී.
- ඔහුගේ නිර්මාණයන් හඳුනා ගනී.

**ගුණාත්මක යෙදවුම්** :
- හෙන්රි ජයසේනගේ ඡායාරූපයක්
- හෙන්රි ජයසේන ලියූ නාට්‍ය කෘති කිහිපයක්
- වීඩියෝ පට
- ඔහුගේ නාට්‍යවල දර්ශන, ඡායාරූප කිහිපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- හෙන්රි ජයසේනගේ ඡායාරූපය පෙන්වා පාඩමට පිවිසෙන්න. හුණුවටයේ කතාව හෝ ඔහුගේ වෙනත් නාට්‍ය කෘතියක වීඩියෝ පටයක් පෙන්වීම මගින් හෙන්රි ජයසේන පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- හෙන්රි ජයසේන ගේ ජීවන තොරතුරු කෙටියෙන් දක්වන්න.
- ඔහු නාට්‍ය රචනයට, නිෂ්පාදනයට, රංගනයට පමණක් නොව චිත්‍රපට සහ ටෙලි නාට්‍ය රංගනයට ද සහභාගි වූ ජනප්‍රිය නළුවෙකු බව පවසන්න.

පියවර 02
- ඔහු විසින් නිර්මාණය කරන ලද නාට්‍ය නිර්මාණ පිළිබඳ ව සාකච්ඡා කරන්න. (අතිරේක උදව් 01 සම්බන්ධ කර ගන්න.) එහි දී නාට්‍ය රචනය, අධ්‍යක්ෂණය සහ රංගනයෙන් ද සම්බන්ධ වූ අයුරු පෙන්වා දෙන්න. ඔහු ස්වතන්ත්‍ර නාට්‍ය මෙන් ම පරිවර්තන නාට්‍ය ද නිෂ්පාදනය කර තිබෙන බව පැහැදිලි කරන්න.

පියවර 03
- කුවේණි, ජනේලය, වැනි නාට්‍ය ඔහු විසින් නිර්මාණය කරන ලද වඩාත් උසස් නාට්‍ය බව හඳුන්වා දෙන්න. හුණුවටයේ කතාව ද ඔහු විසින් පරිවර්තනය කර අධ්‍යක්ෂණය කරන ලද විශිෂ්ට නාට්‍යයක් බව සඳහන් කරන්න. විශේෂයෙන් ම ඒවායේ නිර්මිත චරිත මගින් ලබා දෙන ජීවිතාදර්ශය පිළිබඳ ව කෙටියෙන් දක්වන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- හෙන්රි ජයසේන පිළිබඳ ව තොරතුරු විමර්ශනය කිරීම
- ඔහු රඟපෑ චිත්‍රපට සහ ටෙලි නාට්‍ය නම් කිරීම
- ඔහු විසින් රඟපාන ලද වේදිකා නාට්‍ය නම් කිරීම
- ඔහුගේ නිර්මාණ අතර වඩාත් වැදගත් කෘති නම් කිරීම
- ඔහුගේ නිර්මාණවල විද්‍යමාන ජීවිතාදර්ශය වටහා ගැනීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම :**
- හෙන්රි ජයසේන නම් නාට්‍යකරුවා පිළිබඳ ව කුඩා පොත් පිංචක් සකස් කරන්න.

අතිරේක උදව් :

| වර්ෂය | නාට්‍ය නිර්මාණ | නාට්‍යයේ ස්වභාවය |
|---|---|---|
| 1953 | මනාලයෝ | ෂෙරිඩන්ගේ "ද රයිවල්ස්" නාට්‍යයේ පරිවර්තනයකි. |
| 1954 | වැදගත්කම | ඔස්කා වයිල්ඩ්ගේ "අ වුමන් ඔෆ් නෝ ඉම්පෝටන්ස්" නාට්‍යයේ පරිවර්තනයකි. |
| 1955 | ඇත්ත කුමක් ද? | ඇරිස්ටොෆානීස්ගේ "වලාකුළු" නාට්‍යයේ පරිවර්තනයකි. |
| 1959 | පව්කාරයෝ | ස්වතන්ත්‍ර |
| 1962 | ජනේලය | ස්වතන්ත්‍ර |
| 1962 | කුවේණි | ස්වතන්ත්‍ර |
| 1964 | තවත් උදෑසනක් | ස්වතන්ත්‍ර |
| 1965 | මනරංජන වැඩවර්ජන | ස්වතන්ත්‍ර |
| 1966 | අහස් මාලිගා | ටෙනසි විලියම්ගේ "ද ග්ලාස් මෙනාජරී"නාට්‍යයේ පරිවර්තනයකි. |
| 1967 | හුණුවටයේ කතාව | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ "කොකේසියන් චෝක් සර්කල්" නාට්‍යයේ පරිවර්තනයකි. |
| 1968 | අපට පුතේ මඟක් නැතේ. | ස්වතන්ත්‍ර |
| 1973 | මකරා | එව්ගිනිෂ්වාත්ස්ගේ ''ද ඩ්‍රැගන්'' හී පරිවර්තනයකි. |
| 1972 | දිරිය මව සහ ඇගේ දරුවෝ | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ "මදර් කරේජ්" නාට්‍යයේ පරිවර්තනයකි. |
| 1975 | සරණ සියොත්සේ පුතුනි හඹායන | ස්වතන්ත්‍ර |
| 1978 | සිරිසඟබෝ | නව නූර්තියකි. |

අතිරේක උදව් :

- ඔහුගේ නිෂ්පාදන අතර ඉතාමත් ජනප්‍රිය වූයේ හුණුවටයේ කතාව නාට්‍යයයි. එය මෙරට බිහි වූ විශිෂ්ට නාට්‍ය කෘතියක් වේ. එහි අසඩක්ගේ චරිතය හෙන්රි ජයසේන විසින් රඟපාන ලද අතර ගෘෂාගේ චරිතය ඔහුගේ බිරිඳ වූ මානෙල් ජයසේන විසින් රඟපාන ලදී.
- "දෙයක් වේ නම් යම් සුදුස්සාට ම අයිති විය යුතු" යන්න මෙහි තේමාව වී ඇත.
- එක ම ළමයකුට (මයිකල්) උරුමකම් කියන කාන්තාවන් දෙදෙනෙකු (වැදූ මවක් සහ හැදූ මවක්) සහ කිසිවෙකු අපේක්ෂා නොකළ අන්දමින් එම ගැටලුව විසඳන විනිශ්චයකරුවෙකු සම්බන්ධ අපූර්ව කතා පුවතක් හුණුවටයේ කතාවට පාදක වී ඇත.
- හෙන්රි ජයසේනගේ "කුවේණි" ද මෙරට බිහි වූ උසස් ම නාට්‍ය කෘතියකි. ඉතිහාසයේ එන කුවේණි කතා පුවත නව අර්ථකථනයක්, නව දෘෂ්ටියක් පිළිබිඹු වන අයුරින් නිෂ්පාදනය වී තිබේ. කුවේණිගේ චරිතය දෙස ඉතාමත් සානුකම්පිත ව මෙහි දී බලයි. ශ්‍රී ලාංකේය ඉතිහාසයේ මූලාරම්භයේ පවා ස්ත්‍රිය පීඩනයට පත්කළ සිදුවීම් සිදු වූ බව පෙන්වයි.
- "ජනේලය" ශෛලිගත සම්ප්‍රදායෙන් දෛනික ජීවන ප්‍රශ්න නාට්‍යයට නැංවීම දුෂ්කර යැයි පැවති මතයට පිළිතුරක් වශයෙන් ලියා ඇත.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2** : ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම 4.2.2** : සයිමන් නවගත්තේගම පිළිබඳ ව උගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :
- සයිමන් නවගත්තේගම නම් කලා ශිල්පියා පිළිබඳ ව තොරතුරු දැන ගනී.
- සයිමන් නවගත්තේගම ගේ සාහිත්‍ය හා වේදිකා නිර්මාණ පිළිබඳ ව තොරතුරු දැන ගනී.
- සිංහල නාට්‍ය කලාවට ඔහුගෙන් සිදු වූ සේවය අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- සයිමන් නවගත්තේගම ගේ ඡායාරූපයක්
- සයිමන් නවගත්තේගම ගේ නාට්‍ය දර්ශනවල ඡායාරූප කිහිපයක්
- සයිමන් නවගත්තේගම ගේ සාහිත්‍ය කෘතියක් හෝ කිහිපයක්
- වීඩියෝ පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- සුභ සහ යස වේදිකා නාට්‍යයේ වීඩියෝ පටයක් හෝ ඡායාරූපයක් පෙන්වමින් පාඩමට පිවිසිය හැකි ය. සයිමන් නවගත්තේගම ගේ ඡායාරූපයක් ද පෙන්වමින් ඔහු ගේ ජීවන තොරතුරු පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න.
- ඔහු ප්‍රකට කෙටිකතා සහ නවකතාකරුවෙකු වන බව.
- චිත්‍රපට නළුවෙකු වශයෙන් ද ප්‍රසිද්ධ බව පෙන්වා දීම.

**පියවර 02**
- ඔහු විසින් නිර්මාණය කරන ලද නාට්‍ය කෘති පිළිබඳ ව සාකච්ඡා කිරීම. (අතිරේක උදව් 01 සම්බන්ධ කර ගන්න.) ඔහු නාට්‍ය රචකයෙකු, අධ්‍යක්ෂ වරයෙකු සහ නළුවෙකු වශයෙන් ද කටයුතු කර ඇත. ඔහු ගේ සියලු ම නාට්‍ය ස්වතන්ත්‍ර රචනා වේ.

**පියවර 03**
- ඔහු විසින් නිර්මාණය කරන ලද සුභ සහ යස නාට්‍ය කෘතිය ලංකාවේ බිහි වූ විශිෂ්ට නාට්‍යයක් වන අතර අතිශයින් ම ජනප්‍රිය ද වී ඇති බව. මහා වංශයේ එන කතා පුවතකින් සමකාලීන සමාජ දේශපාලනය විවරණය කරන කෘතියක් වේ. එහි යසගේ චරිතය රඟපාන ලද්දේ සයිමන් නවගත්තේගම ය.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- සයිමන් නවගත්තේගම පිළිබඳ ව තොරතුරු විමර්ශනය කිරීම
- ඔහු සාහිත්‍ය කලාවේ ද නියැළුණු ප්‍රකට සාහිත්‍යකරුවෙකු ලෙස සඳහන් කිරීම
- ඔහුගේ නාට්‍ය නිර්මාණ නම් කිරීම
- ඔහුගේ නිර්මාණවල ඇති වැදගත්කම විමර්ශනය කිරීම
- ඔහුගේ තේමාව අගය කිරීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

පැවරුම : • සයිමන් නවගත්තේගම ගේ සාහිත්‍ය කෘති, චිත්‍රපට රචනා සහ නාට්‍ය රචනා පිළිබඳ ව නම් ලැයිස්තුවක් සකස් කරන්න.

**සයිමන් නවගත්තේගම ගේ නාට්‍ය නිර්මාණ**

- ගංගාවක්, සපත්තු කබලක් සහ මරණයක් (1970) රචනය
- ගගන සරණ කුරුල්ලනේ (1971) –රචනය සහ අධ්‍යක්ෂණය
- පුස්ලෝඩං ((1973) රචනය සහ අධ්‍යක්ෂණය
- සුභ සහ යස (1974) රචනය සහ අධ්‍යක්ෂණය
- සුදු සහ කළු (1978) රචනය සහ අධ්‍යක්ෂණය
- පණ්ඩුකාභය (1982) රචනය සහ අධ්‍යක්ෂණය

**අතිරේක උදව්** : • අභිනය 9 කලාපයේ සයිමන් නවගත්තේගම ලිපිය
- සුභ සහ යස නාට්‍ය පිටපත

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2 :** ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම 4.2.3** : බන්ධුල ජයවර්ධන නම් නාට්‍යකරුවා හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගැනුම් පල** :
- බන්ධුල ජයවර්ධන නාට්‍යකරුවා ගේ ජීවන තොරතුරු ප්‍රකාශ කරයි.
- බන්ධුල ජයවර්ධනගේ නාට්‍ය නිර්මාණ නම් කරයි.
- ඔහු විසින් කරනු ලැබූ නාට්‍යය රචනා නාට්‍යය කලාව හා සම්බන්ධ සාහිත්‍යමය රචනා අගය කරමින් කතා කරයි.

**ගුණාත්මක යෙදවුම් :**
- බන්ධුල ජයවර්ධනගේ ඡායාරූපයක්
- බෙර හඬ නාට්‍යයේ ගීතයක් අඩංගු සංයුක්ත තැටියක්
- බන්ධුල ජයවර්ධන ගේ සාහිත්‍ය කෘතියක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- බන්ධුල ජයවර්ධන නාට්‍යකරුවාගේ ඡායාරූපයක් පෙන්වමින් හෝ ඔහු විසින් නිෂ්පාදනය කරන ලද බෙර හඬ නාට්‍යයේ "හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්...."යන ගීතය ගායනා කරමින් හෝ එයට සවන් දෙමින් පාඩමට පිවිසිය හැකි ය. බන්ධුල ජයවර්ධනගේ ජීවන තොරතුරු විමර්ශනය කරන්න.

**පියවර 02**
- බන්ධුල ජයවර්ධන විසින් නිෂ්පාදනය කරන ලද නිර්මාණ හඳුනා ගැනීම. (අතිරේක උදව් 01) බෙර හඬ නාට්‍ය පිළිබඳ ව වඩාත් අවධානය යොමු කරමින් ඔහුගේ අනිකුත් නාට්‍ය කෘති පිළිබඳ ව සඳහන් කරන්න.

**පියවර 03**
- බන්ධුල ජයවර්ධනගේ වෙනත් සාහිත්‍යමය නිර්මාණයන් පිළිබඳ ව සාකච්ඡා කිරීම, නාට්‍ය පිටපත් රචනය, පරිවර්තනය, අනුවර්තනය සහ නාට්‍ය කලාව පිළිබඳ ව ලියා දක්වා ඇති විචාර ග්‍රන්ථ සාකච්ඡා කිරීම. අවසන් වශයෙන් බන්ධුල ජයවර්ධන පිළිබඳ ව කෙටි පොත් පිංචක් සකස් කරවීමට යොමු කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- බන්ධුල ජයවර්ධන නම් නාට්‍යකරුවා පිළිබඳ විස්තර කිරීම
- ඔහු ගේ නාට්‍ය කෘති නම් කිරීම
- ඔහු ගේ නාට්‍යවල ජනප්‍රිය ගීත ගායනා කිරීම
- ඔහු ගේ වෙනත් කෘති නම් කිරීම
- ඔහුගෙන් නාට්‍ය කලාවට සිදු වූ සේවාව අගය කිරීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

අතිරේක උදව් : **සයිමන් නවගත්තේගම ගේ නාට්‍ය නිර්මාණ**

- 1958 වර්ෂයේ සෝෂක වස්තුව නිර්මාණය කරමින් නාට්‍යකරණයට පිවිසියේ ය.

- 1961 වර්ෂයේ දී ග්‍රීක මහා නාට්‍යකරු සොෆොන්ලීස්ගේ ඉක්නෙවුටා ඉ නම් සැටර් නාට්‍ය බෙරහඬ නමින් අනුවර්තනය කර අධ්‍යක්ෂණය කිරීම.
- 1963 වර්ෂයේ දී දියසේන නොපැමිණීම නම් ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණය කිරීම.
- 1965 වර්ෂයේ දී ස්වර්ණ හංස නාට්‍යය නිර්මාණය කිරීම.
- 1966 වර්ෂයේ දී බිහි වූ බෝසතාණනි නම් නාට්‍ය අනුවර්තනය කර අධ්‍යක්ෂණය කිරීම. (චෙකොස්ලොවැකියානු නාට්‍යකරු කැරල්චැපෙක් සහෝදරයන්ගේ කෘමිනාටක (Insect Play) හි අනුවර්තනයකි)
- 1999 වර්ෂයේ දී ස්වර්ණමාලි නාට්‍ය රචනය සහ අධ්‍යක්ෂණය කිරීම.

**ශාස්ත්‍රීය සේවාව** :

- රූපණ 1 සඟරාව
- ග්‍රීක නාට්‍ය කලාව හා ප්‍රේක්ෂක ඔබ (චන්ද්‍රසෝම විතානගේ සමඟ)
- සකලජන – මධ්‍යකාලීන යුගයේ ලියැවුණු Every man නම් මොරැලිටි නාට්‍යයේ අනුවර්තන රචනය
- මොනරපිල් – ප්‍රකට නාට්‍ය කරුවෙකු - වූ මොලියර්ගේ ද බුර්ෂුවා ෂෙන්ටිල්ඩම් නාට්‍යයේ අනුවර්තන රචනය
- සම්භාව්‍ය ග්‍රීක නාට්‍ය කලාව (විජේරත්න පතිරාජ සමඟ)
- නාට්‍ය ප්‍රභේද – ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශනයකි.
- නාට්‍ය පෙළ අධ්‍යයනය – ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශනයකි.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2 :** ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම 4.2.4** : දේශීය නාට්‍යකරුවන් හඳුනා ගනිමු. (සුගතපාල ද සිල්වා)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :
- සුගතපාල ද සිල්වා නම් නාට්‍ය කරුවාගේ ජීවිත තොරතුරු පවසයි.
- ඔහුගේ සාහිත්‍ය නිර්මාණ පිළිබඳ ව අධ්‍යයනය කරයි.
- ඔහු විසින් කරනු ලැබූ නාට්‍ය නිර්මාණ අගය කරමින් කතා කරයි.
- ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවට ඔහුගෙන් සිදු වූ සේවාව ගැන සිය අදහස් පළ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සුගතපාල ද සිල්වාගේ ඡායාරූපයක්. ඔහු විසින් රචිත පොත්. ඔහුගේ නාට්‍යයක දර්ශන ඇතුළත් සංයුක්ත තැටියක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- සුගතපාල ද සිල්වා රචනා කළ සොඳුරු ආඥාදායකයා වැනි පොතක් හෝ සුගතපාල ද සිල්වාගේ ඡායාරූපයක් පෙන්වීම මගින් පාඩමට පිවිසෙන්න.
- ශ්‍රී ලාංකේය නූතන නාට්‍ය කලාවේ ආරම්භය මනමේ නාට්‍යය හා එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ මැදිහත් වීමෙන් සිදුවූ අතර මනමේ නම් නාට්‍ය ධර්මී නාට්‍යය ඉදිරිපත් වීමෙන් පසු නාට්‍ය ධර්මී නාට්‍ය නිර්මාණයට පෙළඹීමේ ප්‍රවණතාවක් ඇති වූ අතර එය වෙනස් කරමින් ලෝක ධර්මී නාට්‍ය නිෂ්පාදනය ආරම්භ කරන ප්‍රමුඛයා සුගතපාල ද සිල්වා බව ප්‍රකාශ කරන්න.
- සුගතපාල ද සිල්වා නාට්‍ය රචකයකු, අධ්‍යක්ෂවරයෙකු පමණක් නොව උසස් නවකතා රචකයකු සහ වෙනත් විචාරාත්මක ශාස්ත්‍රීය කෘති රචනයේ ද යෙදුණු බව ප්‍රකාශ කරන්න.

**පියවර 02**
- සුගතපාල ද සිල්වා නාට්‍ය රචනය පරිවර්තනය හා අධ්‍යක්ෂණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (අතිරේක උදව් 01 සම්බන්ධ කරගන්න.)

  ශ්‍රී ලාංකේය නාට්‍ය වංශයේ යථාර්ථවාදී/ලෝකධර්මී නාට්‍ය සම්ප්‍රදාය මෙරට තහවුරු කළ නාට්‍යකරුවා බවත් ඔහු නිසා ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවේ උසස් දියුණුවක් සිදු වූ බවත් මරාසාද්, දුන්න දුනු ගමුවේ, බෝඩිං කාරයෝ, තට්ටු ගෙවල් වැනි නාට්‍ය ඉතා උසස් නාට්‍ය නිර්මාණ බවත් පැහැදිලි කරන්න.

**පියවර 03**
- සුගතපාල ද සිල්වා, ටෙලි නාට්‍ය සහ චිත්‍රපට තිර රචනයන්හි ද යෙදුණු බව, නාට්‍ය නිෂ්පාදනය පිළිබඳ ව "සොඳුරු ආඥාදායකයා" නමින් ඉතාමත් වටිනා ශාස්ත්‍රීය ග්‍රන්ථයක් රචනා කළ බව පවසන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- සුගතපාල ද සිල්වා නම් නාට්‍යකරුවා පිළිබඳ ව තොරතුරු විමර්ශනය කිරීම

- ඔහු ගේ වෙනත් ශස්ත්‍රීය නිර්මාණයන් පිළිබඳ ව තොරතුරු සඳහන් කිරීම
- සුගතපාල ද සිල්වා ගේ නාට්‍ය නිර්මාණයන් නම් කිරීම වර්ග කිරීම
- සුගතපාල ද සිල්වා ගේ උසස් නාට්‍යය කෘති වෙන් කර හඳුනා ගැනීම
- සුගතපාල ද සිල්වා ගේ තොරතුරු එකතු කර පොත් පිංචක් සකස් කිරීම

යන කරුණු ඇගැයීම සඳහා යොදා ගන්න.

**අතිරේක උදව්** : **සුගතපාල ද සිල්වා ගේ නාට්‍ය නිර්මාණයන්**

- එක වල්ලේ පොල් 1958 – නාට්‍ය රචනය
- බෝඩිංකාරයෝ 1962 – නාට්‍ය රචනය සහ අධ්‍යක්ෂණය
- තට්ටු ගෙවල් 1964 – රචනය සහ අධ්‍යක්ෂණය
- හරිම බඩු හයක් 1965 – අනුවර්තනය සහ අධ්‍යක්ෂණය (ඉතාලි ජාතික ලුයිජි පිරැන්ඩෙලෝ ගේ රචකයකු සොයා යන චරිත හයක්)
- හෙලේ නැග්ග ඩෝං පුතා 1966 – පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (ඇමෙරිකානු ජාතික ටෙන්සි විලියම්ස් ගේ ද කැට් ඔන් අ හොට් ටින්රූෆ්
- නිල් කට්රොල් මල් 1967 – රචනය සහ අධ්‍යක්ෂණය
- හිත හොඳ අම්මණ්ඩි 1969 – පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ ගුඩ් වුමන් ඔෆ් සෙට්ස්සුවාන්ස්)
- දුන්න දුනු ගමුවේ 1972 – රචනය සහ අධ්‍යක්ෂණය
- මුතු කුමාරි 1973 – පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (ඇලෙක්සැන්ඩ්රේ බ්‍රෙෆෝට් ගේ ඉර්මා ලාඩුෂ්)
- තුරඟ සන්නිය 1975 – පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (ජුලියස් හේ ගේ "ද හෝස්")
- නන්දි විශාල 1977 – රචනය සහ අධ්‍යක්ෂණය
- දැවැද්දෝ 1979 – රචනය සහ අධ්‍යක්ෂණය
- සත සහ සත 1980 – රචනය සහ අධ්‍යක්ෂණය
- ඇසල සඳ අවන්හල – 1981 – අනුවර්තනය සහ අධ්‍යක්ෂණය (වර්න්ස්හයිඩර් ගේ ද ටී හවුස් ඔෆ් ද ඕගස්ට් මූන්)
- මරාසාද් 1986 – පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (පීටර් වයිස් ගේ මරාසාද්)
- සාන්තුවර සෙබළාණෝ 1991 – රචනය සහ අධ්‍යක්ෂණය

**අතිරේක උදව්** : අභිනය 5 කලාපය
සුගතපාල ද සිල්වා අභිනන්දනය

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2 :** ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම 4.2.5** : දේශීය නාට්‍යකරුවන් හඳුනා ගනිමු.
(පරාක්‍රම නිරිඇල්ල)

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගැනුම් පල** :
- පරාක්‍රම නිරිඇල්ල නම් නාට්‍ය කරුවා හඳුනා ගත් බව පවසයි.
- ඔහු චිත්‍රපට, ටෙලි නාට්‍ය හා වේදිකා නාට්‍ය යන මාධ්‍ය ත්‍රිත්වයේ ම ප්‍රවීණයකු බව පවසයි.
- ඔහුගේ නාට්‍ය නිර්මාණ හඳුනා ගත් බව ප්‍රකාශ කරයි.
- නාට්‍ය කලාවට ඔහුගෙන් සිදු වූ සේවාව අගය කරමින් කතා කරයි.

**ගුණාත්මක යෙදවුම් :**
- ජන කරළියෙහි ඡායාරූපයක්
- පරාක්‍රම නිරිඇල්ලගේ ඡායාරූපයක්
- පරාක්‍රම නිරිඇල්ල නිර්මාණය කළ නාට්‍යවල ඡායාරූප කිහිපයක්
- වීඩියෝ පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- ජන කරළියේ ඡායාරූපයක් හෝ වීඩියෝ පටයක් පෙන්වීම තුළින් පාඩමට පිවිසිය හැකි ය. ලංකාවේ සම්මත වේදිකා නාට්‍ය කලාවේ වෙනසක් සිදු කරන ලද ක්‍රියාකාරකමක් බව පවසා ඔහුගේ ඡායාරූපයක් ද ඔහු නිෂ්පාදනය කළ නාට්‍යවල ඡායාරූප ද දක්වමින් පහත තොරතුරු සාකච්ඡා කරන්න.
- පරාක්‍රම නිරිඇල්ලගේ ජීවන තොරතුරු කෙටියෙන්
- ඔහු නිර්මාණය කළ ටෙලි නාට්‍ය හා චිත්‍රපට

**පියවර 02**
- පරාක්‍රම නිරිඇල්ල විසින් කරනු ලැබූ නාට්‍ය නිර්මාණ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

  (අතිරේක උදව් 01 සම්බන්ධ කර ගන්න)

  ඔහුගේ නාට්‍ය රචනා, අධ්‍යක්ෂණයන් පිළිබඳ ව සඳහන් කරන්න. ඔහු සිදු කළ පරිවර්තන නාට්‍ය, අධ්‍යක්ෂණයන් සඳහන් කරන්න.

**පියවර 03**
- ලංකාවේ නාට්‍ය කලාවේ සම්මත රංගන ක්‍රම වෙනස් කර ජනකරළිය ජංගම රඟ මඬල ආරම්භ කිරීම සහ ගාමිණී හත්තොටුවේගම සමග මූලික වී වීදි නාට්‍ය කලාව ආරම්භ කිරීමට දායක වීම ආදී කරුණු කෙටියෙන් සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- පරාක්‍රම නිරිඇල්ල පිළිබඳ ව තොරතුරු විමර්ශනය කිරීම
- ඔහු ගේ චිත්‍රපටි සහ ටෙලි නාට්‍ය නම් කිරීම
- ජන කරළිය වැනි වෙනස් ආකාරයේ රංග භූමීන් පිළිබඳ ව සඳහන් කිරීම
- ඔහු ගේ නාට්‍ය නිර්මාණ කෘති නම් කිරීම
- පරාක්‍රම නිරිඇල්ලගේ තොරතුරු එකතුවක් සිදු කිරීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

අතිරේක උදව් : **පරාක්‍රම නිරිඇල්ල ගේ වේදිකා නාට්‍ය නිර්මාණ**

- 1976 සෙක්කුව – රචනය සහ අධ්‍යක්ෂණය
- 1979 විනිශ්චය – පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (ඇල්බෙයා කැමූ ලියූ The just) හි පරිවර්තනය
- 1984 ගැලීලියෝ – අධ්‍යක්ෂණය – පරාක්‍රම නිරිඇල්ල සහ එච්.ඒ. පෙරේරා (පරිවර්තනය නීල් ශ්‍රී විජේසිංහ)
- 1989 උත්තමාවී – අධ්‍යක්ෂණය – පරාක්‍රම නිරිඇල්ල (පරිවර්තනය නීල් ශ්‍රී විජේසිංහ)
- 1995 වරෙන්තු – අධ්‍යක්ෂණය – පරාක්‍රම නිරිඇල්ල සහ එච්.ඒ. පෙරේරා (පරිවර්තනය එච්.ඒ. පෙරේරා)

පරාක්‍රම නිරිඇල්ල, එච්.ඒ. පෙරේරා සමග සම්බන්ධ ව ආරම්භ කළ ජන කරළිය / ජංගම රඟමඬල ආරම්භ කිරීමත් සමග නිෂ්පාදනය කළ නාට්‍ය

- අන්දර මල්
- සීතාම්බර පට
- මකරරාක්ෂ (එව්ගිනි ෂ්වාත්ස් ගේ ''ද ඩ්‍රැගන්'' හි පරිවර්තනය)
- චරන්දාස් (ඉන්දීය නාට්‍ය හබීබ් තන්විර් චරන්දාස් චෝර් හි පරිවර්තනය)
- මැටි කරත්තය (ශුද්‍රකගේ මෘච්ඡකටික ප්‍රකරණය)
- කල්පාන්තය

අභිනය 9 කලාපය - පරාක්‍රම නිරිඇල්ල (70 දශකයේ නාට්‍ය කරුවෝ) (සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි).

පැවරුම : පරාක්‍රම නිරිඇල්ල නම් නාට්‍යකරුවා පිළිබඳ ව පුවත් පතකට ලිපියක් රචනා කිරීම.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.3** : ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම 4.3.1** : රංගන ශිල්පීන් හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :
- මානෙල් ජයසේන හා විජේරත්න වරකාගොඩ යන රංගන ශිල්පීන් හඳුනා ගත් බව පවසයි.
- ඔවුන් රඟ පෑ විවිධ නාට්‍ය කෘති නම් කරයි.
- ඔවුන්ගේ රංගන අවස්ථාවන් විමසා බලයි.

**ගුණාත්මක යෙදවුම්** :
- මානෙල් ජයසේන හා විජේරත්න වරකාගොඩගේ ඡායාරූප
- ඔවුන් දෙදෙනා රඟපාන නාට්‍යවල ඡායාරූප හෝ වීඩියෝ පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01**
- මෙම රංගන ශිල්පීන් දෙදෙනාගේ ඡායාරූපවලින් හෝ වෙනත් නාට්‍යමය ඡායාරූපයක් මගින් පාඩමට පිවිසෙන්න. මානෙල් ජයසේන නම් ශිල්පිනිය මුලින් ම රංගනයට අවතීර්ණ වීම, රඟපාන ලද නාට්‍ය කෘති සහ ඇය නිරත වූ වෙනත් කාර්යයන් පිළිබඳ ව අවබෝධයක් ලබා දෙන්න.

**පියවර 02**
- විජේරත්න වරකාගොඩ නම් රංගන ශිල්පියා පිළිබඳ ව කරුණු ඉදිරිපත් කරන්න. ඔහු විසින් රඟපාන ලද නාට්‍ය කෘති නම් කිරීම විජේරත්න වරකාගොඩ වේදිකා නාට්‍ය, චිත්‍රපට, ටෙලිනාට්‍ය සහ ප්‍රකට ගුවන් විදුලි නාටක රංගන ශිල්පියෙක් ද වන බව පෙන්වා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- රංගන ශිල්පිනියක ලෙස මානෙල් ජයසේන හඳුනා ගැනීම
- විජේරත්න වරකාගොඩ නම් රංගන ශිල්පියා හඳුනා ගැනීම
- ඔවුන් රඟ පෑ නාට්‍ය කෘති නම් කිරීම
- ඔවුන් රංගනයේ නියුතු වූ වෙනත් කලා අංශ පිළිබඳ ව විමසීම
- ශිල්පීන් දෙදෙනා ගේ ම තොරතුරු රැස් කිරීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**අතිරේක උදව්** : **මානෙල් ජයසේන**
- මානෙල් ජයසේන රංගන ශිල්පිනිය රඟපෑම්, නර්තන නිර්මාණය, ඇඳුම් පැළඳුම් නිර්මාණය සහ සහාය අධ්‍යක්ෂණය යන කාර්යයන්ගෙන් නාට්‍යවලට සහභාගි වී ඇත.
- ප්‍රකට නාට්‍යකරුවෙකු වූ හෙන්රි ජයසේනයන්ගේ බිරිඳ වේ.
- 1963 දී ඇය නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසියා ය.
- කුවේණි, ජනේලය, තවත් උදෑසනක්, අහස් මාලිගා, හුණුවටයේ කතාව, අපට පුතේ මගක් නැතේ, මනරංජන වැඩ වර්ජන, දිරිය මව සහ ඇගේ දරුවෝ යනාදී නාට්‍යයන්හි ඇය රංගනයේ යෙදුනි.
- ඇය රූපවාහිනී නට්‍යවල ද රංගනයේ යෙදී ඇත.

**විජේරත්න වරකාගොඩ**

- වේදිකාව, සිනමාව, රූපවාහිනිය සහ ගුවන් විදුලිය යන අංශවල රංගනයේ යෙදුණු ජනප්‍රිය ම රංගන ශිල්පියෙකි.
- 1963 දී රංගන ක්ෂේත්‍රයට පිවිසියේ ය.
- අජාසත්ත, අපට පුතේ මගක් නැතේ, කුවේණි, ජනේලය, මනමේ , තවත් උදෑසනක්, මනරංජන වැඩ වර්ජන, හුණුවටයේ කතාව, දිරිය මව සහ ඇගේ දරුවෝ, සිංහබාහු, මහාසාර, ලෝම හංස, කපුවා කපෝති, පේමතී ජායතී සෝකෝ යනාදී නාට්‍යවල රංගනයේ යෙදී ඇත.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.3 :** ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම 4.3.3 - 4.3.4:** රංගන ශිල්පීන් හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගැනුම් පල :**
- විජය නන්දසිරි සහ ශ්‍රියන්ත මෙන්ඩිස් යන නාට්‍යකරුවන් ගැන විස්තර කරයි.
- ඔවුන් රඟපාන ලද නාට්‍ය කෘති නම් කරයි.
- ඔවුන්ගේ රඟපෑම් ඇතුළත් සිනමා සහ රූපවාහිනී නාට්‍ය හඳුනා ගනී.

**ගුණාත්මක යෙදවුම් :**
- විජය නන්දසිරි සහ ශ්‍රියන්ත මෙන්ඩිස්ගේ ඡායාරූප
- ඔවුන් රඟ පෑ නාට්‍යවල ඡායාරූපයක් හෝ වීඩියෝ පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** විජය නන්දසිරි සහ ශ්‍රියන්ත මෙන්ඩිස් යන දෙදෙනා රඟ පෑ නාට්‍යවල ඡායාරූප මගින් ඔවුන් දෙදෙනා හඳුනා ගන්න. ඔවුන් දෙදෙනාගේ නිර්මාණ පිළිබඳ මූලික විස්තර ප්‍රකාශ කරන්න. ඔවුන් රඟපෑම සහ නාට්‍ය අධ්‍යක්ෂණය යන දෙඅංශයේ ම නියැළෙන බව පැහැදිලි කරන්න.

**පියවර 02** විජය නන්දසිරි සහ ශ්‍රියන්ත මෙන්ඩිස් යන දෙදෙනා රඟ පෑ නාට්‍ය කෘති නම් කරන්න. ඔවුන් විසින් රඟපාන ලද චිත්‍රපට සහ ටෙලි නාට්‍ය කෘති පිළිබඳව ද අවබෝධයක් ලබා දෙන්න.

**පියවර 03** මෙම රංගන ශිල්පීන් දෙදෙනා ගේ රඟපෑම් පිළිබඳ ව වැඩදුරටත් සාකච්ඡා කරන්න. විජය නන්දසිරි හාස්‍ය නිරූපණයට වඩාත් ප්‍රකට බවත්, ශ්‍රියන්ත මෙන්ඩිස් විවිධ චරිත නිරූපණයට ප්‍රකට බවත් පැහැදිලි කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- රංගන ශිල්පියෙකු ලෙස විජය නන්දසිරි හඳුනා ගැනීම
- ඔහු හාස්‍ය රංගනය සඳහා දක්වන කුශලතාව ප්‍රකාශ කිරීම
- ශ්‍රියන්ත මෙන්ඩිස් රංගන ශිල්පියෙකු සහ නාට්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස හඳුනා ගැනීම
- ඔවුන් රඟ පෑ නාට්‍ය කෘති නම් කිරීම
- ශිල්පීන් දෙදෙනා පිළිබඳ ව තොරතුරු එක්රැස් කිරීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**අතිරේක උදව් :** **විජය නන්දසිරි**
- රංගන ශිල්පියෙකු ලෙස වඩාත් ප්‍රකට වේ. නාට්‍ය අධ්‍යක්ෂණයේ ද යෙදේ.
- නාට්‍ය, සිනමා හා ටෙලි නාට්‍ය යන මාධ්‍ය තුනෙහි ම කැපී පෙනෙන රංගන ශිල්පියෙකි.
- ඔහු වඩාත් ප්‍රකට ව ඇත්තේ හාස්‍ය රංගනය සඳහා ය.
- 1966 දී නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසියේ ය.

- මනමේ, සිංහබාහු, කුස පබාවතී (රංගනය, අධ්‍යක්ෂණය), රත්නාවලී, රංකඳ, විශ්ව සුන්දරී, සුභ සහ යස, තාරාවෝ ඉගිළෙති, ඒකාධිපති, කුවේණී, හුණුවටයේ කතාව, වහලක් නැති ගෙයක් යනා දී වූ නාට්‍ය නිර්මාණවලට රංගනයෙන් දායක වී ඇත.

**ශ්‍රියන්ත මෙන්ඩිස්**

- 1978 මහාචාර්ය නෝබට් ජේ. මයර් නම් විදේශීය නාට්‍යකරුවාගේ නාට්‍ය වැඩමුළුවේ ඉදිරිපත් වූ අනේ අබිලික් නාට්‍යයේ රඟපෑමෙන් ක්ෂේත්‍රයට පිවිසියේ ය.
- නාට්‍ය රංගනය සහ අධ්‍යක්ෂණය යන කරුණු දෙකෙහි ම නිරත වේ.
- මෝරා, මහාසාර, එවබලව, මගුල් ප්‍රස්තාව, ඒකට මට හිනා හිනා, අත්, ඔත්තුකාරයා, යක්ෂාගමනය, තලමල පිපිලා, පුත්‍ර සමාගම, දෝන කතරිනා, පරාස්ස, දූන්යාගේ ගීතය, රඟපෑම් ඉවරයි, මහාසමයම, රෝමය ගිනි ගනී යනාදී නාට්‍යවල රඟපා ඇත.
- වේදිකා නාට්‍යවලට අමතර ව ශ්‍රියන්ත මෙන්ඩිස් රූපවාහිනී නාට්‍ය සහ සිනමා රංගනයෙන් ද දක්ෂතා ප්‍රකට කර ඇත.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.3** : ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ රංගන ශිල්පීන් හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම 4.3.5 - 4.3.7**: රංගන ශිල්පීන් හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :
- ගාමිණී සමරකෝන්, අනුලා බුලත්සිංහල, ඩග්ලස් රණසිංහ යන රංගන ශිල්පීන් ගැන විස්තර කරයි.
- ඔවුන් විසින් රඟපාන ලද නාට්‍ය කෘති නම් කරයි.
- ඔවුන් සිනමා සහ ටෙලිනාට්‍ය යන මාධ්‍යවල ද රංගනයේ යෙදුණු බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ගාමිණී සමරකෝන්, අනුලා බුලත්සිංහල, ඩග්ලස් රණසිංහ යන රංගන ශිල්පීන්ගේ ඡායාරූප
- ඔවුන්ගේ රංගනයන් ඇතුළත් වීඩියෝ පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** ගාමිණී සමරකෝන්, අනුලා බුලත්සිංහල, ඩග්ලස් රණසිංහ යන රංගන ශිල්පීන් පිළිබඳ ව ඡායාරූප හෝ වීඩියෝ පට පෙන්වමින් ඔවුන් ව හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව දෙන්න. ඔවුන්ගේ මූලික තොරතුරු සිසුන්ට හඳුන්වා දෙන්න.

**පියවර 02** මෙම රංගන ශිල්පීන් විසින් රඟපාන ලද නාට්‍ය කෘති ප්‍රකාශ කරන්න. (අතිරේක උදව් සහාය කර ගන්න)

**පියවර 03** මෙම රංගන ශිල්පීන් තිදෙනා නාට්‍යවලට අමතර ව සිනමා රංගනය, රූපවාහිනී නාට්‍ය රංගනය සඳහා ද දක්ෂතා ප්‍රකට කර ඇති බව පෙන්වා දෙන්න.
අවසානයේ සිසුන්ට මෙම ශිල්පීන් තිදෙනා රඟපාන ලද වේදිකා නාට්‍ය, සිනමා සහ ටෙලිනාට්‍ය කෘතිවල නාම ලේඛනයක් සකස් කිරීමට අවස්ථාව දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- රංගන ශිල්පීන් ලෙස ගාමිණී සමරකෝන්, අනුලා බුලත්සිංහල, ඩග්ලස් රණසිංහ හඳුනා ගැනීම
- ඔවුන් රඟ පෑ නාට්‍ය කෘති නම් කිරීම
- ඔවුන් ගේ වෙනත් රංගනයන් නම් කිරීම
- ඔවුන් ගේ රංගන තොරතුරු එක්රැස් කිරීම
- ඔවුන් ගේ ජීවන තොරතුරු සොයා බැලීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**අතිරේක උදව්** : **ගාමිණී සමරකෝන්**
- 70 දශකයේ නාට්‍ය රංගනය සඳහා ප්‍රවිෂ්ට වී ඇත.
- වේදිකා නාට්‍ය රංගනයේ සහ රූපවාහිනී නාට්‍ය රංගනයේ දක්ෂතා ප්‍රකට කර ඇත.

- මූදු පුත්තු, නරිබෑණා, අසාත මන්තරේ, පොකුරු වැස්ස, තාරාවෝ ඉගිළෙති, මනමේ, බෙරහඬ ආදී නාට්‍ය සඳහා රංගනයෙන් දායක වී ඇත.

**අනුලා බුලත්සිංහල**

- 1967 දී වේදිකා රංගනයට ප්‍රවිෂ්ට විය.
- වේදිකා සහ රූපවාහිනී නාට්‍යවලට සිය රංගන දායකත්වය දක්වා ඇත.
- ලෙඩක් නැති ලෙඩෙක්, චරිත දෙකක්, රාවණා නාඩගම, වහළක් නැති ගෙයක්, කෝන්තරේ, කුවේණි, දැ වැද්දෝ, මහාසාර, රතු හැට්ටකාරී, තාරාවෝ ඉගිළෙති, මධුර ජවනිකා, ශ්‍රී වික්‍රම (නූර්තිය) යනාදී නාට්‍යවල රඟපා ඇත.

**ඩග්ලස් රණසිංහ**

- නාට්‍ය ක්ෂේත්‍රයට 1967 දී පිවිසියේ ය.
- සිංහල සහ ඉංග්‍රීසි වේදිකා නාට්‍යවල රඟපා ඇත.
- සිනමා සහ රූපවාහිනී රංගනයේ දී වඩාත් කැපී පෙනුණු රංගන ශිල්පියෙකි.
- හුණුවටයේ කතාව, හොටබරි යුද්දේ, TAMING OF THE SHREW අපට පුතේ මගක් නැතේ
- කුවේණි, ඩුංඩුංබෙරේ, කොමිසම ඉදිරියේ, සාක්කි දෙන්නෝ, ජනේලය, THE WEDDNG, අහස් මාලිගා, කුස පබාවතී යන නාට්‍ය කෘතිවලට රංගනයෙන් දායක වී ඇත.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.3** : ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ රංගන ශිල්පීන් හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම 4.3.8 - 4.3.9**: රංගන ශිල්පීන් හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :
- ජැක්සන් ඇන්තනි, කෞෂල්‍යා ප්‍රනාන්දු යන රංගන ශිල්පීන් පිළිබඳ ව තොරතුරු විමර්ශනය කරයි.
- ඔවුන් ගේ රංගනයන් ඇතුළු නාට්‍ය කෘති නම් කරයි.
- ඔවුන් රංගනයේ යෙදුණු වෙනත් මාධ්‍යයන් පිළිබඳ ව තොරතුරු සපයයි.
- රංගනය පමණක් නොව අධ්‍යක්ෂණ කාර්යයේ ද යෙදුණු බව වටහා ගනී.

**ගුණාත්මක යෙදවුම්** :
- ජැක්සන් ඇන්තනි, කෞෂල්‍යා ප්‍රනාන්දු යන රංගන ශිල්පීන් ගේ ඡායාරූප
- ඔවුන් ගේ රංගනයන් ඇතුළත් ඡායාරූප හෝ වීඩියෝ පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** ජැක්සන් ඇන්තනි සහ කෞෂල්‍යා ප්‍රනාන්දු යන රංගන ශිල්පීන් දෙදෙනා හඳුන්වා දෙන්න. ඔවුන් වේදිකා, සිනමා, රූපවාහිනී නාටක යන මාධ්‍යවල රංගනයේ යෙදෙන අය බව ප්‍රකාශ කරන්න.

**පියවර 02** ඔවුන් දෙදෙනා රඟ පෑ නාට්‍ය කෘති නම් කරන්න. ඒවාට අදාළ ඡායාරූප වැනි දෑ මෙහි දී භාවිතයට ගත හැකි ය.

**පියවර 03** කෞෂල්‍යා ප්‍රනාන්දු නාට්‍ය අධ්‍යක්ෂණය කර ඇති බව ද පෙන්වා දී ඇය රඟ පෑ සිනමා සහ රූපවාහිනී නාට්‍ය ද නම් කරන්න. ජැක්සන් ඇන්තනි සිනමා සහ රූපවාහිනී නාට්‍ය අධ්‍යක්ෂවරයෙකු වන බවත් ඔහු ද සිනමා සහ ටෙලි නාට්‍යවල රංගනයේ යෙදී ඇති බවත් පෙන්වා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- ජැක්සන් ඇන්තනි සහ කෞෂල්‍යා ප්‍රනාන්දු යන දෙදෙනා ගැන විමසීම.
- ඔවුන් දෙදෙනාගේ නාට්‍ය කෘති නම් කිරීම
- ඔවුන් දෙදෙනා නිරත වූ වෙනත් මාධ්‍යයන් ගැන සඳහන් කිරීම
- ඔවුන් දෙදෙනාගේ තොරතුරු එක්රැස් කිරීම
- ඔවුන්ගේ නාට්‍යවල කොටස් නැරඹීමට පෙළඹීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

පැවරුම : ජැක්සන් ඇන්තනි ගේ සහ කෞෂල්‍යා ප්‍රනාන්දු ගේ රංගනය පිළිබඳ ව විස්තර පත්‍රිකාවක් සකසන්න.

අතිරේක උදව් : **ජැක්සන් ඇන්තනි**
- වේදිකා නාට්‍ය, සිනමා, රූපවාහිනී නාටක යන මාධ්‍ය ත්‍රිත්වයේ ම කැපී පෙනෙන රංගන ශිල්පියෙකි.
- සිනමා සහ රූපවාහිනී නාට්‍ය අධ්‍යක්ෂවරයකු වශයෙන් ද කටයුතු කරයි.

- මෙතැනින් මාරුවෙනු, තාරාවෝ ඉගිළෙති, මධුර ජවනිකා, අත්, මෝරා, ඔත්තුකාරයා, මරාසාද්, ධවල භීෂණ, ලෝම හංස, මහා සමයම නාට්‍යවලට රංගනයෙන් දායක වී ඇත.

**කෞෂල්‍යා ප්‍රනාන්දු**

- 1993 වර්ෂයේ දී නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසියේ ය.
- නාට්‍ය රංගනය සහ අධ්‍යක්ෂණය යන අංශවලින් කටයුතු කරයි.
- සිනමා සහ රූපවාහිනී යන මාධ්‍යවල ද රංගන දායකත්වය දක්වයි.
- කතාන්දර දෙකක්, එකමත් එක රටක, පවර නුවරක්, සඳකිඳුරු, විකෘති, පාර හරහා, ද හට්, පුන්තිලා, දිරිය මව, මරාසාද්, ධවල භීෂණ, මානස විල, යදම්, ඇන්ටිගනී, බර්නාඩාගේ සිපිරි ගෙය, දෝන කතරිනා, හිම කුමරිය, මරණය සහ කන්‍යාවිය, සඳ ළඟ මරණය යනාදී නාට්‍යවලට රංගනයෙන් දායක වී ඇත.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.4 :** සංස්කෘතික හා සාමාජික වටිනාකමක් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 4.3.8 - 4.3.9:** අතීතයෙන් නාට්‍යයට පිවිසෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- ඉතිහාසයේ ලියැවුණු විවිධ කතාන්දර කැමැත්තෙන් කියවයි.
- නාට්‍ය නිර්මාණ සඳහා විවිධ තේමා ගවේෂණය කරයි.
- ඓතිහාසික කතාවල ඇති චරිත නාට්‍ය නිර්මාණය සඳහා යොදා ගනියි.
- ඓතිහාසික චරිත / සිදුවීම් පාදක කර ගනිමින් නිර්මාණාත්මක හැකියාව වර්ධනය කර ගනියි.
- නාට්‍ය නිර්මාණ සඳහා ඓතිහාසික සිදුවීම් / චරිත නාට්‍ය සඳහා තේමා සොයා ගත හැකි බව අවබෝධ කර ගනියි.
- ඉතිහාස කතා ආදර්ශ කර ගනිමින් වර්තමාන සමාජය යහපත් කිරීම සඳහා නාට්‍ය නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- සිංහල රාජ වංශයට අයත් රජවරුන් සම්බන්ධ කතාන්දර ඇතුළත් ගවේෂණ පත්‍රිකා
- විවිධ ඓතිහාසික සිදුවීම් සම්බන්ධ කතාන්දර පොත්
- තෝරා ගන්නා ලද තේමාවන්ට අදාළ අඳින ලද චිත්‍ර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** යසලාලකතිස්ස රජු සහ සුභ නම් ද්වාරපාලකයා (දොරටුපාල) සමග කරන සංවාදයක් (සිසුන් ලවා පෙර සූදානම් කරගත් දෙබස්) ඉදිරිපත් කිරීමට සලස්වන්න.

**පියවර 02** සිසුන් දන්නා ඓතිහාසික කතා ඇතුළත් කතාන්දර පොත් ගෙන ඒමට දැනුම් දීම. දස මහ යෝධයින්ගේ කතා, වීර කතා, රජ කතා, දේව කතා, ආගම් කතා සහ අදාළ චිත්‍ර, සිසුන් කණ්ඩායම් කර ලබා දීමෙන් පසු විවිධ මාතෘකා ඔස්සේ වර්ග කිරීමට උපදෙස් ලබා දෙන්න.

**පියවර 03** පවරන ලද කාර්ය පත්‍රිකා අනුව කණ්ඩායම් සඳහා නිශ්චිත කාල සීමාවක් ලබා දී ඉදිරිපත් කිරීම. සිසුන් සමග ඉන් පෙර දී තෝරා ගන්නා ලද තේමාව ලිවීමට, ඓතිහාසික සිදුවීම් සම්බන්ධ ගොඩ නගන උචිත සංවාද ගොඩ නැගීමට, එමගින් සරල නාට්‍යමය අවස්ථාවක් ගොඩ නැගීමට උපදෙස් ලබා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ඓතිහාසික කතා හා සිද්ධීන් / චරිත හඳුනා ගැනීමේ හැකියාව ලැබීම
- එම සිදුවීම් ඇසුරින් නාට්‍යයට උචිත ලෙස සංවාද ගොඩ නැගීම
- වර්තමාන සමාජයට අවශ්‍ය ආදර්ශයන් ඉස්මතු කර ගැනීම
- සමාජයෙන් ගිලිහී යන යහපත් සංස්කෘතිකාංග අගය කිරීම
- අපූර්වත්වයෙන් යුත් නාට්‍යමය අවස්ථා නිරූපණය කිරීමේ පරිචය ලැබීම

යන කරුණු ඇගයීම සඳහා යොදා ගන්න.

**පැවරුම** : ඓතිහාසික කතා / ආගමික හා දේශපාලන වශයෙන් වෙන් කර කුඩා පොතක් නිර්මාණය කරවීම.

**නිපුණතාව 5.0** : නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.1** : නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරින් සාමූහික ව රස විඳියි.

**ක්‍රියාකාරකම 5.1.1** : කාලගෝල නාට්‍යයේ තේමාව හා වස්තුව හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- දික්තල - කාලගෝල නාඩගමට පාදක වූ කතා වස්තුව හා තේමාව හඳුනා ගත් බව පවසයි.
- මූල බීජය හා නාට්‍ය පෙළ අතර වෙනස වැටහෙන බව පවසයි.
- නාඩගම් සම්ප්‍රදායයේ ලක්ෂණ හඳුනාගත් බව කියයි.
- නාට්‍ය පෙළින් ඉස්මතු වන නාට්‍ය දෘෂ්ටිය හඳුනා ගත් බව පවසයි.

**ගුණාත්මක යෙදවුම්** :
- උම්මග්ග ජාතකයේ ''කාලගෝල ප්‍රශ්නය සඳහන් කොටසේ උපුටා ගත් පිටපතක්.
- දික්තල - කාලගෝල නාට්‍ය පෙළක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** උම්මග්ග ජාතකයේ සඳහන් වන කාලගෝල ප්‍රශ්නය සහ දික්තල - කාලගෝල නාට්‍ය පෙළ කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 02** උක්ත ලේඛන ආශ්‍රය කර ගනිමින් සාකච්ඡාවක් මෙහෙයවන්න. මෙහි දී කතාව හා නාට්‍යය අතර ඇති වෙනස්කම්, කතාවේ තේමාව හා නාට්‍යයේ දී එම දෘෂ්ටිය වෙනස් වන ආකාරය, කාලගෝල නාටකයේ ගොඩ නගා ඇති පෙළ, නාට්‍යයේ දී වඩාත් විධිමත් ආකාරයට සකස් වන ආකාරය ආදී කරුණු සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 03** සිසුන් කණ්ඩායම් හතරකට බෙදා පහත සඳහන් මාතෘකා අනුව ක්‍රියාකාරකමෙහි යොදවන්න. (මෙහි දී කණ්ඩායම සාකච්ඡා කොට සකස් කර ගත් වාර්තා එක් අයෙකු විසින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න)

1 කණ්ඩායම - කාලගෝල ප්‍රශ්නය නම් වූ කතා වස්තුව හා නාට්‍යයේ දී වෙනස් වන ආකාරය වාචික ව ඉදිරිපත් කරන්න.

2 කණ්ඩායම - නාට්‍ය පෙළෙහි තෝරා ගත් කොටසක් (මහෞෂධ කුමරු ප්‍රශ්නය විසඳීමේ කොටස) වාචික ව, රසවත් ව ඉදිරිපත් කරන්න.

3 කණ්ඩායම - කාලගෝල නාටකයේ දක්වෙන ප්‍රශ්නය විසඳීමේ අවස්ථාව වාචික ව ඉදිරිපත් කරන්න.

4 කණ්ඩායම - කතාවේ / නාට්‍යයේ ඉස්මතු වන තේමාව (මුඛ්‍ය කරුණු) නිදසුන් සහිත ව විස්තර කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කාලගෝල කතා වස්තුව වාචික ව ප්‍රකාශ කිරීම
- දික්තල-කාලගෝල නාට්‍ය පෙළ කියවීම
- නාට්‍ය පෙළ හා මූල බීජය අතර ඇති වෙනස්කම් ප්‍රකාශ කිරීම
- කතා වස්තුවේ තේමාව හඳුනා ගැනීම
- නාට්‍යයේ දී එම තේමාවට එක් වන නව දෘෂ්ටිය හඳුනා ගැනීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**අතිරේක උදව්** :
1. උම්මග්ග ජාතකය (කාලගෝල ප්‍රශ්නය)
2. කාලගෝල නාඩගම

**නිපුණතාව 5.0** : නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියෙකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.1** : නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරින් සාමූහික ව රස විඳියි.

**ක්‍රියාකාරකම 5.1.2** : ''කාලගෝල රස විඳිමු''.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- නාඩගම් සම්ප්‍රදාය හා නාට්‍ය ධර්මී ශෛලීන් හඳුනා ගනියි.
- නාට්‍යයක සතර අභිනය යොදා ගන්නා අයුරු විමසයි.
- පුද්ගල මනෝභාව පිරික්සයි.
- නාට්‍යයේ ගැටුම් අවස්ථා විමසයි.
- නාට්‍ය පෙළ මැනවින් හඳුනා ගත් බව කියයි.

**ගුණාත්මක යෙදවුම්** :
- දික්තල - කාලගෝල නාට්‍ය පෙළ
- නාට්‍යයේ දර්ශන අඩංගු සංයුක්ත තැටියක් හෝ ඡායාරූප කීපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** නිර්දිෂ්ට නාට්‍යයේ දර්ශන කොටසක් හෝ නාට්‍යයට අදාළ ඡායාරූප කීපයක් හෝ සිසුන්ට නැරඹීමට අවස්ථාව සලසා දෙන්න.

**පියවර 02** එම දර්ශන හා නාට්‍ය පෙළ ආශ්‍රයෙන් නිර්දිෂ්ට පෙළෙහි දක්නට ලැබෙන නාඩගම් සම්ප්‍රදායට අයත් ලක්ෂණ, නාට්‍ය ධර්මී ශෛලිය, සංවාද, චරිත, අවස්ථා හා සිද්ධීන්, ගැටුම් අවස්ථා, තේමාව. සතර අභිනය භාවිත වන ආකාරය, අංග රචනය හා වෙස් ගැන්වීම්වල ස්වාභාවිකත්වය ඉක්මවා යන පරිකල්පනාත්මක බව ආදී කරුණු කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පියවර 03** පහත සඳහන් අවස්ථාවලට අදාළ නිදසුන් ලිඛිත ව සපයන්න.

1. දික්තල කාලගෝල නාට්‍යයේ නාඩගම් සම්ප්‍රදාය දක්නට ලැබෙන අවස්ථා
2. නාට්‍ය ධර්මී ශෛලිය ඉස්මතු වන අවස්ථා
3. සතර අභිනය විශිෂ්ට ලෙස යොදා ගෙන ඇති අවස්ථා
4. නාට්‍යයේ ගැටුම් අවස්ථා
5. චරිත හා චරිත ස්වභාවය
6. රංග විධානවලින් ඉටුවන කාර්යභාරය
7. සංවාද හා ගායනවලින් හෙළි කරන චරිතවල මනෝභාව
8. ආනුෂංගික කලා භාවිත වන අවස්ථා
9. භාෂා භාවිතයේ සාර්ථකත්වය

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍ය පෙළ පිළිබඳ ව වටහා ගැනීම
- සතර අභිනය භාවිත කර ඇති අයුරු විමසීම
- නාට්‍ය පෙළක තිබිය යුතු ලක්ෂණ හඳුනා ගැනීම
- පුද්ගල මනෝභාවයන් මැනවින් වටහා ගැනීම
- නාට්‍යයේ ගැටුම් අවස්ථා හඳුනා ගැනීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පසු පැවරුම** : නිර්දිෂ්ට නාට්‍ය පෙළ පිළිබඳ රස විමසීමක් කරන්න.

**අතිරේක උදව්** : නිර්දිෂ්ට නාට්‍යයේ දර්ශන අඩංගු සංයුක්ත තැටි, නාට්‍යයට අදාළ ඡායාරූප

**නිපුණතාව 5.0** : නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියෙකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.2** : නාට්‍ය නිර්මාණය සමස්තයක් ලෙස අගය කරයි.

**ක්‍රියාකාරකම** : නාට්‍ය නරඹමු

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- නිර්දිෂ්ට නාට්‍යය නරඹයි.
- නාට්‍යයේ එන චරිත හඳුනා ගනියි.
- සංවාද අධ්‍යයනය කරයි.
- සතර අභිනය හඳුනා ගනියි.
- නාඩගම් සම්ප්‍රදායට අයත් රංගෝපක්‍රම හඳුනා ගනියි.
- නාට්‍යයේ තේමාව, දෘෂ්ටිය හඳුනා ගනියි.
- වේෂභූෂණ හා අනිකුත් ආනුෂංගික හඳුනා ගනියි.
- වේදිකා නාට්‍ය නැරඹීමට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්** :

- දික්තල - කාලගෝල නාට්‍ය පෙළ හා නාට්‍යයේ සංයුක්ත තැටියක් නැරඹීමට අවස්ථාව ලබා දීම.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** ප්‍රථමයෙන් ම වේදිකා නාට්‍යයක සුවිශේෂත්වය පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න. සංයුක්ත තැටියක් මගින් නාට්‍යයක් නැරඹීමේ දී සජීවී වේදිකා නාට්‍යයකින් ලබන අත්දැකීම් ග්‍රහණය කර ගැනීම කළ නොහැකි බවට මූලික අවබෝධයක් ලබා දෙන්න.

**පියවර 02** 5.1.2 ක්‍රියාකාරකමේ දී සාකච්ඡා කරන ලද පරිදි, නාට්‍යයේ තේමාව, දෘෂ්ටිය, ශෛලිය, සම්ප්‍රදාය, සංවාද, චරිත, අවස්ථා, සිද්ධි, ගැටුම් අවස්ථා, අභිනය, වේෂභූෂණ හා අනිකුත් ආනුෂංගික, පරිකල්පන අවස්ථා ආදිය කෙරෙහි අවධානය යොමු කරවමින් හා ඒවා හඳුනා ගැනීමට මග පෙන්වමින් නාට්‍යය නැරඹීම සඳහා සිසුන් මානසික ව සූදානම් කරවන්න.

**පියවර 03** සූදානම් කර ගත් ආකාරයට නාට්‍යය නැරඹීමට සලස්වන්න. (පියවර අංක 2 දී අවධාරණය කරන ලද කරුණු සාක්ෂාත් වී ඇත්දැයි දැන ගැනීම සඳහා උක්ත කරුණුවලට අදාළ ව ගුරු භවතා විසින් සකස් කර ගත් ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලියවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යයේ තේමාව හා දෘෂ්ටිය වටහා ගැනීම
- නාට්‍යයේ ශෛලිය හා සම්ප්‍රදාය හඳුනා ගැනීම
- නාට්‍යයේ චරිත, අවස්ථා හා සිද්ධි විමසීම
- ගැටුම් අවස්ථා හඳුනා ගැනීම
- සතර අභිනය භාවිත කොට ඇති අයුරු විමසීම

යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පසු පැවරුම** : නිර්දිෂ්ට නාට්‍යය ප්‍රසිද්ධ වේදිකාවේ රඟ දැක්වෙන අවස්ථාවක සජීවී වේදිකාවේ දී නාට්‍යය නැරඹීමට යොමු කරන්න.

**නිපුණතාව 5.0** : නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියෙකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.2.2** : නාට්‍ය නිර්මාණය සමස්තයක් ලෙස අගය කරයි.

**ක්‍රියාකාරකම** : කාලගෝල නාටකය අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- නාට්‍යයක් නරඹා එය අගය කරයි.
- අගය කිරීමට පාදක වූ හේතු ප්‍රකාශ කරයි.
- නාඩගම් සම්ප්‍රදායයට අයත් රංගෝපක්‍රම අගය කරමින් කතා කරයි.
- ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය අත්දැකීම් ලබා ගැනීමටත්, ප්‍රතික්ෂේප කළ යුතු දෑ වටහා ගැනීමටත්, ''දික්තල කාලගෝල'' නාට්‍යය ඇසුරෙන් අත්දැකීම් ලබයි.

**ගුණාත්මක යෙදවුම්** :
- දික්තල කාලගෝල නාටකය නැරඹීම
- දික්තල කාලගෝල නාටකය සංයුක්ත තැටියක් මගින් නැරඹීම

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** 5.2.1 ක්‍රියාකාරකමට අදාළ ව සිසුන් විසින් නරඹන ලද දික්තල කාලගෝල නාටකය පිළිබඳ ව සාකච්ඡා කිරීම. අදාළ අවස්ථාවල අදාළ ස්ථාන යළිත් නැරඹීමට සලස්වන්න.

**පියවර 02** නාට්‍යයක අන්තර්ගතය පදනම් කොට ගෙන තේමාව, දෘෂ්ටිය, ගැටුම, නාට්‍යෝචිත අවස්ථා, චරිත, සංවාද ආදී අංග පදනම් කොට ගෙන රංග ශෛලිය, රංගනය, ඇඳුම් පැලඳුම්, අංග රචනය, රංග භූමි අලංකරණය, සංගීතය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**පියවර 03** සාකච්ඡාව සඳහා පහත දැක්වෙන කරුණු අවධාරණය කිරීම වැදගත් ය.

උචිත රංගෝපක්‍රම භාවිතයෙන් නාට්‍යයේ අර්ථය තීව්‍ර වේ. පොතේ ගුරු පූර්ණ විරිදුව ගායනයෙන් තෙරුවන් නැමඳ ගායක පිරිස විසින් ගයන තෝඩායම තුණුරුවන්ගේ හා දෙවියන්ගේ ආශිර්වාදය ප්‍රාර්ථනය කිරීමෙන් අනතුරුව නාට්‍යයේ කතා වස්තුව හෙළිදරව් කරයි.

නාඩගම් සම්ප්‍රදායයට අනුව පූර්ව රංගනයේ දී බහුබූත කෝලම හඳුන්වා දීමත් හා බහුබූතයා පැමිණි ගමන් විලාසයත් සමග ගයන ගීතය වඩා සිත් ගනී. එමගින් ප්‍රේක්ෂක සිත් නාට්‍යය කෙරෙහි නැඹුරු වීම සිදුවේ.

පොතේ ගුරු විසින් නාට්‍යයේ චරිත හා අවස්ථා ප්‍රේක්ෂකයා හමුවට පැමිණවීම සිදු කරයි.

වචනය, සිංදුව හා නාට්‍ය ධර්මී සංවාද මගින් නාට්‍යය විකාශනය කිරීමත් සිදු ව ඇත.

මංගලම් සිංදුව නාටකය අවසානය සනිටුහන් කරයි. එය නාඩගම් සම්ප්‍රදායයි.

**පියවර 03** පන්තියේ සිසුන් කණ්ඩායම් කරන්න. ඒ ඒ කණ්ඩායමට පැවරුම් ලබා දෙමින් සංවාදයක් ගොඩ නැගීමට උපදෙස් දෙන්න.

1 කණ්ඩායමට - නාඩගම් සම්ප්‍රදාය කාලගෝල නාටකයෙන් පිළිබිඹු වන අවස්ථා නිදසුන් සහිත ව ඉදිරිපත් කරන්න.

2 කණ්ඩායමට - කාලගෝලයා, දික්පිටියාගේ චරිත ලක්ෂණ විග්‍රහ කරන්න.

3 කණ්ඩායමට - දික්තලාගේ චරිත ස්වභාවය හෙළිදරව් කරන්න.

4 කණ්ඩායමට - මහෞෂධ පණ්ඩිතයන් විසින් ගැටළුව විසඳීමට යොදා ගත් උපක්‍රමය කෙතරම් ප්‍රඥාගෝචරදැයි සාකච්ඡා කරන්න.

5 කණ්ඩායමට - ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය අත්දැකීම් හා ප්‍රතික්ෂේප කළ යුතු අවස්ථා නාට්‍යය ඇසුරෙන් පැහැදිලි කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- චරිත ලක්ෂණ හඳුනා ගැනීම
- නාටකීය අවස්ථා පැහැදිලි කිරීම
- නාටකීය ආකෘතිය විස්තර කිරීම
- නාටකීය අන්තර්ගතය සාකච්ඡා කිරීම
- නාඩගම් ලක්ෂණ ඉදිරිපත් කිරීම

යනාදී කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පසු පැවරුම** : රඟ දැක්වීමට හා සිංදු ගායනයට අවස්ථාව ලබා දෙන්න.

**අතිරේක උදව්** :

- නාඩගම් සම්ප්‍රදාය පිළිබඳ ලියැවුණු ග්‍රන්ථ
- නාඩගම් ගීත ගායනය, වාදනය හා රංගනය

**නිපුණතාව 5.0** : නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියෙකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.2.2**: නාට්‍ය නිර්මාණය සමස්තයක් වශයෙන් ඇගයීමකට ලක් කිරීම.

**ක්‍රියාකාරකම** : නාට්‍යයක් රස විඳීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගැනුම් පල** :
- නාට්‍යයක ප්‍රධාන අංග හඳුනා ගත් බව පවසයි.
- නාට්‍ය ආකෘති පිළිබඳ අවබෝධය ලැබූ බව පවසයි.
- නාට්‍ය නිර්මාණයක් සමස්ත වශයෙන් අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නාට්‍යයක සංයුක්ත තැටියක්
- නාට්‍ය පෙළ කීපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** නරිබෑණා, තලමල පිපිලා හෝ වෙනත් නාට්‍යයක් නැරඹීමට අවස්ථාව ලබා දෙන්න. සංයුක්ත තැටියක් මගින් හෝ නාට්‍යය නැරඹීම සඳහා සිසුන් යොමු කරන්න.

**පියවර 02** නරඹන ලද නාට්‍යය ආශ්‍රයෙන්, නාට්‍යයේ කතා වස්තුව, ශෛලිය, සංවාද, චරිත, අවස්ථා හා සිද්ධීන්. ගැටුම් අවස්ථා, තේමාව, සතර අභිනය භාවිත කොට ඇති ආකාරය, නිර්මාණාත්මක බව, ආනුෂංගික කලා භාවිතය ආදී කරුණු කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පියවර 03** උක්ත සාකච්ඡාව ආශ්‍රයෙන් නරඹන ලද නාට්‍යය පිළිබඳ ව විචාරාත්මක නිබන්ධනයක් ලියන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යයේ කතා වස්තුව හඳුනා ගැනීම
- නාට්‍ය පෙළක ලක්ෂණ වටහා ගැනීම
- නාට්‍යයේ චරිත හඳුනා ගැනීම
- ආනුෂංගික කලා විමසීම
- නාට්‍යයේ තේමාව හඳුනා ගැනීම

ආදී කරුණු ඇගැයීමට ලක් කරන්න.

**පැවරුම** : නාට්‍ය පෙළකට අදාළ ව වේෂභූෂණ හා අනෙකුත් ආනුෂංගික කලාවන් සැලසුම් කරන්න.

**අතිරේක උදව්** :
- නාට්‍ය පෙළ කීපයක්
- නාට්‍ය දර්ශනයක සංයුක්ත තැටියක්

## විවිධ සහාය

**වයි. එම්. එම් කේ. යාපා මහත්මිය**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන කාර්යාලය - මහනුවර

**ජගත් පද්මසිරි මයා**
කථිකාචාර්ය
සෞන්දර්ය විශ්ව විද්‍යාලය

**චාමික හත්ලහවත්ත මයා**
ගුරු උපදේශක
පිළියන්දල කලාපය

**රසික ප්‍රසංග බණ්ඩාර මයා**
ගුරු සේවය
ස්වර්ණ ජයන්ති විද්‍යාලය, කෑගල්ල

**ජනකා භද්‍රාංගනී මිය**
ගුරු සේවය
නිවන්තකචේතිය විද්‍යාලය,
අනුරාධපුර

**කුමාරි එදිරිසිංහ මිය**
ගුරු සේවය
ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, කුරුණෑගල

**රත්නා ලාලනී ජයකොඩි මිය**
ගුරු සේවය
රාජකීය විද්‍යාලය,
කොළඹ

පරිගණක මෙහෙයුම් : **ඩබ්ලිව්. එම්. ධම්මිකා මිය**
මුද්‍රණාලය, ජාතික අධ්‍යාපන ආයතනය

සහාය : **ඊ. එම්. වික්‍රමනායක මිය**
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**කේ. පී. පෙරේරා මයා**
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය